# දින මන සනසන

# පොහොය පුරාණය

**2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළගැසෙමු.**

## කතු හිමියන්ගේ වෙනත් කෘති

- උසස් පෙළ බෞද්ධ සංස්කෘතිය
- උසස් පෙළ සංශෝධිත බෞද්ධ සංස්කෘතිය - 1985
- වාගීශෝදය ශාස්ත්‍රීය සංග්‍රහය සංස්කරණය
- සදහම් මඟ
- බුදුසමය, පන්සල හා ජන ජීවිතය
- නව විෂය නිර්දේශානුකූල බෞද්ධ ශිෂ්ටාචාරය
- ලේඛන සංග්‍රහය
- සමාජ සාර ධර්ම
- ළමා ලෝකය හා ඔබ
- බුදුසමය හා සෞන්දර්යය
- විචාර චින්තා ශාස්ත්‍රීය සංග්‍රහය
- දික්වෙල පියනන්ද චරිතාපදානය
- සුදම් සිතැඟි හා ගුරු හරුකම් (තීරු ලිපි)
- අරියවංස චරිතාපදානය
- සම්බුදු මහිමය

# දින මන සනසන
# පොහොය පුරාණය

පූජ්‍ය අරම ධම්මතිලක නාහිමි

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT.) LTD.

දන මන සනසන පොහොය පුරාණය
© පූජ්‍ය අරම ධම්මතිලක නාහිමි, 2011
ප්‍රථම මුද්‍රණය: 2011
ISBN 978-955-661-194-6

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ධම්මතිලක හිමි, අරම
දන මන සනසන පොහොය පුරාණය / අරම ධම්මතිලක නාහිමි .-
කොළඹ : සී/ස සදීපා ප්‍රකාශකයෝ, 2011 .-
පි. 80 ; සෙ.මී. 21
ISBN 978-955-661-194-6
i. 294.3 ඩිවි 21 ii. ග්‍රන්ථ නාමය
1. බුද්ධාගම

**DANA MANA SANASANA POHOYA PURĀṆAYA**

This book contains the importance of Full Moon Poya Days according to the Buddhist History.

*By*

Ven. Arama Dhammathilaka Nayaka Thera

*Published by*
**SADEEPA PUBLISHERS (PVT.) LTD.**
1060, Maradana Road,
Colombo 08, Sri Lanka.
Tel: 094-11-2686114, 2694289, 2678043
Fax: 094-11-2678044, 2683813
e-mail: sadeepabk@sltnet.lk

**Printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
**11th Floor, 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.**
**Tel: 886-2-23951198 , Fax: 886-2-23913415**
**Email: overseas@budaedu.org**
**Website: http://www.budaedu.org**
This book is strictly for free distribution, it is not to be sold.
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# සංඥාපනය

දොළොස් මහේ පොහොය සම්බන්ධයෙන් සිහිපත් වන විට අප කෙරෙහි ජනිත වන්නේ පහන් සංවේගයකි. වසරක් පරිපූර්ණ වීමට මාස දොළොසක් අයත් වේ. ඒ ඒ මාසයේ බෞද්ධාගමික වශයෙන් වැදගත් සිදුවීම් රාශියක් ගැබ් වී ඇත. බෞද්ධ සාහිත්‍යයේ අන්තර්ගත විවිධ සිද්ධි මේ දොළොස් පොහොයට එක් වීම සුවිශේෂිත සිද්ධියකි.

පොහොය සම්බන්ධයෙන් ලියැවුණු ග්‍රන්ථ අල්ප ය. ඒ හේතුව නිසා ම පොහොයේ වැදගත්කම, ඒ ඒ පොහොය සුවිශේෂිත වන්නේ කිනම් කරුණු මත ද යන්න දැනගැනීම අපට දුෂ්කර කරුණක් වී ඇත. ඒ දුෂ්කරතාව සමනය කිරීමට ශාස්ත්‍රපති පණ්ඩිත අරම ධම්මතිලක නා හිමියන් විසින් රචිත 'දන මන සනසන පොහොය පුරාණය' නමැති ග්‍රන්ථය මගින් හැකියාව ලැබේ.

විවිධ විෂයයන් යටතේ ග්‍රන්ථ සමුදායයක් ලියා ඇති කතු හිමියන්, ස්වකීය පරිචය සහ ප්‍රාගුණ්‍යය මත පිහිටා මේ කෘතිය මගින් දොළොස් මහේ පොහොය පිළිබඳව හොඳ විනිශ්චයක් කර ඇත.

අපේ ජීවිතය සම්බන්ධ අර්ථ විග්‍රහයේදී දොළොස් පොහොය අතිශයින් ම, අනවරතයෙන් ම ඉවහල් වේ. බුදුසමය මගින් සිදු කෙරෙන්නේ ජීවිතය අවබෝධ කරදීම ය. එසේ අවබෝධ කරගන්නට නම් ප්‍රඥාව අතිශයින් ම අවශ්‍ය වේ. ප්‍රඥාව නොමැතිව එම දහම සාක්ෂාත් කරගැනීමට නුපුළුවන. ලුණු-ඇඹුල් සහිත හොද්දේ රසය හැන්දට නොදැනෙන්නා සේ ප්‍රඥාව නොමැති පුද්ගලයාට බුදුසමයේ හරය උකහාගැනීමට නුපුළුවන.

විවිධ සංසිද්ධි මත දොළොස් මහේ පොහොය අපගේ ජීවිතයට අතිශයින් ම බද්ධ වේ. ගසට පොත්ත මෙන්, ජීවිතයට දොළොස් මහේ පොහොයන් සම්මිශ්‍රිත වේ.

අපේ ගමන් මග කෙටි කරගත යුතු ය. දොළොස් පොහොයෙන් හුවාදක්වන්නේත් මෙය යි. දොළොස් පොහොයක් ගෙවී යෑම වූකලී ජීවිතය ද කෙටි කරගැනීම වශයෙන් අර්ථ දැක්වුව හොත්, එය එතරම් ම නිවැරැදි ය. දොළොස් පොහොයෙන් සිදු කරන්නේ අප කෙරෙහි ප්‍රඥාව වර්ධනය කොට ජීවිතාවබෝධය ලබාදීම යි. ජීවිතය තත්ත්වාකාරයෙන් වටහාගෙන ජීවන දිගු ගමන කෙටි කරගැනීමට ප්‍රබල වාහකයක් කරගත හැකි ය.

රජ දවස දොළොස් පොහොයේදී විවිධ පුද පූජා පෙරහර සිදු කළ බව ඉතිහාසයෙන් අනාවරණය වේ. එම පෙර පැවැති සිරිත අඛණ්ඩව ම අදත් සිදු කැරේ. සාම්ප්‍රදායික වත්පිළිවෙත් පාදක කොටගෙන දොළොස් පොහොය බෞද්ධයන් වශයෙන් අප ඉහළින් පූජාවට බඳුන් කරන්නේ ජීවිතයට ඒ මාර්ගයෙන් ගත හැකි පාඩම් අපමණ නිසා ය.

දොළොස් පොහොය අතරින් වෙසක් පොහොය බෞද්ධයන්ට ඉතා ම සුවිශේෂිත ය. ඒ තුන්ලෝකාග්‍ර සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ උපත - බුදුවීම - පිරිනිවන්පෑම යන උත්තුංග කාරණා ත්‍රිකය සිදු වූ හෙයිනි. බෞද්ධයන් වන අප සෙසු පොහොයන්ට වඩා වෙසක් පොහොය මහ ඉහළින් සමරන්නේ ඒ හේතුව නිසා ය. ආමිස පූජා මෙන් ම ප්‍රතිපත්ති පූජාවට ගෝචර වූ වෙසක් පොහොය, ඒ මාසය පුරා ම පූජාවට ලක් කිරීමට අපි පුරුදු වී සිටිමු. සෙසු පොහොයයන් දිනකට දෙකකට පමණක් සීමා වුව ද වෙසක් පොහොය මාසයක් පුරා ම සිහිපත් කරන්නේ බුදු රජාණන් වහන්සේ අපට විමුක්ති මාර්ගයක් හෙළි කළ පොහොයඑය වන හෙයිනි.

පොහෝදාට පන්සල් යෑම ද බෞද්ධයන්ගේ සිරිත යි. සිල් සමාදන් වී බණ භාවනා කිරීමට ද පොහෝ දා උපයෝගි කොට ගනී. පන්සලට පිවිසෙන්නේ කිසිදු වර්ගීකරණයකින් තොරව ය. සමාජවාදයේ කේන්ද්‍රීය තැන්න වශයෙන් බුදුරදුන් පන්සල හැඳින්වූයේ ඒ හේතුව නිසා ය.

බෝ රුක - දා ගැබ - බුදු රුව - සුවඳ දුම් ආදියෙන් උපයුක්ත වූ නිසා ම අප සිතෙහි පහන් සංවේග ජනිත වේ. අමූලිකා ශ්‍රද්ධාව මෙන් ම ආකාරවතී ශ්‍රද්ධාව ජනිත වීමට ඉවහල් වන පන්සල අපේ දිවි මඟ කෙටි කරගැනීමට ප්‍රස්තුත වන කඩඉමක් වශයෙන් ද හැඳින්විය හැකි ය.

විවිධ අන්ත කරා අපට යා හැකි ය. එහෙත් යා යුතු අන්තය කුමක් දැ යි අප ප්‍රඥාවෙන් විමසා බැලිය යුතු ය. යමක දැඩිව එල්බ නොගෙන මැදහත් සිතින් යුතුව සංවේදී මනසින් දිවි මඟෙහි ගමන් කළ යුතු ය. සත්‍ය වටහාගැනීමට හැකි වන්නේ එවිට ය.

දොළොස් මහක් ආරම්භ කොට අරඹන අපගේ ජීවන ගමන දොළොස් මහේ සමාප්තිය වන විට යථාර්ථය හඳුනාගැනීමේ මගට අප අනිවාර්යයෙන් ම පිවිසවිය යුතු ය. එසේ නොවුණ හොත් දොළොස් මහෙන් නිසි ඵල නෙළාගැනීමක් සිදු නො වේ. මෙය සෙස්සන්ට නිගමනය කළ නොහැකි ය. එය තමන් විසින් ම නිගමනයට එළඹිය යුතු ය.

**ආචාර්ය රංජිත් ඇල්. අබේවික්‍රම**

(බී.ඒ., එම්.ඒ., පී.එච්.ඩී.)

# කෘතඥතාව

මා විසින් අඛණ්ඩව ම දොළොස් මසක් පුරා 'දිවයින' හා 'සිළුමිණ' පුවත්පත් දෙකට ලියූ ලිපි දොළොසක් මේ ග්‍රන්ථයට ඇතුළත් කොට ඇත. එම ලිපි පළ කිරීමට මුළු හදින් ම අතහිත දුන් 'දිවයින' උපදේශක කර්තෘ මෙරිල් පෙරේරා හා 'සිළුමිණ' ප්‍රධාන කර්තෘ කරුණාදාස සූරියආරච්චි මහත්වරුන්ට මම අතිශයින් ම කෘතඥ වෙමි.

එමෙන් ම මේ ග්‍රන්ථයට සංඥාපනයක් ලියූ ආචාර්ය රංජිත් ඇල්. අබේවික්‍රම මහතාට ද මේ ලිපි සමුච්චය ග්‍රන්ථයක් බවට පත් කිරීමට කටයුතු කළ 'බුදුසරණ' හිටපු ප්‍රධාන කර්තෘ රුවන් ඩී. අරත්තනගේ මහතාට ද, සදීපා ප්‍රකාශන ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ සරත් චන්ද්‍ර වන්නිඅච්චි මහතාට ද, එම කාර්ය මණ්ඩලයට ද මගේ කෘතඥතාව පිරිනැමේ.


අලුත්ගම ඓතිහාසික කන්දේවිහාර වාසී හා
ගොතටුව පාරමිතා ශ්‍රී මහා බෝධිමළු විහාරාධිපති,
**ශාස්ත්‍රපති, පණ්ඩිත, අරම ධම්මතිලක නාහිමි**

අයි.ඩී.එච්. පාර, ගොතටුව.
දුරකථන : 2534005 / 2685054

# පටුන


1. සමාජ පෙරළියකට තුඩුදුන්
   **දුරුතු පුන් පොහොය** 11
2. ප්‍රඥාවට දොරටුව විවර කළ
   **නවම් පුන් පොහොය** 14
3. පරම සත්‍ය දහම ලෝකයාට පහදා දීමට මුල පිරූ
   **මැදින් පුන් පොහොය** 17
4. සමාජ සමගියට මුල් වූ
   **බක් පුන් පොහොය** 21
5. මැදුම් පිළිවෙතට මං පෑදූ
   **වෙසක් පුන් පොහොය** 24
6. සමාජ පුනරුදයකට මං පෙත් හෙළි කළ
   **පොසොන් පුන් පොහොය** 28
7. අවිද්‍යාවෙන් අන්ධ වූ ලෝකයට අමාදහම් බෙරය වැයූ
   **ඇසළ පුන් පොහොය** 34
8. ජීවිතයෙන් තික්ම යෑමේ යථාර්ථය හෙළි කරන
   **නිකිණි පුන් පොහොය** 40
9. තෘෂ්ණාව තුනී කරන්නට ඉවහල් වන
   **බිනර පුන් පොහොය** 46
10. ජීවිතය විවරණය කරන හොඳ හා නරක වටහාදෙන
    **වප් පුන් පොහොය** 52
11. බුදුරදුන්ගේ නිහතමානී ගුණය විදහාපාන
    **ඉල් පුන් පොහොය** 59
12. ධර්මකාමී දිවි පෙවෙතකට මං හෙළිකරන
    **උඳුවප් පුන් පොහොය** 65

උපග්‍රන්ථය
   **සම්බුදු තෙමඟුල පෑ නැණසල** 71

# දන මන සනසන පොහොය පුරාණය



## පූජ්‍ය අරම ධම්මතිලක නාහිමි

කීර්ති ශ්‍රී විනයාචාර්ය වාගීශ්වර ලේඛනසූරි, ශාස්ත්‍රපති, පණ්ඩිත අරම ධම්මතිලක නාහිමියන් ග්‍රන්ථකරණයට වඩා ප්‍රකට වන්නේ, පුවත්පත් ලේඛකයකු වශයෙනි. පන්සාළිස් වසරක් පුරා විවිධ විෂයයන් යටතේ ධර්ම ශාස්ත්‍රීය ලේඛනයේ යෙදී ඒවා වියතුන්ගේ, උගතුන්ගේ විචාරයට බඳුන් වී වාද විවාදවලට පවා තුඩු දීමෙන් සමාජ ප්‍රබෝධයක් ඇති විය.

තොරතුරු හා ජනමාධ්‍ය උපදේශක සභාවේ ද, ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ද, සාමාජිකත්වය දරන නාහිමියෝ පුද්ගලාශ්‍රිත හා සමාජාශ්‍රිත විඥානය විශද කිරීමට උත්සුක වන, වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම පඬිවරයෙකි.

මහාචාර්ය ඒ. ඩී. පී. කලන්සූරිය

## සමාජ පෙරැළියකට තුඩු දුන්

# දුරුතු පුන් පොහොය

දොළොස් පොහොයේ සමාරම්භක පොහොය වන්නේ දුරුතු පොහොය යි. මේ පොහොය ඉතා ම වැදගත් වන්නේ සියලු පොහොයන්ට වස්තු විෂය වන පරිසරය සැකැසීම අනුව ය.

වසරක් ගෙවී තවත් වසරක් උදා වන මේ මොහොතේ පසුගිය වසරේ ලත් අත්දැකීම් සම්බන්ධව අවලෝකනය කොට, නව වසරට ඒ අත්දැකීම් කොතරම් දුරට බලපාන්නේ ද යන්න සම්බන්ධව ද මෙනෙහි කළ යුතු හොඳ ම කඩඉමකි.

එමෙන්ම දුරුතු පොහොය වඩාත් වැදගත් වන්නේ, අප සම්මා සම්බුදු තිලෝගුරු බුදු පියාණන් වහන්සේ උකහාගත් මහා ප්‍රඥාව නැත් නම්, දුකේ වෙළී-පැටලී සිටින සියලු සත්ත්වයා එම විමුක්ති මාර්ගයෙන් ගලවාගැනීමට ප්‍රථම පියවර තබන ලද්දේ ද දුරුතු පෝ දා බැවිනි.

බුදු බව ලබා නව මසකින් පසු උරුවෙල් දනව් පියසෙහි තුන්බෑ ජටිලයන් වන, උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප ප්‍රධාන කොටගත් දහසක් පමණ සච්වන් සදහම් මාර්ගයට යොමු කරන ලද්දේ දුරුතු පොහෝ දා ය.

බුදුරදුන්ගේ ප්‍රථම ශ්‍රී ලංකා ගමන නැත් නම් ලක්දිවට වැඩමවීම සිදු වූයේ ද මේ පුන් පොහෝ දා ය. මහියංගණයට වැඩමකොට යක්ෂ ගෝත්‍රිකයන්ට දහම් දෙසා විමුක්ති මාර්ගය හෙළි කිරීම ද මේ පොහෝ දා සිදු වූ තවත් වැදගත් සිදු වීමකි.

බුදුරදුන්ගේ කේශධාතු තැන්පත් කොට ඇත්තේ මහියංගණයේ ය. සුමන සමන් දෙවියන් විසින් මහියංගණ දාගැබ ඉදිකොට, එහි බුදුරදුන්ගේ කේශ ධාතු නිදන් කිරීම මත දෙවියකු විසින් ඉදි කරන ලද ප්‍රථම දාගැබ වන්නේත් මහියංගණ දාගැබ යි.

මහීන් + අංගණ 'මහියංගණය' විය. 'මිනිසාට ශාන්තිය උදාකරන තැන්න' නැත් නම් 'ආලිංගණය' වූ නිසා මහියංගණ නම් විය. දුරුතු පොහෝ දා අපට ලැබුණු අති උත්තම දායාදයකි ඒ. අප රටට වැඩම කළ බුදුරදුන් නිසා අපේ සමාජයේ පෙර නොවූ විරූ පෙරළියක් උදාවිය.

මානව සමාජය විවිධ ආකල්පවල එල්බගෙන සිටි හෙයින් 'නිසි මාර්ගය' නැත් නම් 'විමුක්ති මාර්ගය' කුමක්ද යන්න සොයාගැනීමට නොහැකිව මංමුළා වූ පිරිසක් බවට පත්ව සිටියහ.

මිනිසා ගස්වලට වන්දනය කෙළේ ය. තවත් පිරිසක් ගල්වලට වැඳුම් පිදුම් කළහ. ඇතැමෙක් හිරුට වන්දනය කළහ. තවත් සමහරෙක් සඳුට වැඳුම් පිදුම් කළහ. එයින් නොනැවතුණු සමහරු අනංගයාට වැඳුම් පිදුම් කළහ. අනංගයා යනු ආදරයට අධිපතියා ය. ආදරයට අධිපති අනංගයාට වැඳුම් පිදුම් කළ හොත් තමන්ට විමුක්ති මාර්ගය ලැබේ යයි සිතුහ.

ඇතැම්හු නාගයා සංකේතයක් කොට ගෙන වන්දනය කළහ. නාගයා වූකලි රාගයේ සංකේතයකි. 'නාගරාග' ලෙස ද එය හැඳින්වේ. රාගයෙන් කෙරෙන්නේ තමන්ගේ ඇලීම්-ගැලීම් තවත් පෝෂණය කිරීමකි. ඇලීම ප්‍රහීණ කළ යුතුව තිබියදී තවදුරටත් එහි එල්බ ගන්නේ නම්. සිදු වන්නේ සසර දිගුවීම පමණි. අපට අවශ්‍ය වන්නේ සංසාරය කෙටි කරගැනීම ය. නාගයාට වන්දනය කිරීමෙන් හැඟීයන්නේ එය කෙටි කරගැනීම නොව තව තවත් එයට එල්බ ගැනීමකි. නාග වන්දනය එදා කොතරම් ජනප්‍රිය වී ද යත් රජවරුන්ගේ නමේ අගට 'නාග' යන පදය යොදන්නට පුරුදු වූහ.

චෞරනාග, මහානාග, වීරනාග, ඉලනාග ආදී නම් එයට හොඳම නිදසුන් ය.

මෙවන් පරිසරයක සිටි ජනකායකට බුදුරදුන් ලක් දිවට වැඩම කොට, එම අඳුරු වලා පටලයෙන් නැත් නම් භව කඩතුරාවෙන් වැසුණු ජනකාය යහමගට ගන්නට දැරූ තැත ද ඉතා ප්‍රශංසනීය ය.

ඉන් අනතුරුව උගත් සඟ පරපුරක් බිහි වී මහා කැලෑ එළි පෙහෙළි වී, ගල්ලෙන්වලට වී සඟරුවන දහම් පොත් ලියන්නට පෙලඹුණේ ද මේ දුරුතු පුන් පෝ දා ය. එයට පසුබිම සැකැසුණේ ද මෙදා ය.

යතිවරුන් බුදුරදුන්ගේ පවත්නා අනන්ත වූ ගුණ සමුදායයෙන් අංශුවක් නැත් නම් කණිකාවක් හෙළි කිරීමට අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, පූජාවලිය, දහම් සරණ, සඟ සරණ බඳු ග්‍රන්ථවලින් හෙළි කෙළේ බුදුගුණ යි. ඒ බුදුගුණ ජනකායට අසන්නට සැලසීම මහා පුණ්‍ය කර්මයකි.

බෞද්ධ ග්‍රන්ථ නිර්මාණවලින් නොනැවතුණු එදා සමාජය ගලට ද ජීවයක් කැවීමට උත්සුක වූහ. හැඩිදැඩි ගලට ජීවයක් කැවීමට යාමේ සාධක ලෙස බුදු පිළිම, සඳකඩ පහණ, මුරගල, කොරවක්ගල ආදී කැටයම් හැඳින්විය හැකි ය.

බුද්ධිමත් කැටයම් ශිල්පියා මේ මගින් කෙළේත් බුදු මහිමය කියාපෑම ය. අදත් එම කැටයම්වලින් ජීවමාන වන්නේ බුදුගුණ යි. බුද්ධ චරිතය යි; බුද්ධ ධර්මය යි. මේ දක්වා පැමිණි ගමන් මගට ප්‍රවේශයක් වූයේ දුරුතු පොහොය යි.

දුර ගමනක් යන්නට ඇති හෙයින් ද, දුර බලන්නට හැකි සන්ධිස්ථානයක් ලෙස ද දුරුත්ත හැඳින්විය හැකි ය.

---

## වැදගත් සිදුවීම්

1) තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ උකහාගත් මහා ප්‍රඥාව සියලු සත්ත්වයාට දේශනා කිරීමට මුල් පියවර තැබීම.
2) තුන් බෑ ජටිලයන් වූ උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප ප්‍රධාන කොටගත් දහසක් පමණ සච්චන් සදහම් මාර්ගයට යොමු කිරීම.
3) බුදුරදුන්ගේ ප්‍රථම ලංකාගමනය.
4) බුදුරදුන්ගේ කේශ ධාතු මහියංගණ දාගැබේ තැන්පත් කිරීම.

# ප්‍රඥාවට දොරටු විවර කළ

# නවම් පුන් පොහොය

අවුරුද්දේ දෙවැනි පොහොය ලෙස හැඳින්වෙන්නේ නවම් පොහොය යි. දුරුතු පොහොය ශාසනයට වැදගත් වන්නේ යම් සේ ද නවම් පොහොයත් එසේ ම ය. මිනිසාගේ සිත්සතන්හි මෝක්ෂ මාර්ගයට දොර විවර කරන්නට පාදම දමා ඇත්තේ ද නවම් පොහොය දා ය.

මේ නවම් පොහොය සිද්ධි සමුදායකින් උපලක්ෂිත වී ඇත. ඒ සිද්ධි අතර ප්‍රමුඛ වන්නේ සැරියුත් - මුගලන් මහ රහතන් වහන්සේ සම්බුද්ධ ශාසනයේ අගසව් තනතුරු ලැබීමේ සිද්ධිය යි. එමෙන් ම ප්‍රථම ධර්ම සංගායනාව සිදු වූයේ ද නවම් පොහෝ දා ය. තව ද මහා සංඝරත්නයට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කෙළේත් නවම් පෝ දාක ය. බුදුරදුන් පිරිනිවන් පෑමට තුන්මසකට ප්‍රථමයෙන් ආයු සංස්කාරය අත් හළේත් නවම් පුන් පොහෝ දිනක ය.

තරු පිරිවරා ගත් සඳ මඬල මෙන් බුදුරදුන් උරුවේල කස්සප, නදී කස්සප හා ගයා කස්සප යන තුන් බෑ ජටිල භික්ෂූන් ප්‍රධාන දහසක් භික්ෂු පිරිස ද, එක්දහස් දෙසිය පනසක් රහතන් වහන්සේද වේළුවනය එදා බබළවන්නට වූහ. මහා සඟරුවන පිරිවරා ගත් බුදුරදුන් සාරිපුත්ත හා මොග්ගල්ලාන යන මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ දෙනම දකුණත් සහ වමත් සව්වන් වශයෙන් සංඝ සමාජයට හඳුන්වා දුන්නේ මේ උතුම් නවම් පුන් පොහෝ දා ය. මෙම අග්‍ර ශ්‍රාවක තනතුරුවලට පත් වීම මහත් අසිරියක් නොවන්නේ ද?

මෙසේ මේ දෙනම පත් කිරීම පිළිබඳව මහා සංඝරත්නය අතර වැරැදි ආකල්ප ඇති විය. එමෙන් ම එය මතභේදයට තුඩුදුන් කරුණක් බවට ද පත් විය. සංඝ සමාජයේ ජ්‍යෙෂ්ඨයන් සිටියදී කලක් පැවිදි වූ අය සිටියදී ළඟකදී සසුනට ප්‍රවේශ වූ සැරියුත් -

මුගලන් දෙනම අගසව් තනතුරට පත් කෙළේ කවර කාරණා නිසා ද යන්න කාගේත් කුතුහලයට පාත්‍ර විය. එමෙන්ම ඔවුහු බුදුරදුන්ට දෝෂාරෝපණය ද කළහ.

මේ අවස්ථාවේදී බුදුරදුහු සියලු සංඝයා ඒකරාශිකොට ඒකකේන්ද්‍රිය තැන්නකට යොමුකොට කා අතරත් ඇති වූ මේ දුර්මත දුරු කළහ. ''මහණෙනි, පංච වර්ගික භික්ෂූහු, යස භික්ෂුව, භද්‍රවර්ගික භික්ෂූහු, තුන් බෑ ජටිල භික්ෂූ යන මේ හැම දෙනා ම අනෙකක් පතා ම පින් කළහ.'' මේ යථාර්ථය බුදුරදුන් පහදා දී සංඝ සමාජයේ පැනනැගුණු කුහුල හා කුකුස බුදුන් වහන්සේ බැහැර කළහ.

'ඕවාද ප්‍රාතිමෝක්ෂය' දේශනා කෙළේ ද නවම් පුන් පොහෝදාක ය. එය බුදු රදුන්ගේ ශාසනයෙහි ප්‍රථම බෝධියෙහි (විසි වසක්) පිරිසුදුව නොකැළැල්ව පැවැතුණි. එබැවින් මහ සඟරුවන සම්බන්ධයෙන් විනය පැනවීමට කිසිදු අවශ්‍යතාවක් නො වී ය. ඉන් අනතුරුව කාලයාගේ ඇවෑමෙන් සංඝ සමාජයේ වැරැදි සිදු වන්නට විය. ඒ හේතුව නිසයි, ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කරන්නට සිදු වූයේ,

දඹදිව මධ්‍ය මණ්ඩලයෙහි විසිරීපැතිරී සිටි මහා සංඝරත්නය මසකට හෝ තෙමසකට හෝ එසේත් නැත් නම් හයමසකට වරක් ඒකරාශිකොට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම බුදුරදුන්ගේ සිරිතක් විය. සමහර භික්ෂූන් සුවච වූ අතර, තවත් සමහරු කීකරු නො වූහ. සමහරු බුදුරදුන් හඳුනති; ඇතැමෙක් නොහඳුනති. ප්‍රථම බෝධියෙහි තිබූ නිර්මල තත්ත්වය පසුකාලීනව ක්‍රමයෙන් දුර්වල වන්නට විය. මේ අනුව පටු ආකල්ප බැහැරකොට සමාධිගත ජීවිතයකට සඟරුවන යොමු කිරීම ප්‍රාතිමෝක්ෂයේ අරමුණ විය.

බුදුරදුන් කිසිවකුට කිසිම දිනක විනයක් පනවන්නට ගියේ නැත. විනය පනවන්නට යොමු වූයේ වැරැද්දක් කළවිට දී ය. සංඝ සමාජයේ දැඩි නීති - රීති පනවා සඟරුවන අතිශය අසීරුතාවට පත්කිරීමට බුදුන් වහන්සේ නොපෙලඹුණහ. එකිනෙකා අතින් සිදු වුණ වැරැදි පදනම් කරගෙන යළිත් එකම වැරැද්ද නොකිරීමට කටයුතු යෙදීම බුදුරදුන්ගේ පිළිවෙත විය. අපට විනය පිටකයක් ඇති වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

රාත්‍රී කාලයේදී එක්තරා භික්ෂුවක් පිඬු සිඟා ගිය අවස්ථාවක එම භික්ෂුව එක්තරා නිවෙසක දොරකඩ සමීපයෙහි පාත්තරය අතැතිව වැඩ සිටි අවස්ථාවේදී එම නිවෙසේ කාන්තාව අතින් ඉඳුල් වතුර එම හිමියන්ගේ සිරුරට වැටීමෙන් පසු පිඬු සිඟා ගිය

හිමියන් මහත් අසීරුතාවට පත් වූ අතර, එම කාන්තාව ද මහත් කම්පාවට පත් වූවා ය. නොදැකීමෙන්, නොදැනුවත්කමින් සිදු වූ වරදක් නිසා මේ සිද්ධියෙන් අනතුරුව රාත්‍රී කාලයේ සංඝයා වහන්සේට පිඬු සිඟා නොයන ලෙස බුදුරදුන් විනයක් පනවන ලදී.

බුදුරදුන් ආයුසංස්කාරය අත්හළේද නවම් පුන් පොහෝ දාක ය. බුදුරදුහු සැරියුත් හා මුගලන් දෙනමගේ පිරිනිවන් පෑමෙන් පසු රජගහ නුවරින් නික්ම චාපාල චෛත්‍යය වෙත වැඩියහ. එහි දී බුදුරදුහු ආනන්ද හිමියන් අමතා ''ආනන්දය, සතර ඉර්ධිපාද වැඩූවහුට කැමැති නම් ආයුස්කල්පයක් වුව ද ජීවත් විය හැකි ය'' යි වදාළහ. බුදුරදුන් තෙවරක් ම මෙය අවධාරණය කළ ද ආනන්ද හිමියන්ට මෙය නොවැටහිණි. ආයුස්කල්පයක් ජීවත් වීමට ඉඩකඩ තිබුණ ද අදහසක් ප්‍රකාශ කිරීම යටපත් වූ හෙයින් ආයුසංස්කාරය තුන් මසකින් හරින බව පැවැසීමෙන් අනතුරුව කල්පයක් වැඩ සිටින ලෙස ආනන්ද හිමියන් කීව ද එයින් පලක් වූයේ නැත.

ආයුසංස්කාරය අත්හළ කෙණෙහිම මහා භූමි චලනයක් එදා ඇති විය. එය සිදු වූයේ ද නවම් පෝ දා ය. චාපාල චෛත්‍යයෙන් විසල් පුරයට වැඩම කළ තථාගතයන් වහන්සේ කූඨාගාරයට රැස් වූ භික්ෂූන් අමතා සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වදාරා අන්තිම අවවාද කළහ. **'යො ධම්මං පස්සති සො මං පස්සති'** යනුවෙන් "යමකු ධර්මයට වදින්නේ නම් ඒ මට (බුදුරදුන්ට) වැඳීමක් වන්නේ යි" යනුවෙන් වදාළහ. ධර්මය ප්‍රථම තැන තබා ජීවිතයට මෝක්ෂ මාර්ගය හෙළි කෙළේ සත්ත්වයා සසරේ වැටී ඇති අගාධයෙන් ගොඩගැනීම උදෙසා ය.

ප්‍රඥාවන්තයන් අරබයා දෙසූ දහම දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ගය යන චතුස්සත්‍ය නුවණින් දැක නිවන දකින්නට ය. නවම් පොහොය අප ජීවිතයට කඩඉමක් කරගන්නේ ඒ හේතුව නිසා ය.

## වැදගත් සිදුවීම්

1) සැරියුත් - මුගලන් රහතන් වහන්සේ දෙනම අගසව් තනතුරු ලැබීම.
2) ඕවාද ප්‍රාතිමෝක්ෂ දේශනා කිරීම.
3) බුදුරදුන් ආයු සංස්කාරය අත්හැරීම.
4) සැරියුත් - මුගලන් දෙනමගේ පිරිනිවන් පෑමෙන් පසු රජගහ නුවරින් නික්ම බුදුරදුන් චාපාල චෛත්‍යය වෙත වැඩම කිරීම.

# පරම සත්‍ය දහම ලෝකයාට පහදාදීමට මුලපිරූ
# මැදින් පුන් පොහොය

මැදින් පොහොය යනු ව්‍යවහාරික වර්ෂයේ තුන්වැනි පොහොයයි. දුරුතු හා නවම් පොහෝයවල පවත්නා ශාසනික හා ලෝකාභිවෘද්ධි වටිනාකම මැදින් පොහොයට ද බලපායි. මිනිසා කෙරෙහි පහන් සිතුවිලි සමුදායයක් ජනිත කරලීමට ඉවහල් වන ඉතා ම වැදගත් සිද්ධි සමුදායක් සිදු වූ පොහොයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය.

අක්‍රියවාදය, උච්ඡේදවාදය ආදි විවිධ සමාජ දර්ශනික මත පැවැති යුගයක නිගණ්ඨනාථපුත්‍ර මක්කලිඝෝසාල, කකුද කච්චායනය, අජිත කේශකම්බල ආදි ෂට් ශාස්තෘවරුන් සිටි යුගයක, විවිධ දෘෂ්ටි කෙරෙහි සිත් සතන් යොමු වූ අවධියක, නිශ්චිත ගමනක දෘෂ්ටියක ගමන් කිරීමට නොහැකි වූ වකවානුවක බුදුරදුන් බුද්ධත්වය ලබා මිථ්‍යා මතවාද සියල්ල සිඳ බිඳ දමා පරම සත්‍ය හෙළිකොට, ඒ සත්‍ය දහම ලෝකයාට පහදා දීමට මුල පිරුවේ ද මැදින් පෝය දා ය.

බෝසතුන් බුද්ධත්වයට පත් ව ලෝකාර්ථචර්යාවේ යෙදෙන බවත්, ලෝකාභිවෘද්ධිය උදෙසා ක්‍රියා කරන ආකාරයත් පිළිබඳව කිඹුල්වත් නුවර වෙසෙන සුද්ධෝදන රජතුමාට දැනගන්නට ලැබීම මත බුදුරදුන්ට කිඹුල්වතට වැඩම කිරීවීමට ඇරියුම් කෙළේ ද මැදින් පුන් පෝ දා ය. විසි දහසක් ආර්ය මහා සංඝයා පිරිවරාගෙන කිඹුල්වතට වැඩම කරවීම සිදු වූයේ මැදින් පුන් පොහෝ දා ය.

සුදොවුන් රජු ඇමැතියකු කැඳවා පුරුෂයන් දහසක් පිරිවර වශයෙන් දී රජගහනුවරට ගොස් රජුගේ පණිවුඩය දෙන්නට සැලැස්වුව ද, ඇමැතියා රජගහ නුවර වේළුවනාරාමයට ගියත්

බුදුරදුන් සිය සිවු පිරිසට ධර්මය දේශනා කරන අවස්ථාවේ දී රජුගේ පණිවුඩය පසෙක තබා බණ අසා පිරිවර සමඟ රහත්ව මහණ විය. ගිය අය යළි නොපැමිණියේ මන්දැයි රජුට ප්‍රශ්නයක් විය.

මෙයින් නිරූපණය වන්නේ කුමක් ද? කිසියම් පුහුදුන් මිනිසකු බුදුරදුන්ගේ ධර්මය අසා පහන් සංවේග ජනිත කොට ගෙන රහත් වූවා නම් එම ධර්මය කොතරම් දුරට ජීවිතයට බලපාන්නේ ද යන්න, තේරුම් ගැනීම එතරම් අපහසු නො වේ.

ජීවිතයේ යථාර්ථය තේරුම් ගැනීම මෙහිදී වැදගත් ලක්ෂණය වේ. යථාර්ථය යනු, ඇත්ත ඇති සැටියෙන් දැකීම යි. ඇත්ත ඇති සැටියෙන් දැකීම යනු කුමක් ද? යමෙකු මෙලොව උපත ලද හොත් මියයාම ඒකාන්ත යි. යමක් මෙලොව ඇති වුව හොත් නැති වෙයි. මෙයයි ලෝක ස්වාභාවය. 'අනිත්‍ය-දුක්ඛ-අනත්ත' යනුවෙන් බුදුරදුන් 'ත්‍රිලක්ෂණය' පහදා දුන්නේ මෙය ය.

ජීවිතය යනු සදාකාලික දෙයකි. යමකු ඉපදුණාට පසු මිය ගිය විට යළි ඉපදීමක් නොමැත. ආත්මය මේ භවයෙන්ම කෙළවර වන්නේය යනාදි නිගමනවල එල්බ සිටි ජන සමාජයක ඇත්ත ඇති සැටියෙන් දැකීම ද අතිශය භාග්‍යයකි. යම් යම් මායාවල, මිථ්‍යාවල එල්බගෙන සිටි ජනයාට බුදු සමය සහන් එළියක් විය.

බුදුරදුන්ගේ පරම සත්‍යය දැනගැනීමේ අදහසින් සුද්ධෝදන රජු නව වාරයක් ඇමැතිවරුන් නව දෙනෙකු ප්‍රධාන නව දහසක් පිරිස බුදුරදුන් කිඹුල්වතට වැඩමවාගෙන එනු සඳහා පිටත් කර යැව්ව ද ඒ සියලු ගමන් නිෂ්ඵල විය; නිරර්ථක වෑයමක් ද විය. ඒ සියලු දෙනා යළි නුවරට ගෙන ඒමට නොහැකි වූයේ බණ අසා රහත් වූ බැවිනි.

රජුගේ ජීවිතය අවසන් වන්නට පෙරාතුව බුදුරදුන් කිඹුල්වතට වැඩම කළ යුතු යැයි රජු කියා සිටියේ ය. එවිට රජු කෙළේ බෝසතුන් හා එක දා උපන් කාලුදායි ඇමැතිවරයා බුදුරදුන් කිඹුල්වතට වැඩම කරවීමට යැවීම ය. එම අවස්ථාවේදී ඇමැතිවරයා කියා සිටියේ මහණ වීමට ඉඩ දෙන්නේ නම් පමණක් ඔබතුමාගේ පණිවුඩය රැ ගෙන යන බව යි. එම පොරොන්දුව මත රජගහනුවරට ගිය කාලුදායි සිය පිරිවර සමග බණ අසා රහත් විය.

බුද්ධත්වයෙන් දස මසක් පූර්ණ වූයේ ද මැදින් පුන් පොහෝ දා ය. කාලුදායි රහතන් වහන්සේ මහණ වී සතියකින් පසු බුදුරදුන්ට කිඹුල්වතට වඩින ලෙස ආරාධනා කෙළේ ය.

කිඹුල්වතට බුදුරදුන්ට වැඩමවීමට කාලය එළඹ ඇත. මැදින් පුන් පොහෝ දා එම අසිරිය කියා පාන්නට සොබාදහම ද වෙනස් මුහුණුවරක් ගත්තේ ය. සියලු ගස්වල, වැල්වල අතු ලියලා - දලුලා, මල්වලින් පිරී, පලතුරුවලින් සරුසාර වී, ඇළේ - දොළේ ගමන් වේගය වෙනදාට වඩා රිද්මයක් ඇතිවී සොබා දහමේ අසිරිය මෙපරිද්දෙන් සිදු වූ මොහොතක කාලුදායී තෙරුන් එම උත්තුංග ගමන් වර්ණනාව ගාථා සැටකින් පැවැසී ය.

බුදුරදුන් සිය වගකීම හා යුතුකම ඉටු කිරීමට යොදාගත්තේ ද මැදින් පුන් පොහෝ දා ය. කිසියම් මිනිසකුට ඉටු කිරීමට කාරණා දෙකක් මෙලොව තිබේ. එයින් පළමු වැන්න වන්නේ 'යුතුකම' ය. දෙවැන්න වන්නේ 'වගකීම' යි. මේ අංග දෙක නිතැතින් ම ඉටු වුව හොත් අයිතිය නැත් නම් අයිතිවාසිකම් නිරන්තරයෙන් ම ඉටු වේ. මේ පරමාදර්ශී පිළිවෙත බුදුරදුන් ලොවට හෙළි කෙළේත් මැදින් පුන් පොහෝ දා ය.

පියකු නොවූයේ නම් බුදුවරයෙක් ලොවට පහළ නො වේ. සිය පුතා බුද්ධත්වයට පත් වීම තරම් සතුටක් පියෙකුට තවත් නොමැති තරම් ය. ඒ සතුට භුක්ති විඳීමට සැලසීම බුදුරදුන්ගේ පරම යුතුකම විය. ඒ මත පිහිටා දිනකට යොදුන බැගින් සැට දිනකින් යොදුන් සැටක් ගෙවා කිඹුල්වත් නුවරට බුදුන් වහන්සේ වැඩියහ.

කිඹුල්වතට බුදුරදුන් වැඩි වේලෙහි වැඩිහිටියන්ගේ සිත්වල මානයක් ඇති වී 'බුදුරදුන්ට වැඳීම මහත් මදිකමක් ය' යන ආකල්පයේ පිහිටීම මත, අධිමමංකාරයක්, අභිමානයක් ඇතිවීම හේතුකොටගෙන ඔවුන්ගේ මානය දුරු කිරීම පිණිස බුදුරදුහු යමා මහා පෙළහර පෑහ. එම ප්‍රාතිහාර්යයෙන් අනතුරුව ඒ වෘද්ධතමයන්ගේ අභිමානය බිඳී බුදුරදුන්ට දොහොත් මුදුන් දී වන්දනය කළහ.

බුදුරදුන් කිඹුල්වත පුරා පිඬු සිඟා වැඩීම ද මහ රජුට මහත් මදිකමක් විය. ඒ නිසා ම රජු බුදුන් වහන්සේගෙන් 'බුදු හිමියනි; රජ බොජුන් වැළඳීමට අවකාශ තිබිය දී ගෙන්ගෙට ගොස් පිඬු සිඟා වඩින්නේ ඇයි දැ' යි ඇසී ය. එවිට බුදුරදුන් කියා සිටියේ 'මහ රජ,

ඔබේ වංශය රාජ වංශය යි. මගේ වංශය බුද්ධ වංශය යි. බුද්ධ වංශයේ අය කවදත් පිඬු සිඟා වඩින්නේ ය. මෙයින් ද බුදුරදුන් හෙළි කෙළේ බුදුරදුන්ගේ 'සමානාත්මතාධර්මතාව යි.

නන්ද කුමරුන්ගේ පැවිද්ද හා රහල් කුමාරයාගේ පැවිද්ද සිදු වූයේ ද මැදින් පොහෝදාක ය. නන්ද කුමරුගේ විවාහ මංගල්‍යය, අභිෂේක මංගල්‍යය හා නව ගෘහයට පිවිසීමේ මංගල්‍යය යන ඉතා වැදගත් මංගල්‍ය ත්‍රිකය සිදු වූයේ ද මැදින් පුන් පොහෝදාක ය. බුදුරදුන් නන්ද කුමරුගේ මාලිගයට වැඩමවා දන්දීමෙන් අනතුරුව යළි බුදුරදුන් වඩින අවස්ථාවේ බුදුරදුන්ගේ පාත්‍රය රැගෙන එන ලෙස නන්ද කුමරුට දැන්වී ය. එම ඉල්ලීම බැහැර කළ නොහැකි වූ හෙයින් ජනපද කල්‍යාණියගේ මුහුණ බලබලා බුදුරදුන් පසුපස ගොස් මහණ වී රහත් විය.

සුන්දරත්වය සොයා ගිය නන්ද කුමරුන් අවසානයේ සුන්දරත්වයෙන් අසුන්දරත්වය දැක ජීවිතය කෙටි කරගැනීමට මාර්ගය පාදාගත්තේ ය. රාහුල කුමරුන්ට සිදු වූයේත් මෙවැන්නකි.

බුදුරදුන් කිඹුල්වත රජ මාලිගයට වැඩමවීමේදී යශෝධරාවන් කෙරෙහි පැවැති දුක් කන්දරාව තුනී කරගන්නට ද එදා හැකි විය. එවිට බුදුරදුන් සඳකිඳුරු ජාතකය දේශනා කෙළේ, ඇය මේ භවයේ දී පමණක් නොව, භව ගණනකදී මෙසේ මුහුණදුන් ආකාරය පැහැදිලි කරමිනි.

සමාජාශ්‍රිත හා පුද්ගලාශ්‍රිත සිද්ධි සමුදායයකට මුල් වූ මැදින් පුන් පොහොය ජීවිතයට අර්ථයක් සොයා යන ගමනේදී වැදගත් ම කඩඉමකි; සන්ධිස්ථානයකි.

---

## වැදගත් සිදුවීම්

1) බෝසතුන් බුද්ධත්වයට පත් වී සිය පරම දහම ලෝකයාට පහදාදීමට මුල පිරීම.
2) බුදුරදුන්ට කිඹුල්වත් නුවර වැඩමවීමට සුදොවුන් මහ රජුන් ඇරියුම් කිරීම.
3) යුතුකම හා වගකීම යන පරමාදර්ශී පිළිවෙත ලොවට බුදුරදුන් හෙළි කිරීම.
4) නන්ද කුමරුගේ පැවිදි වීම.
5) රහල් කුමරුගේ පැවිදි වීම.

# බුදුරදුන්ගේ දෙවන ලංකාගමන සිදු වූ
# බක් පුන් පොහොය

බක් මහ අපගේ දෙසවනට වැකෙත් ම මනසට ගෝචරවෙත් ම අප කෙරෙහි ජනිත වන්නේ සෞන්දර්යයෙන් පරිපූර්ණ වූ අනූන පරිසරයකි. මෙයට කරුණු දෙකක් මුල් වේ. එයින් එකක් වන්නේ සිංහල සංස්කෘතියේ මහා උළෙල පවත්වන්නේ බක් මහේ වීම ය. දෙවැන්න බක් පුන් පොහොය යි. මේ දෙකරුණ සාපේක්ෂකව සමගාමීව සමාන්තරව ගමන් කිරීම අපූර්වතම සිදුවීමකි.

බුද්ධත්වයෙන් පස් වැනි වර්ෂයෙහි සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ විසූ බුදුරදුන්ට චූලෝදර-මහෝදර යන නා රජුන්ගේ මිණි පලඟක් පිළිබඳව ඇති වූ සටනක් දැන ගන්නට ලැබිණි. මේ නාග ගෝත්‍රිකයන් කෙරෙහි මහා කරුණාවෙන් යුතුව බුදු රජාණන් වහන්සේ බක් මස අව පසළොස්වක දා අලුයම නාගදීපයට වැඩියහ. මෙය බුදුරදුන්ගේ දෙවැනි ලංකාගමනය යි.

මාමා හා බෑනා අතර ඇති වූ මේ යුද්ධයට මුල් වූයේ මිණි පලඟ යි. නාග ගෝත්‍රිකයන් බිය ගැන්වීම සඳහා ඝන අඳුරෙක් මේ අවස්ථාවේදී මවන ලදී. මේ ඝන අන්ධකාරය අනුව නාගයෝ මහත් බියට පත් ව සිටියහ. මේ අවස්ථාවේ ආලෝකයක් මවා පෑමට බුදුන් වහන්සේ සැලැස්වූහ. මෙයින් මහත් සතුටට පත් නාග ගෝත්‍රිකයෝ බුදු සිරි පා කමල් වැන්දාහ.

බක් පොහොයේ පෘථුලාර්ථය වන්නේ සමගිය යි. සමගියෙන් ජීවත් වීමේ අගය බුදුරදුහු බක් පොහෝ දා පෙන්නුම් කෙළේ ය. ජනතාව කොටස්වලට බෙදීමෙන් සිදු වන්නේ අනර්ථයක් බව

උන් වහන්සේ පහදා දුන්හ. එක ම ජන කොටසක් ලෙස ජීවත් වීමේදී රටේ සමාජ, සංස්කෘතික, අධ්‍යාපනික, ආගමික, ආර්ථික වශයෙන් විශාල සුගතියක් ඇති වන බව ද මෙහිදී බුදුරදුහු හෙළි කළහ. කාකොලූත ජාතකය, චන්දන ජාතකය, ලටුකික ජාතකය, වට්ටක ජාතකය ආදි අතීත කතා නිදසුන් දක්වමින් වෛර කිරීමේ ආදීනව කියා දෙන ලදි.

බක් මහේදී පැවැත්වෙන සංස්කෘතික උළෙලින් නිරූපණය කරනු ලබන්නේත් සමගිය යි. සියලු තරහ-මරහ අමතක කොට සුහද අයුරින් ජීවත් වීමේ අගය මෙයින් නිරූපිත වේ. චූලෝදර-මහෝදර යන දෙදෙනාගේ කතා පුවත අදට ඉතා ම වැදගත් වේ. ගැළපේ බෙදී වෙන් වී විනාශ වී නැසෙනවා ද? එසේ නොමැතිව එකට එක් වී නොනැසී සැනසෙනවා ද යන්න සිතා බැලීමට කාලය එළඹ ඇත.

බෝසතාණන් සතර පෙර නිමිති බැලීමේදී මහල්ලෙක් දුටුවේ ද බක් පුර පසළොස්වක දාක ය. මිනිසාගේ සුන්දර රූපකාය කෙමෙන් ගිලිහී යන අන්දම මෙයින් නිරූපිත වේ. සමාජයේ වෙසෙන බොහෝ අය ස්වකීය රූපයට ආඩම්බර වෙමින්, උද්දාමයට පත්වෙමින් ජීවත් වුව ද ඔවුන් නොදැනුවත්ව ම එම සුන්දර රූපකාය ගිලිහී යන ආකාරය ගැන සිතන්නේ කීයෙන් කී දෙනා ද? මේ යථාර්ථය තේරුම් ගෙන ජීවත් වන්නේ නම් සමාජයේ ප්‍රශ්න බොහෝදුරට අඩු විය හැකි ය.

සමගියට නිමිත්ත බක් මාසය යි. බක් මාසය ඉතා ම වැදගත් වන්නේ සමගියට යි. මිනිස් වර්ගයා සමගියෙන් ජීවත් වීමට මඟ පෙන්වන ලද්දේ බක් මාසයේදී යි. කිසිවකු කියන පලියට ඒ මගෙහි යෑම බෞද්ධ පිළිවෙත නො වේ. ඇත්ත ඇති සැටියෙන් දැනගෙන ඒ මඟෙහි යන්නටයි බුදුරදුන් අපට පෙන්වා දුන්නේ. **'ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤෙඤ්හෝති'** ආදි වශයෙන් බුදුරදුන් අපට පෙන්වා දුන්නේ, ඇවිත් බලා හොඳ නම් එය තෝරා බේරා ගෙන ජීවිතයට උකහා ගන්නා ලෙස ය. එසේ නොමැතිව යමකු කියූ පමණින් ඒ ඔස්සේ එල්බ නොගෙන මං මුළා නොවන ලෙසට ද අපට පෙන්වා දෙන ලදී.

බොහෝ විට අප යමක් දකින්නේ පටු දෘෂ්ටි කෝණයෙනි. අපගේ පුළුල් වූ දෘෂ්ටිය මත දසත ඥානය විහිදවිය යුතුය. පටු

පරමාර්ථවල එල්බ නොගෙන පුළුල් පරමාර්ථ සිත්වල රොද බැඳ ගත යුතු ය. එවිටයි තමන්ගේ ජීවිතය ප්‍රභාවත් වී අන් අයගේ ජීවිත ද ප්‍රභාවත් වන්නට ඉඩකඩ සැලසෙන්නේ.

සොබාදහමේ මහා පෙරළියක් ඇති වන බක් මාසයේ අප කෙරෙහි ජනිත වන හැඟීම් ද සුන්දර ය. 'අමූලිකා' ශ්‍රද්ධාව වෙනුවට 'ආකාරවතී' ශ්‍රද්ධාව වඩන බක් මාසය ජීවිතයට අර්ථයක් සොයා යන ගමනේදී හොඳ ම කඩඉමකි. ජීවිතයේ ඉම සොයා යන්නට අපට සිදු වේ. මේ ඉම කුමක් ද? එය තමයි 'නිවන'. අනාත්මවාදී ලක්ෂණ මතු වන අපගේ ජීවිතයෙන් ගොඩ වන්නට ප්‍රඥාව මෙහෙය විය යුතු ය. බුදු සමය ප්‍රඥාවන්තයන්ට පමණි. මෝඩයන්ට බුදුසමය වැදගත් නො වේ. එය උකහා ගන්නට ඥානයක් තිබිය යුතු ය.

සංසාරයේදී ගමන් ගන්නා සත්ත්වයාගේ ප්‍රඥාව මත සසර කෙටි වේ. අඥානයන්ට සසර දිග ය; ප්‍රඥාවන්තයන්ට සසර කෙටි ය. ප්‍රඥාවන්තයා බලන්නේ මේ දුක් ගොඩින් කෙසේ හෝ ගැලවී සංසාර සාගරයෙන් එතෙර වන්නට ය. සියලු ආශාවන් දුරුකොට කෙලෙස් ප්‍රහීනකොට පංචශීලයට අනුව ජීවත් වීම ඊට හොඳ මග යි.

---

**වැදගත් සිදුවීම්**

1) බෝසතුන් සතර පෙර නිමිති අතුරින් මහල්ලෙක් දැකීම,

2) බුදුරදුන්ගේ දෙවැනි ලංකාගමනය හා චූලෝදර - මහෝදර නා රජුන්ගේ මිණි පලඟ සම්බන්ධයෙන් ඇති වූ සටන නිරාකරණය කිරීම.

## මැදුම් පිළිවෙතට මං පෑදූ

# වෙසක් පුන් පොහොය

ලොව වට බුදුවරයෙකු පහළ වීම මහත් අසිරියකි. එම අසිරිය විවිධාකාරයෙන් අර්ථ විග්‍රහ කළ හැකි ය. මිනිසා ඉපදීමත් සමඟ ය, මරණය රැගෙන එන්නේ. මරණය අතර මඟ දී ඇතිවන්නක් නොව, උපතත් සමඟ සිදුවන්නකි. ඉපදීමෙන් හා මරණයෙන් ගැලවෙන්නේ කෙසේ ද? මේ පැනයට නිසි පිළිතුරු දීමටයි, ලොවට බුදුවරයෙකු පහළ වන්නේ.

ලෝකයේ විවිධ ආගමික නායකවරු බිහි වූහ. එහෙත් එම නායකයන්ගෙන් මෙයට නිසි පිළිතුරක් නොලැබිණි. පුද්ගලයාගේ මරණයෙන් පසු ආත්මය කෙළවර වන්නේ යයි ද එසේ නොවන්නේ යැයි ද ආදි වශයෙන් ජීවිතයට, නැති නම් ආත්මයට විවිධ අර්ථකථන ගෙන හැර දැක් වූහ.

ජීවිතය යන පදය මතුපිටින් ඉතා සරලාර්ථයක් ගෙන දුන්න ද එයින් ධ්වනිත වන අරුත ගැඹුරු ය. ජීවිතය ගැන විමසා තරණය කිරීමට යථාර්ථවාදී විය යුතු ය. එහි අරුත එය යි. මේ තත්ත්වය වටහා දීමට ය, ලොවට බුදුවරයෙකු පහළ වන්නේ. බුදුවරයා යනු සියල්ල දත් තැනැත්තා ය.

තුන්කල්හිම පැවැති
පදරුත් සියල් ලොව ඇති
ඇතැඹුල සේ දනිති
එයින් සම්මා සම්බුදුන යෙති

(බුදුගුණාලංකාරය)

තුන්කාලයේ ම, එනම්, අතීතය, වර්තමානය, අනාගතය යන කාලවල ලොව ඇති සියලු පදාර්ථ අතෙහි ඇති නෙල්ලි ගෙඩියක්

සේ දන්නා බැවින් 'සම්මා සම්බුද්ධ'යැයි කියනු ලැබේ. මේ තත්ත්වය අවබෝධ වන්නේ බුදුවරයෙකුට පමණි.

අමාමැණි තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ උපත, බුදු වීම හා පිරිනිවන් පෑම යන ත්‍රිකය සිදු වූයේ වෙසක් පුන් පොහෝ දා ය. බෞද්ධයන්ට සෙසු පොහොයන්ට වඩා වෙසක් පොහොය සුවිශේෂිත වන්නේත් ඒ හේතුව නිසා ය. සෙසු පොහොයවලට වඩා ජනතාව කෙරෙහි පහන් සංවේග ඇති වී එය විවිධ අයුරින් සැමරීමට අපි පුරුදු වී සිටිමු. වෙසක් තොරණ, ශීල සමාදාන, දන්සල්, වෙසක් නාට්‍ය, වෙසක් භක්ති ගීත, පෙරහර, ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, සල් උයන් (බුද්ධ චරිතයේ විවිධ අවස්ථා නිරූපිත) ආදියෙන් 'වෙසක් සමය' නැත් නම් 'වෙසක් පොහොය' සැමරීමට අපි පුරුදු වී සිටිමු.

සෙසු පොහොය එදිනට ම පමණක් සීමා වන අතර, වෙසක් පොහොය සතියක් නැත් නම් දෙසතියක් පුරා සමරන්නට අප පුරුදු වී සිටින්නේ බුදුවරයෙකු ලොවට පහළ වීම නිසා ය. මහා ප්‍රඥාවෙන් මහා කරුණාව උපදවා ලෝක සත්ත්වයාගේ හිත සුව පිණිස යොදුන් ගණන් පයින් ම ගොස් දුකට පත් සත්ත්වයා එම දුකින් මුදගැනීම උන් වහන්සේගේ අභිප්‍රාය විය. හුදු ආත්මාර්ථය පසෙකට ඇදදමා පරාර්ථය උදෙසා ගිය ගමන කොතරම් අසිරිමත් ද? ඕනෑ තරම් ලෞකික ජීවිතයේ සැප සම්පත් තිබියදී ඒ සියල්ල අමතක කොට සියලු සත්ත්වයා දුකින් ගලවාගැනීම එක ම අභිප්‍රේථාර්ථය විය.

රසායනාගාරයකට ගොස් බුද්ධ ධර්මය සාක්ෂාත් කරගත නොහැකි ය. තමන් විසින් ම එය ප්‍රගුණ කළ යුතු ය. තමන් වෙනුවෙන් වෙනත් කෙනෙකුට නිවන් යන්නට කටයුතු කළ නොහැකි ය. බුදුසමය ප්‍රඥාවන්තයන්ට පමණක් යැයි සඳහන් කෙළේත් ඒ හේතුව නිසා ය. '**තුම්හේහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා**' යන වදනට අනුව 'ඔබ උත්සාහයෙන් වීර්යයෙන් කටයුතු කරන්න' ඊට මඟ බුදු සමයෙන් පෙන්වා දෙයි.

ජීවිතයට අහිතකර අන්ත දෙකක් බුදුරදුනු බැහැර කළහ; ශරීරයට දැඩි සේ දුක් දීම යන '**අත්ථකිලමතානු යෝගය**' බැහැර කළහ. එමෙන් ම ශරීරයට ඉතා ම සැප දීමේ '**කාමසුඛල්ලිකානුයෝගය**' බැහැර කළහ. මේ අන්ත දෙකම අත්හදා බලා එම මාර්ග නැත් නම්

අන්තවලින් ජීවිතයට කිසිදු විමුක්තියක් අත් නොවන බව හෙළි කළහ. බඩ පිටට ඇලෙන තුරු ශරීරයට දුක් දීම නිසරු කාර්යයක් බව අපට පෙන්වා දුන්හ; එය අත්දැකීම්වලින් කියා පෑහ.

මේ අන්ත දෙක මුළුමනින් ම බැහැරකොට මැදුම් පිළිවෙත හෙවත් මධ්‍යම ප්‍රතිපදාව බුදුන් වහන්සේ අපට පෙන්වා දුන් සේක. යමක දැඩි සේ අන්තයට නොගොස් සියල්ල මැදහත් සිතින් සිතා කටයුතු කළයුතු යැයි පැවසූහ. ඒ අනුව මැදුම් පිළිවෙත අපට අතිශය සුවදායක ය. දැඩි සේ අන්තවාදී නොවී දැඩි මතධාරීත් නොවී සියල්ල උපේක්ෂාවෙන් සිතා කටයුතු කිරීමෙන් විමුක්තියක් ඇති වේ ය යන නියතය අපට හැඟවී ය. මේ සියල්ලන්ට ම පිහිට වන්නේ බුදුසමය යි.

ලොව කිසිදු දෙයක් ස්ථිර නැතැ යි අපට බුදුරදුහු කියා පෑහ. අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යනුවෙන් ත්‍රිලක්ෂණ ධර්මයක් හෙළි කළහ. යමෙක් ඉපදුණොත් මියයයි. යමක් ඇති වුණොත් එය නැති වෙයි. මෙයයි ලෝක ධර්මතාව. වෙසක් පුන් පොහෝදා බෝ මුලදී සාක්ෂාත් කොට ගත් ධර්මයේ හරය යි, ඒ. මේ තිලකුණු අප නිතර ම මෙනෙහි කළ යුතු ය. එසේ නොමැතිව සදාකල් ජීවත් වීමේ පරම ආශාවෙන් අප ජීවත් වුව හොත් සැම දා ම මේ සංසාර චක්‍රයේ ඇලී - ගැලී - වෙළී - පැටලී ජීවත් වීමට අපට සිදු වේ.

යම් කිසි පුද්ගලයෙකු දුකට පාත්‍ර වන්නේ ඇලීම නිසා ය. බොහෝ දෙනා යම් යම් වස්තු කෙරෙහි ඇලීම හේතුකොට ගෙන තෘෂ්ණාව වර්ධනය වේ. තෘෂ්ණාව ප්‍රහීණ කළ යුතුව තිබියදී එය තවදුරටත් වර්ධනය කිරීමෙන් සිදු වන්නේ අනාත්මවාදිව මේ සංසාර චක්‍රයේ සැරිසරන්නට ය. ගමන් මඟ කෙටි කරගත යුතුව තිබියදී එම මඟ දිගු කරගන්නේ තෘෂ්ණාව හේතුකොටගෙන ය.

අපට ආර්ය අෂ්ටාංගික මාර්ගයක් හා චතුරාර්ය සත්‍ය ධර්මයත්, බුදුරදුහු ඇසළ පුන් පොහෝ දා හෙළි කළහ. සොබාදහමට අනුගත ධර්මයක් වූ බුදු සමය ඒ සාර වූ ධර්මය දෙසන්නට බුදුරදුන් තෝරාගත්තේ ඉසිපතනයේ මිගදාය නමැති සොඳුරු වටපිටාවක් ඇති කඳුගැටයකි. වන සතුන් ද, දෙව් බඹුන් ද, පස්වග තවුසන් ද ප්‍රමුඛව දෙසූ සාරධර්මය චතුරාර්ය සත්‍ය ධර්මයයි. සාර අසාර අතර පරතරය හෙළි කළහ; සාරයෙන් සාරය උකහා ගන්නා අයුරු කියා පෑවෝය.

කුමක් ද මේ චතුරාර්ය සත්‍ය ධර්මය? දුක, දුක ඇති වීම, දුක නැතිකිරීම, දුක නැති කිරීමේ මාර්ගය ඒ චතුස් සත්‍යයයි. මේ සියල්ල

ම සම්බන්ධයෙන් ප්‍රාගුණ්‍යයක් ලබන්නට නම් අප කෙරෙහි ප්‍රඥාව තිබිය යුතු ය. ප්‍රඥාව නැති අයට බුදු සමය කැප නැත. එය කැප වන්නේ ප්‍රඥාවන්තයන්ට පමණි.

ගෞතම බුදු රජාණන් වහන්සේ දීපංකර පාද මූලයේදී නියත විවරණ ලද්දේ ද වෙසක් පුන් පොහෝ දිනක යි.

බුද්ධත්වයෙන් අටවැනි වසරේදී බුදුරදුන් මණිඅක්ඛිත නා රජුන්ගේ ඇරියුමින්, කැලණියට වැඩම කෙළේ ද, අනතුරුව සමනළ ගිරිමුදුනේ සිරිපා සටහන තබන ලද්දේ ද වෙසක් පුනු පොහෝ දිනකයි.

විජය කුමරුන් ලංකාවට පැමිණියේ වෙසක් පුන් පොහොය දිනක ය. සිංහල ජාතියේ ආරම්භකයා ලෙස සැලකෙන විජයකුමරු ඉන්දියාවේ සිට ලංකාවේ දඹකොළ පටුනට පැමිණි බව වංශකතාවල දක්වේ.

ධර්මාශෝක රජුගේ නියමයෙන් දෙවැනිපෑතිස් රජු දෙවැනි වරටත් අභිෂේක ලද්දේ වෙසක් පුන් පෝදාක බව ලංකා ඉතිහාසයේ සඳහන් වේ.

ධර්මභාණ්ඩාගාරික ආනන්ද හිමියන් පිරිනිවන් පෑවේ ද මෙවැනි ම උතුම් වෙසක් පුන් පොහෝ දිනයක බව ශාසන ඉතිහාසයෙන් දැනගත හැකි ය.

මෙවන් සුවිශේෂී සිදුවීම් රැසක් සිදු වූ ජාතික ආගමික වැදගත්කමින් අනූන වෙසක් පොහොය බෞද්ධ ලෝකයාගේ අතිපූජනීය, ශ්‍රේෂ්ඨතම දිනයකි. මෙම දවස මුළු ලෝකයට ම නිවාඩු දිනයක් බවට පත් කිරීමට තරම් වැදගත් වූයේ ලොවක් සැනසූ දහමක් ලොවට උදා වූ දිනයක් වන හෙයිනි. වෙසක් පෝය දිනය ලෝක නිවාඩු දිනයක් බවට පත් කිරීමේ ගෞරවය හිමි වන්නේ අප ශ්‍රී ලංකාවට යි.

## වැදගත් සිදුවීම්

1) බෝසතුන් නියත විවරණ ලැබීම.
2) බෝසත් උපත - බුදු වීම හා බුදුරදුන්ගේ පිරිනිවන්පෑම සිදු වීම.
3) බුදුරදුන්ගේ තෙවැනි ලංකාගමනය හා සිරිපා සටහන් තැබීම.
4) විජය කුමරුගේ ලංකාගමනය.
5) දෙවනපෑතිස් රජුගේ දෙවැනි රාජාභිෂේකය.
6) ආනන්ද හිමියන්ගේ පිරිනිවන්පෑම.

# ලංකාවේ සමාජ පුනරුදයකට මංපෙත් හෙළි කළ
# පොසොන් පුන් පොහොය

වෙසක් පුන් පොහොය බෞද්ධයන්ට සුවිශේෂිත වටිනාකමක් ඇති වන්නේ යම් සේ ද පොසොන් පොහොයත් එසේ ම ය. බුදුසමය මෙරට ස්ථාවර කළ ද එය වඩාත් පෝෂිත තලයකට සේන්දු වූයේ පොසොන් පොහෝ දා මිහිඳු මාහිමියන් මෙරටට වැඩීමත් සමග ය.

මිහිඳු මා හිමියන් මෙරටට වැඩම කරන්නට පෙරාතුව ප්‍රාග් යුගයේ ඇදහිලි සම්බන්ධව විමසීමක යෙදෙන විට එදා සමාජය යා යුතු මාර්ගය නොදැන මංමුළා වූ පිරිසක් බව පෙනේ. බුදුසමය ව්‍යාප්තව හා ස්ථාපිතව තිබුණේ නම් ගස් - ගල් - ජලය - සඳ - හිරු - සත්ත්වයන් - අනංගයා - නාගයන් ආදිය වැඳුම් පිදුම්වලට ලක් නොවන්නේ මැ යි.

අන්තවාදී හා අතිධාවනකාරී ස්වරූපයක් ගනු ලැබූ සමයක පොසොන් පොහෝ දා මිහිඳු මාහිමියන් අප කෙරෙහි අනුකම්පාව උපදවා වැඩියේ මංමුළා වූ ස්වරූපයෙන් සමාජය ගොඩගැනීම සඳහා ය. විමුක්තිය පතා විවිධ විශ්වාසයන්ට නැඹුරු වුව ද එයින් ලත් විමුක්තියක් නොමැත. විමුක්තිය කරා යන්නට නම් සැබෑ දර්ශනයක්, මාර්ගයක්, පැහැදිලි චින්තනයක් තිබිය යුතු ය. මේ ත්‍රිකය නොමැතිව විමුක්ති මාර්ගය සෙවීම අඳුරේ අතපත ගෑමක් බඳු ය.

මෙබඳු වකවානුවක යි, මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩියේ. මිහිඳු මාහිමියන්ගේ වැඩමවීමෙන් මෙරට සමාජ පුනර්ජීවයක්, සමාජ පෙරළියක් සිදු වූවා යැ යි කීවොත් එය නිවැරැදි ය.

දෙවනපෑතිස් රජු හමු වීමෙන් අනතුරුව 'ඇත්පද සූතුර' හෙවත් 'චුල්ලහත්ථිපදෝපම සූත්‍රය' දෙසීමෙන් රජුගේ ඥානය කුමන මට්ටමක පවතින්නේ දැයි දැන, ඉතා සියුම් ඥානයකින් හෙබි රජුට ධර්ම දෙසීම මත ගම්-නියම්ගම්, දනව්-පසල්දනව්, පුර-විසල්පුර ආදිය ඔස්සේ ධර්මය ප්‍රචාරය කොට මිථ්‍යා දෘෂ්ටියෙන් සම්‍යයක් දෘෂ්ටියට ජනතාව යොමු කිරීමට මිහිඳු මාහිමියෝ දැඩි පරිශ්‍රමයක් ගත්හ.

රජුගේ පූර්ණ රාජ අනුග්‍රහය එදා නොලැබුණේ නම් මිහිඳු මාහිමියන්ට පමණක් මේ දැවැන්ත පරිවර්තනය කිසිසේත් ම සිදු කළ නොහැකි වනු ඇත. මිසදිටු ජන සමාජයක් එක විට ම සම්දිටු වූ බවට පත් කිරීම එතරම් පහසු කරුණක් නො වේ. එබැවින් යම් යම් මතවාදවල එල්බගෙන සිටි ජනතාව එම පටු මතවලින් බැහැර කිරීමට විවිධ ක්‍රමවේද උපක්‍රම භාවිතා කරන්නට සිදු විය.

සොබා දහමෙන් කිසියම් සහනයක් ලත් ජනකායක් හේතුඵල සම්මත දහමකට නැඹුරු කිරීම එතරම් පහසු කරුණක් නො වේ. මේ යථාර්ථය තේරුම් ගෙන අනුගාමිකයන් සමුදායයක් තනන්නට මිහිඳු මාහිමියන්ට සිදු විය. මහ වනපෙත් එළිපෙහෙළි කොට ගල්ලෙන් පවිත්‍රකොට මහ සඟරුවන වැඩමකොට ජනතාවට ධර්මය දෙසන්නට මං පාදවන ලදි. ධර්ම ග්‍රන්ථ කියවා රසාස්වාදයක් ලැබීමට නොහැකි එම ධර්මය උකහාගැනීමට නොහැකි වූ ජනකායට එම දහම කෙසේ අවබෝධ කළ යුතු ද යන ගැටලුවට එදා මුහුණ දීමට සිදු විය. අද වැනි සමාජයක් එදා නොතිබුණත් මේ තත්ත්වයට පත් වන්නට අතිශයින් ම බලපාන ලද්දේ එදා මිහිඳු මාහිමියන් ගෙනගිය ඉතා බුද්ධිසම්පන්න වැඩපිළිවෙළ යි.

වර්තමානයේ කතා බහට ලක් වී ඇති ග්‍රාමරාජ්‍ය සංකල්පය අපට ප්‍රථමයෙන් ම හඳුන්වා දෙන ලද්දේ බුදුරදුන් ය. මෙය අලුත් සංකල්පයක් නො වේ. බුදුරදුන් මුලින් ම කෙළේ බුද්ධත්වයට පත් වී සඟ සැට නමක් බිහිකොට ගම්වල නායකත්වය සඟරුවනට බාර කිරීම යි. එදා ගමේ නායකත්වය බාර කරන ලද්දේ සංඝරත්නයට යි.

ධර්මකාමී, අර්ථකාමී, සමාජ සාරධර්මකාමී සමාජයක් තැනීමට ප්‍රථමයෙන් ම ඉවහල් වන්නේ සඟරුවන යි. ඒ පදනමේ පිහිටා යි, එදා ගමත් - නගරයත් සදාචාරවාදී සමාජයක් ගොඩනැගීමට

ඒකාබද්ධ කරන ලද්දේ. මේ මඟෙහි යමින් මිහිඳු මාහිමියන් කෙළේත් මේ න්‍යාය යි. එම න්‍යාය ප්‍රායෝගික තලයකට ඇදගෙන ගොස් ගම කේන්ද්‍රකොට ගෙන ගමේ නායකත්වය සඟරුවනට පවරන ලදි. ඒ අනුව ගල් ලෙන් පරිශ්‍රය විහාර බවට පරිවර්තනය වී මහා විහාර බිහිවීම දක්වා දිව ගියේ ය. මේ දැක්ම මතයි, අනුරපුර මහාවිහාර හා අභයගිරි විහාර ද්වය ඇති වූයේ.

ඕනෑ ම දේශයකට වංසකතාවක් අනිවාර්යයෙන් ම අවශ්‍ය ය. මහානාම මාහිමියන් අතින් සිංහල මහාවංසය ලියැවුණේ එහි ඵල වශයෙනි. ප්‍රථමයෙන් මහා විහාරය ඉදි වී විශාල වශයෙන් සමාජ-ආගමික-ආර්ථික-සංස්කෘතික-දේශපාලනික විපර්යාසයකට බලපෑමක් ඇති කැරිණි.

ධර්ම දේශනයෙන් අනතුරුව ධර්ම ග්‍රන්ථ ලියන්නට පෙලඹුණේ ශ්‍රවණගෝචර ශෛලියට ආදේශ වශයෙන් අක්ෂිගෝචර ශෛලියක් අරඹමිනි. ශ්‍රවණ ශෛලියෙන් ඈත් වී අක්ෂිගෝචර හෙවත් ඇසින් බලා රස විඳීමේ එම ධර්මය උකහාගැනීමේ මාවතට දොරටුව විවර විය. එතැන් පටන් ධර්ම ග්‍රන්ථ බිහි වන්නට වූයේ, පොදු ජනතාව වඩාත් ධර්මයට නැඹුරු කිරීමේ පරම අටියෙනි.

එදා යතිවරුන් මේ උදෙසා ද ක්‍රමවේද, විධිවේද, අනුගමනය කළ බව පෙනේ. එම ක්‍රමවේදය, විධිවේදය වූයේ ජනකාය කෙරෙහි කුහුල නැත්නම් කුතුහලය ජනිත වීමට මානසික තත්ත්වයක් උදා කිරීමයි. අමාවතුර බිහි වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. බුදුසිරිත මේ ග්‍රන්ථවලට ප්‍රස්තුතය විය. බුදුරදුන්ගේ නව අරහාදී බුදුගුණ අතුරෙන් පුරුෂධම්ම සාරථී ගුණය පාදක කොටගෙන ගුරුළුගෝමීන් අමාවතුර ලියුවේත්, කයෝර බස්වරහක් යෙදුවේත් ජනතාව කෙරෙහි කුහුල ඇති කිරීමේ පරමාර්ථයෙනි.

ඉන් අනතුරුව බුත්සරණ අර කුහුල තුනී කෙළේ ය. බුදුරදුන්ගේ නව අරහාදී බුදුගුණ එම ග්‍රන්ථයට අන්තර්ගතකොට බුදුරදු යනු කවරෙක් ද? ඒ දහම ජීවිතයට බලපාන්නේ කවරාකාරයෙන් ද? ලෞකිකත්වයෙන් ලෝකෝත්තර මාර්ගයට යෑමට ඉවහල් වන්නේ කුමන අයුරින් ද? වෙනත් ආගමික දහම් අතර, බුදුගුණ, බුදුසිරිත වෙසෙස් තැනක් ගන්නේ කුමන ලක්ෂණ මත ද යන්න සම්බන්ධයෙන් හොඳ විවරණයක් මේ මගින් සපයන ලදි.

වෙහෙර විහාර දාගැබ් තනා සඟරුවන ඒ ආශ්‍රිතව වෙසෙන්නට භූමිකාව සකසා ජනතාවත්, සඟරුවනත් අතර සමීප සම්බන්ධතාවක් ඇති කිරීමට කටයුතු කරන ලදි. වැව-දාගැබ-කෙත ආශ්‍රිත අපේ සංස්කෘතිය ගොඩනැගුණේ ඒ අනුව ය. සිංහල ලකුණ මෙය යයි අපට පොසොන් පොහොය කියා දුන්නේ ය. වැවක් තනා එයින් ගොඩදමාගත් පස්වලින් දාගැබක් නිර්මාණය කරන ලදී. වැව ආශ්‍රිත ජලයෙන් කෙත් යායක් ඉදි කිරීම මත මිනිසා ආර්ථික වශයෙන් ස්වයංපෝෂිත කිරීමේ කාර්යයට ද නැඹුරු විය. කුසගින්නේ සිට ධර්මය උකහාගැනීමට ගෝචර කරගැනීමට නුපුළුවන. බුදුරදුන් ද පුද්ගලයන්ට ධර්මය දේශනා කෙළේ මේ පරමාර්ථයේ පිහිටා ය. කසීභාරද්වාජ බමුණාට බණ දෙසුවේ කුස පුරවා ය. කුසගින්නේ සිටින පුද්ගලයෙකුට මොන බණ ද? මේ සාරාර්ථය පදනම් කොටගෙන රට බත බුලතින් සරුසාර කිරීමට අදිටන් කොටගත් මිහිඳු ධර්මය නැත් නම් පොසොන් දර්ශනය මිනිසා මානසික වශයෙන් ද විපර්යාසයකට බඳුන් කෙළේ ය.

සංවේදී මිනිස් සමාජයක් බිහි විය. රළු-පරළු ගතිවලින් දුරස්ථ වී ඉවසීමේ ගුණය පුරුදු පුහුණු කෙළේත් පොසොන් දර්ශනය යි. හැඩි දැඩි ගලකට ජීවයක් ලබාදුන්නේ මේ හේතුව නිසා ය. සඳකඩ පහණ, මුරගල්, කොරවක්ගල් පමණක් නොව බුදුරදුන්ගේ අප්‍රමාණ ගුණසමුදායෙන් අංශුවක් නැත්නම් කණිකාවක් ගලකට ආරෝපණය කොට ශෛලමය බුදුරුවක් නිර්මාණය වූයේත්, මිනිසා සංවේදී වූ හෙයිනි. හිඳි බුදු පිළිම, හිටි බුදු පිළිම, සැතපෙන බුදු පිළිම පමණක් නොව නාග, රූකම්, බහිරව රූකම්, පුන්කලස්, නාග-මනුෂ්‍ය රූකම් ආදි විවිධ ශෛලමය නිර්මාණ බිහිවූයේ ද පොසොන් පොහෝ දා උදා වූ නව සංස්කෘතිය හේතුකොටගෙන ය.

සඳකඩ පහණට පිවිසුණු සැදැහැවතුන් මුරගල-කොරවක්ගල පසුකොට පියගැට පෙළ සංකීර්ණයෙන් බුදුරුව වඳින්නට ගියේ, නිවන පසක් කරගැනීමේ අටියෙනි. පොසොන් දර්ශනයෙන් නව ශිෂ්ටාචාරයක් ද බිහි විය. රාජ්‍ය පාලනයකට නැඹුරු වී වැඩවසම් පාලන තන්ත්‍රයක් බිහි වුව ද, එය ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් ගනු ලැබුවේ බුදුසමයේ ආභාසයෙනි. පාලනය රජු වටා කේන්ද්‍රගත වුව ද මැති-ඇමැතිවරුන් පරිපාලනයට ඒකාබද්ධකොටගෙන

පාලනයේ දැහැමි ස්වරූපයක් ගන්නා ලදී. රාජ නාමාවලියක් අපට උරුම විය. රාජාවලිය ලෙස හඳුන්වන්නේ එය යි.

සමාජවාදයේ කේන්ද්‍රීය තැන්න ලෙස සැලකෙන පන්සල, බුදුරුව, බුදුගෙය, බෝගස, බෝධි ප්‍රාකාරය, දාගැබ ආදී සංකේතවලින් උපලක්ෂිත කෙළේ බුද්ධ චරිතය යි; බුදු සමය යි. ගතත් සිතත් ප්‍රබෝධවත් වී හඳුන්කුරු සුවඳ දසත පැතිරී අප කෙරෙහි ඇති වන පහන් සංවේග ලෝකෝත්තර මඟට දොරටුව විවර කරන්නකි. සිවු දිසාවෙන් එන ජනකායට විහාරගෙයි දොරටු හතරක් විවෘත වී ඒ දොරටුවල සඳකඩ පහණ් සතරක් ද, මුරගල් ද, කොරවක් ගල් ද නිර්මාණය වී, පැන් දෝවනය කිරීමට පැන් කලස් සතරක් භාවිතයට තැබුවේ ද මුව දෝවනය කොට අත් පා වතුරෙන් පිරිසුදු කොට බුදුගෙයට යෑම සඳහා ය. මල් දෝතට ගෙන, පාවහන් ගලවා පහන් සිතින් බුදුගෙයට යන්නට අපට ඉගැන්වූයේ, මිහිඳු දර්ශනය යි; පොසොන් දහම යි.

නව නිර්මාණ කෙරෙහි අප යොමු කෙළේත් මිහිඳු දර්ශනය යි. සමාජ සංවර්ධනය අරබයා නව ප්‍රවේශයකට අපේ විඥානය යොමු කිරීම ද මිහිඳු සංස්කෘතියෙන් ඇති වූ තවත් ප්‍රතිඵලයකි. එකින් එක පරිච්ඡේද අප ගොනු කළ හොත් සමාජය විවිධ පැතිකඩාශ්‍රිතව යොමු වන්නට වූයේත් මිහිඳු ධර්මය හේතුකොට ගෙන ය.

සුදෝ සුදුවතින් සැරැසී මිහින්තලේ උපාසක-උපාසිකාවන් සිල් සුවඳ විහිදුවන්නේ මිහිඳු මාහිමියන්ට උපහාරයක් වශයෙනි. ධර්මය විහිදුවන්නට, ව්‍යාප්ත කරන්නට උපස්තම්භක වූ මිහින්තලාව කේන්ද්‍රස්ථානයකි. පොසොන් පොහෝ දා දෙනෝ දාහක් පිරිස් මිහින්තලාවට අතුරු සිදුරු නොමැතිව එක්රැස් වන්නේ මිහිඳු මාහිමියන්ට උපහාර දක්වන්නට ය. ඒ සමග ම තමන්ගේ ජීවිතයට අර්ථයක් ඇති කරගැනීමේ පරමාර්ථයෙනි. අර්ථවත් ගමන අර්ථපූර්ණ කරගැනීමට විෂය වන මිහින්තලයට පිවිසෙන පියගැට පෙළ සමාධිගත ජීවිතයකට මූලාරම්භය යි. පඩි පෙළ මතින් නැග ඉහළ මාලයට යන්නකු නිතැතින් ම භාවනාවට යොමු වීම ද නිසැකයෙන් ම සිදු වන්නකි.

අඹ ගසක් පාදකකොට ගෙන අඹ සංවාදයෙන් ඇරැඹී අපේ ගමන් මඟ අපේ ඉතිහාසයක් ලියන්නට, පන්හිඳ පත්ඉරුවල

දිවයන්නට මුල් විය. එදා-මෙදා තුර ගමන් මග දෙස බලන විට අපට එය එක් අතකින් විස්මයට කරුණකි. අහස සිඹිනා මහා දාගැබ් ඉදිවී, මහා සයුර පරයාලන මහ වැව් තැනී, මුනිගුණ දිගන්තය අරා යන පිළිම ඉදිවී, මහා වනපෙත් කෙත්වතු බවට පෙරළී මිනිසුන්ගේ ආධ්‍යාත්මික ගුණ වගාව ප්‍රගුණ කරන්නට මිහිඳු මාහිමියන් පෑ ප්‍රාතිහාර්යය ලියන්නට කොළ ප්‍රමාණවත් ද?

මිහිඳු මාහිමියන් නිසා නිපන් නිදන් පුරාවස්තු තවමත් රජගල පොළොව යට වැළලී ගොසිනි. අද දින පාදා ඇත්තේ ඒවායින් එකක් පමණි. තුනෙන් දෙකක් ම පොළොව යට ය. ලොව වැඩි ම පුරා වස්තු සමුදායයකට අප උරුමකම් කියන්නේ ද මිහිඳු මාහිමියන්ට පින් සිදු වෙන්නට ය.

---

## වැදගත් සිදුවීම්

1) මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය.
2) ඇත් පද සුතුර හෙවත් චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දෙවන පැතිස් නිරිඳුන්ට මිහිඳු මාහිමියන් දේශනා කිරීම.
3) ධර්ම ග්‍රන්ථ ලියැවීමට මුල පිරීම.
4) මහාවංසය ලියැවීම.

## අවිද්‍යාවෙන් අන්ධ වූ ලෝකයට අමා දහම් බෙරය වැයූ

# ඇසළ පුන් පොහොය

වෙසක් පුන් පොහෝ දා බෝසතුන් බුද්ධත්වයට පත් වුව ද එම දහම ලොවට දේශනා කෙළේ අසිරිමත් ඇසළ මාසයේ පුන් පොහෝ දා ය. ඇසළ පොහොය වඩාත් අසිරිමත් වන්නේ ඒ හේතුව නිසා ය. කසාවතින් බැබළෙන ඇසළ මල්වලින් පිරි ගස් අපගේ නෙතට චමත්කාරය ගෙනදෙන්නකි. කොළ නැති කසා මල් සමූහය පරම සත්‍යය සංකේතවත් කරන්නකි. හුදු ආත්මාර්ථය උදෙසා නොව පරාර්ථය පතා අභිනිෂ්ක්‍රමණය කෙළේ සත්ත්වයා දුකෙන් මුදාගැනීමට ය.

සත් සති ගෙවා, බුදුරදුන් අටවන සතියේ උදැසන තපස්සු-භල්ලුක යන වෙළෙඳ දෙබෑයන් දුන් මී පිඩු වළඳා, ඔවුන් ද්වේවාචික සරණාගත උපාසකයන් කොට, ඔවුනට කේශධාතු දී අජපල් නුගරුක මුල වැඩ හිඳ ධර්මගාම්භීරතා මෙනෙහි කොට, විනෙයජනයන් බලා පස්වග තවුසන්ට පළමුකොට දම් දෙසනු උදෙසා ඇසළ පුන් පොහෝ දා බරණැස ඉසිපතනයේ මිගදායට වැඩි සේක.

මෙසේ බරණැස ඉසිපතනයේ මිගදායට යන අතරතුරදී උපක නම් ආජීවකයෙක් හමු විය. ඍද්ධි ගමනින් නොව පා ගමනින් ම වැඩියේ පරමාදර්ශීව ය. ගයාවත් බෝධි වෘක්ෂයත් අතරෙහි වූ දීර්ඝ මාර්ගයට පිළිපන් භාග්‍යවතුන් උපක දුටුවේ ය. එසේ දැක භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේ ය; “ඇවැත්නි, නුඹ වහන්සේගේ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් විශේෂයෙන් ප්‍රසන්න ය. සිරුරු පැහැය පිරිසුදු ය; අතිශයින් නිර්මල ය. ඇවැත්නි, තමුන්නාන්සේ කවරෙකු උදෙසා පැවිදිවූ සේක් ද? තමුන්නාන්සේගේ ශාස්තෘ

තෙමේ කවරෙක් වේ ද? තමුන්නාන්සේ කවරකුගේ ධර්මය රුචි කරන සේක් දැ'' යි විචාළේ ය.

උපක ආජීවකයාගේ පැනයට බුදුරදුන් මෙසේ පිළිතුරු දුන්නේය.

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බේසු ධම්මේසු අනූපලිත්තො
සබ්බංජහෝ තණ්හක්ඛයො විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං

මාදිසා වෙ ජිනා හොන්ති
යෙ පත්තා ආසවක්ඛයං
ජිතා මෙ පාපකා ධම්මා
තස්මාහං උපකොජිනො

"කාමාදි ආශ්‍රවයන් ක්ෂය කිරීමට පැමිණි මා වැනි යම් කෙනෙක් වෙත් ද ඔහු ඒකාන්තයෙන් 'ජින' නම් වෙති. උපකය, මා විසින් සියලු පාප ධර්මයෝ දිනන ලදහ. එහෙයින් මම (අනන්ත) ජින නම් වෙමි."

අපේ පැරැණි කවියන් ඒ මහා ජින හඳුන්වා ඇත්තේ මෙසේයඃ

බුදු ව දැන සව් නේ
තුටු ව එල සම වති නේ
ගොසින් ඉසිපත නේ
උතුම් දම්සක් පවත්වමි නේ

''මම සියල්ල මැඩ සිටියෙමි; සියල්ල දන්නෙම් වෙමි; සියලු ධර්මයෙහි නොඇලුණෙමි; සියලු කෙලෙස් හැර සිටියෙමි; තෘෂ්ණාක්ෂයයෙහි නිමාවට ගියෙමි. තෙමේම සියල්ල දැන සිටි මම අන් කවරකු ආචාර්ය වශයෙන් උදෙසන්නෙම් ද?''

මෙසේ පිළිතුරු දුන් බුදු රදුන් තමන් වහන්සේ ස්වයංභූඥානයෙන් පසක්කොටගත් ශ්‍රී සද්ධර්මය පස්වග මහණුන්ට දෙසීම සඳහා මිගදායට වැඩි සේක. සර්වඥ වූ බුදුරදුන් පස්වග තවුසන් අමතා, ''ද්වෙමෙ භික්ඛවෙ අනන්ත - පබ්බජිතෙන නසෙව තබ්බා". කාමසුඛල්ලිකානුයෝගයත් - අත්තකිලමතානුයෝගයත් යන අන්ත දෙක බැහැර කොට මැදුම් පිළිවෙත හෙවත් මධ්‍යම ප්‍රතිපදාවට

හුරුවිය යුතුය, එය අනුගමනය කළ යුතු ය, යනුවෙන් සඳහන් කෙළේ ය.

වඩාත් රාගාදි දිවියට නැඹුරු වීම සසර දිගු වීමකි. එමෙන් ම වඩාත් සිරුරට දුක් දීම ද හානිදායක ය. මේ අන්ත දෙක ම ජීවිතයට ඵලය නො වේ; සසර කෙටි කරගැනීමට ඉවහල් නො වේ. දැඩි මතධාරි හා දැඩි අන්තවාදි මේ මාර්ග දෙක බැහැර කළ බුදුරදුහු මේ දෙකට ම මැද මාවතක් හෙළි කළහ. ඒ මධ්‍යම ප්‍රතිපදාව යි. පරෝපදේශ රහිතව තමන් වහන්සේම අවබෝධ කොටගත් දහම, යි ඒ.

**චතුස්සත්‍ය ධර්ම චක්‍රය** පවත්වා අවසන කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි සෝවාන් ඵලයට පත් වූහ. පස්වැනිදා පස්දෙනාම **අනාත්ම ලක්ෂණ** දේශනාවෙන් අර්හත් ඵලයට පමුණුවා, නාලක පැවිද්දා හට මොනෙය්‍ය පටිපදාව දේශනා කොට ඉසිපතනයෙහි ම හිඳිමින් යසකුල පුත් ආදි පණස් දෙනා රහත් කිරීමෙන් පසු ''චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්තාය හිතාය සුඛාය දේවමනුස්සා නං දෙසෙථ භික්ඛවෙ ධම්ම පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ'' යනුවෙන් සඳහන් කොට අනුගාමිකයන් පිරිසක් බුදුන් වහන්සේ ඇති කළහ.

ගම්-නියම්ගම්ල දනව්-පසල්දනව්වල පුර-විසල්පුර වශයෙන් ප්‍රථම සැට නම ධර්ම ප්‍රචාරයේ යෙදීමට මූලික වූයේත් ඇසළ පුන් පෝ දා ය. එක මඟකින් දෙදෙනෙකු නොගොස් එක් එක් මාර්ගවල එක් එක් අනුගාමිකයන් යවා ගම්වල අනුගාමිකයන් හිඳුවා ධර්මය දේශනාකොට චතුස්සත්‍ය ධර්මය හෙවත් දුක - දුක ඇතිවීම - දුක නැතිකිරීම - දුක නැති කිරීමේ මාර්ගය පහදා දෙන ලෙස සඳහන් කළහ.

''මගේ දහම ප්‍රඥාවන්තයන්ට පමණ ය'' යි කී බුදු රජාණන් වහන්සේ මෝහයෙන් මුළා වූ අයට එය උකහාගන්නට නොහැකි බව ද සඳහන් කළහ. තවදුරටත් ඔබ්බට ගිය දහම ආර්ය අෂ්ටාංගික මාර්ගයක් බවට පත් විය. සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව (ශීල) සම්මා වායාම - සම්මා සති - සම්මා සමාධි (සමාධි) සම්මා දිට්ඨි - සම්මා සංකප්ප (ප්‍රඥා) ආදි වශයෙන් තවදුරටත් පැහැදිලි කරන ලදි.

අටුවාචාරීන්ට මෙය වැරැදී ඇති බව පෙනේ. ප්‍රඥාව මුලට පැමිණිය යුතුව තිබියදී එය යොදා ඇත්තේ අගටය. ප්‍රඥා - ශීල - සමාධි වශයෙන් එය නිවැරැදි විය යුතු යැයි මගේ කල්පනාව. ප්‍රඥාව නැතිව කිසිවක් කළ නොහැකි ය. බුදුරදුන් "මගේ ධර්මය ප්‍රඥාවන්තයන්ට ය"යි පැවසුවේ ඒ හේතුව නිසා ය. ප්‍රඥාවෙන් ශීලය ලබා ඉන් අනතුරුව සමාධි වැඩිය යුතු ය. බුදු රදුන් ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙන් හෙළි කෙළේ මෙය යි.

ඇසළ පුන් පොහෝදා බුදුරදුන් දෙසූ ධම්මචක්කප්පවත්තන සූත්‍රයට අමතරව සිද්ධි සමුදායක් සිදු වූ බව බෞද්ධ සාහිත්‍යයෙන් අනාවරණය වේ.

සිදුහත් කුමාරයා මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳ ගත්තේ ඇසළ පුන් පොහෝදාක ය. මලින්, පලින් බර වී සොබාදහමේ විපර්යාසයක් සිදු වූ මොහොතක මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳ ගැනීමත් අසිරියක් නොවන්නේ ද?

**අභිධර්මය** හෙවත් **විජම් බණ** දෙසුවේත් ඇසළ පුන් පොහෝදාක ය. අභිධර්මය දේශනා කරන ලද්දේ ද සාමාන්‍ය ජනතාවට නොව දෙවියන්ට ය. ගැඹුරු බණක් දෙවියන්ට දේශනා කිරීමට යොදාගත්තේත් ඇසළ පෝ දිනකි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකින් පසු මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ප්‍රධාන පන්සියයක් මහරහතන් වහන්සේ විසින් අජාසත් රජුගේ දායකත්වය හා ආරක්ෂක සංවිධාන සහිතව රජගහනුවර වෝභාර පර්වතයෙහි ප්‍රථම සංගායනාව පවත්වන ලද්දේත් ඇසළ පුන් පෝ දා ය.

ඇසළ පුන් පොහෝ දා සිදු වූ තවත් සුවිශේෂිත සිද්ධියක් වූයේ මිහිඳු මහ රහතන් වහන්සේ මහා සංඝරත්නය විසින් සම්මත කළ සීමාවේ **ප්‍රථම කණ්ඩ සීමාව** සම්මත කිරීම ය.

බු:ව: 236 අරිට්ඨ කුමරු ප්‍රධාන සිංහලයන් සපණස් දෙනාගේ මහණ උපසම්පදාව තම්බුරු සීමා මාලකයේ සිදු වූයේත් ඇසළ පුන් පෝදාකය. මිහින්තලේ කණ්ඨක චෛත්‍ය වූකලි වාස්තු විද්‍යාවේ ඉහළ ම ගණයට ගැනෙන නිර්මාණයකි. දැනට නොකැඩී ඇති උසස් ම වාහල්කඩ ඇත්තේත් කණ්ඨක චෛත්‍යයේ ය. මේ චෛත්‍ය වටා කැරුණු අටසැට ලෙන් පූජාව හා දෙසැටක් රහතන්

වහන්සේගේ ලංකාවේ ප්‍රථම වස්සූපගමනය (පළමුව වස් එළඹීම) සිදු වූයේත් ඇසළ පුන් පොහෝදාක ය.

තවත් සුවිශේෂිත සිද්ධියක් වන්නේ රුවන්මැලි මහ සෑයට මුල්ගල් තැබීම යි. එමෙන් ම උත්‍රසල නැකතින් මහ සෑයේ ධාතු නිධන් කිරීමත් සිදු වූයේ ඇසළ පුන් පෝදාක ය. කිත්සිරිමෙවන් රජු දවස හේමමාලා හා දන්ත කුමරු ගෙනෙන ලද දළදා වහන්සේ උදෙසා වර්ෂයක් පාසා පෙරහර පැවැත්වීමට මුල පුරන ලද්දේත් ඇසළ පුන් පෝදාක ය.

ඇසළ මාසය පෙරහර මාසයක් ලෙස ද හැඳින්වේ. දළදා පෙරහර, රුහුණු කතරගම මහා දේවාල පෙරහර, ගඩලාදෙණි පෙරහර, මැදවල පෙරහර, ගල්ගමුව පෙරහර, බෙල්ලන්විල පෙරහර ආදි පෙරහර පවත්වනු ලබන්නේත් ඇසළ පුන් පොහෝ දා ය. ජනකාය කෙරෙහි බුද්ධ භක්තිය, දේවභක්තිය වඩන්නට ද දෙනෝදාහක් පිරිසගේ දෙඇස් එක් අරමුණකට යොමු වී එක ඉරියව්වකට නැඹුරු කිරීමට ද ඇසළ පෙරහර සමත් වේ.

අප වඩාත් ඇසළ පොහොයට නැඹුරු වන්නේ බුදුරදුන් ලෝකසත්ත්වයාගේ හිත සුව පිණිස දේශනා කළ හරවත් දහම හේතු කොටගෙන ය. ''චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි". (නුවණැස පහළ විය. ඥානය පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.) මේ වැකිය ඇසූ දෙව් බඹු පිරිස සාදු නාද පැවැත්වූහ.

අපට අවශ්‍ය වන්නේ සංසාරයෙන් එතෙර වීමට ය. සියල්ල දුකක් ය. සැපතක් කියා දෙයක් ලොව නැත. එසේ සැපතක් ඇතැයි යමකු සිතුවොත් එය තාවකාලික වූ සැපයකි. එය ද මායාවකි; මිථ්‍යාවකි. මේ යථාර්ථය අපට ඇසළ පොහොයෙන් බුදුරදුන් හෙළිකෙළේ ය. ලක්දිව පිරිසුදු උපසම්පදාව ඇති භික්ෂූන් වහන්සේ නැති බව දුටු කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සියම් රටේ අයෝධ්‍යා පුරයේ ධාර්මික නම් රජතුමා වෙත පඬුරු හා සන්දේශයක් දී පිරිසක් යවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් උපාලි හිමියන් ප්‍රධාන භික්ෂූන් වහන්සේ සියම් දේශයෙන් මහනුවර මල්වතු මහා විහාර පුෂ්පාරාමයට

වැඩම කොට සාමණේර භික්ෂූන්ට උපසම්පදාව ලබාදෙන ලද්දේත් ඇසළ පුන් පෝදාක ය.

## වැදගත් සිදුවීම්

1) සිදුහත් කුමාරයා මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳගැනීම.
2) සසර කලකිරී අභිනිෂ්ක්‍රමණය කිරීම.
3) රාහුල කුමාරෝත්පත්තිය.
4) මිගදායට යන ගමනේදී උපක නම් ආජීවකයෙක් බුදුරදුන්ට හමු වීම.
5) බුදුරදුන් පස්වග තවුසන්ට දහම් දෙසීම උදෙසා බරණැස ඉසිපතන මිගදායට වැඩමවීම හා ප්‍රථම ධර්මදේශනාව පැවැත්වීම.
6) සඟ සැට නම ධර්ම ප්‍රචාරය උදෙසා සැට දිසාවලට යොමු කිරීම.
7) බුදුරදුන් ගණ්ඩබ්බ රුක්ඛ මූලයේදී යමාමහ පෙළහර පා තීර්ථකයන්ගේ මානය බිඳලීම.
8) තව්තිසා දෙව් ලොවට වැඩමකොට, දෙවියන්ට විජම් බණ (අභිධර්මය) දේශනා කිරීම.
9) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට කටයුතු ආරම්භ කිරීම.
10) මිහිඳු මාහිමියන් ප්‍රධාන මහා සංඝයා විසින් සම්මත කළ සීමාවෙහි ප්‍රථම ඛණ්ඩ සීමාව සම්මත කිරීම.
11) බු:ව: 236 වැන්නෙහි අරිට්ඨ කුමරුන් ප්‍රධාන සිංහලයන් සපණස් දෙනාගේ මහණ උපසම්පදාව තම්බුරු සීමා මාලකයේදී සිදු වීම.
12) දෙවනපෑතිස් නිරිඳුන් විසින් කණ්ඨක චෛත්‍යය වටා කරවූ අට සැට ලෙන් පූජාව හා දෙසැටක් රහතන් වහන්සේගේ ලංකාවේ ප්‍රථම වස්සූපගමනය සිදු වීම.
13) හේමමාලා හා දන්ත කුමරු විසින් ගෙනෙන ලද දළදාව ප්‍රදර්ශනය කිරීමට පෙරහර පැවැත්වීමට මුල පිරීම.
14) බුදුරදුන්ගේ පාත්‍රාධාතුව ලංකාවට වැඩමවීම.
15) බුදුරදුන්ගේ ප්‍රථම වස්විසීම.
16) සංඝයාවහන්සේ පෙරවස් එළඹීම.

# ජීවිතයෙන් නික්මයාමේ යථාර්ථය හෙළි කරන
# නිකිණි පුන් පොහොය

දොළොස් මසට උපයුක්ත වූ පොහොය දොළහ විවිධ අවස්ථාවන්ගෙන් සමලංකෘත ය. සමාජයේ හා පුද්ගලයාගේ අභිවෘද්ධිය උදෙසා පොහොය වඩාත් ජීවිතවලට බද්ධ වී ඇත. මසකට වරක් එළඹෙන පොහොය දිනය සෙසු දිනවලට වඩා සුවිශේෂත්වයක් දනවයි. එදිනට පාන්දර ම සැදැහැවතුන් අවදි වී සුදෝසුදු වතින් සැරසී දෝතින් ගත් මල් ද සුවඳ දුම් ද රැගෙන වෙහෙර විහාර වැඳපුදාගෙන සිල් සමාදන්වීම සම්ප්‍රදාය යි; සිරිත යි.

නිකිණි පොහොය දා සිදු වන්නේත් මෙය ම යි.

ජීවිතයට වඩාත් උද්දීප්තියක් ළඟා කරන්නක් ලෙස නිකිණි පොහොය අර්ථ දැක්විය හැකිය. බුදුසමය අනුව යන අයගේ මූලික පරමාර්ථය, අරමුණ, එසේ නැත් නම් අදිටන වන්නේ සංසාර සාගරයෙන් එතෙර වීම ය. සසර බැමි සිඳ බිඳ දැමිය යුතු ය. එසේ සිඳලන්නට හැකි වන්නේ තෘෂ්ණාව දුරු කිරීමෙනි. ආශාව දුරු නොකොට සසර බැමි බිඳ දැමිය නොහැකි ය. බුදුරදුන් දස පාරමිතාවේදී මුලට යෙදුවේ දානය යි, නැත්නම් දීම යි. දෙන්නේ නැතිව කිසිවක් කළ නොහැකි ය. සසර කෙටි කරගත නොහැකි ය; මෙයට නිදසුන් වශයෙන් මේ භවයේ කිසියම් පුද්ගලයෙකු ඥානයෙන් ද ධනයෙන් ද ආඪ්‍ය ව සිටින්නේ නම්, එම පුද්ගලයා පෙර භවයේදීත් දීම (දානය) හා ප්‍රඥාව ප්‍රදානය කළ හෙයින් පුද්ගලයා එවන් තත්ත්වයට පත් වන්නට ඇතැ යි බුදුසමය අනුව සිතිය හැකි ය. සිදු විය යුත්තේත් එය ම යි.

නිකිණි පොහොය මේ යථාර්ථය අපට හඟවයි. පන්සල හා ගිහියන් අතර සබැඳියාව වඩාත් තහවුරු කිරීමට මේ පොහොය වැදගත් වේ. අන්‍යොන්‍ය සබැඳියාව වර්ධනය කිරීමට නිකිණි පොහොය වෙසෙස් තැනක් ගනී. ගිහි-පැවිදි දෙපක්ෂය අතර පවත්නා යුතුකම් ඉටු කිරීමට මේ පොහොය හොඳ මාර්ගයකි; අවස්ථාවකි.

මහා සඟරුවන විවිධ ප්‍රදේශවල විසිරී-පැතිරී ඇති හෙයින් ගිහියන්ට සිය යුතුකම් ඉටු කිරීමට අවස්ථාවක් නොඑළඹේ. මහා සඟරුවනට දාන-මාන දීම ඇප උපස්ථාන කිරීමට බොහෝ අය සැදී පැහැදී සිටිති. එහෙත් මේ අවස්ථාව බොහෝ විට මගහැරේ. මේ උපස්ථාන නිසි පිළිවෙළට කිරීමට වස් කාලය ඉඩකඩ සලසයි.

වර්ෂා කාලයේදී එක තැනකට වී වස් සමාදන් වීම බුදුරදුන් පැනවූ විනය ප්‍රඥප්තියක් නො වේ; ප්‍රාග් යුගයේ සිට පැවැත එන සම්ප්‍රදායයකි. එහෙත් භික්ෂු සමාජය කෙමෙන් විකාශනයට පත් වීමත් සමග ම වස්සාන කාලයේ චාරිකාවේ යෙදෙමින් අර පැරණි සම්ප්‍රදාය උල්ලංඝනය කරන්නට වූහ. මෙය සිදු වූයේ බුදුරදුන් රජගහනුවර වේළුවනාරාමයේ වැඩ වසන සමයේදී ය.

මේ මහඟු සම්ප්‍රදාය උල්ලංඝනය කිරීම මත ජනතාව මහත් උද්ඝෝෂණයක නියැලුණි. බෞද්ධ භික්ෂූන් හේමන්ත, ගිම්හාන, වස්සාන කාලවල තිල් තණ මඩිමින් පා ගමනින් කුඩා සතුන් විනාශයට බඳුන් කරමින් චාරිකාවේ හැසිරෙද්දී සෙසු පරිබ්‍රාජිකාදීහු එක්තැන් ව වස් විසීමෙහි ඇලී සිටිති.

කුරුල්ලෝ කූඩුවලට වී සිටිති; ගොදුරු සෙවීමෙහි උත්සාහයක නොයෙදී එක තැනක වෙසෙති. එහෙත් භික්ෂු සමූහයා පමණක් චාරිකාවේ සැරිසැරීම අවිනීත ක්‍රියාවක් බව ජනතාව භික්ෂූන්ට දැනුම්දීමෙන්, චෝදනා කිරීමෙන් පසු එම භික්ෂු පිරිස විසින් බුදුරදුන්ට දැනුම් දෙන ලදී. මේ කරුණාකාරණ පදනම් කරගෙන බුදුරදුන් භික්ෂූන් වහන්සේට ''අනුජානාමි භික්ඛවෙ වස්සං උපගන්තුන්'' යනුවෙන් ''මහණෙනි, මම වස්සාන ඍතුවෙහි වස් එළඹෙන්නට අනුදනිමියි'' භික්ෂූන් ඇමතූ සේක. එකල්හී භික්ෂූන් වහන්සේට වස් එළඹීම කෙතෙක් දැයි විමතියක් ඇති විය. එය බුදුරදුන්ට දන්වන ලදි.

එවිට බුදුරදුන්... **"ද්වෙ මෙ භික්ඛවෙ වස්සූපනාභිකා පුරිමිකා පච්ඡිමිකාති අපරජ්ජුගතාය ආසාල්හියා පුරිමිකා උපගන්තබ්බා මාසගතාය ආසාල්හියා පච්ඡිමිකා උපගන්තබ්බා ඉමෙඛො භික්ඛවෙ ද්වෙ වස්සූපනායිකා ති"** යනුවෙන් ''මහණෙනි, පෙරවස් එළඹීම, පසුවස් එළඹීම යයි මේ වස් එළඹීම් දෙකකි. ඇසළ පුනු පොහොයට පසු දින එනම් අවපෑළවිය දිනයෙහි පෙරවස් එළඹිය යුතු ය. ඇසළ පුනු පොහොය දිනයෙන් මසක් ඉක්මගිය කල්හි නිකිණි අවපෑළවිය දිනයෙහි පසුවස් එළඹිය යුතු ය. මහණෙනි, මේ වස් එළඹීම් දෙක යි'' වදාළහ.

මෙතැන් පටන් දඹදිව ප්‍රාග් යුගයේ සිට සම්ප්‍රදායයක් ලෙස පැවැති වස් එළඹීම ප්‍රඥප්තියක් බවට පත් විය. මේ අනුව වස් එළඹීම ජනතාවගේ උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් බව සැලකිය හැකි ය.

බුදුරදුන් ප්‍රඥප්ති ආවට ගියාට පැනවූයේ නැත. යම් යම් හේතු මත විනයක් පනවන ලදී. සඟරුවනේ නිදහසට බාධා කරන්නට බුදුරදුන්ට වුවමනාවක් නො වී ය. එය නිදහස් සසුන් පතට පටහැනිය. ඒ අනුව බොහෝදුරට සිතා බලා ගැළපේද නොගැළපේ ද යන්න විමසා බලා සහේතුකව සාධාරණව පනවන ලද බව සත්‍යයකි. සිවු මසක් පමණ වැසි පවතින බැවින් ස්වකීය පන්සලට අරමට වී ''වස්සික සාටිකය'' හෙවත් ''වැසි සළුව'' වස් වසන භික්ෂූන් විසින් වස් වසන දිනයෙහිම අධිෂ්ඨාන කොට වස් සාර මාසයෙහි පරිහරණය කළ යුතු සිවුරක් ලෙස නියම කොට ඇත.

නාන කඩය යනුවෙන් හඳුන්වන මේ චීවරය සඟරුවනට වාග් විඥප්තියෙන් වුවද ඉල්ලාගෙන පරිහරණය කළ හැකි වස්ත්‍රයක් වශයෙන් සලකනු ලැබේ. මෙය භික්ෂූන්ට ලබාගැනීමට ප්‍රථමයෙන් ම කටයුතු කරන ලද්දේ විශාඛා මහෝපාසිකාවගේ ඉල්ලීමකට අනුව ය. වැස්සෙන් පීඩා විඳින සංඝරත්නය දුටු විශාඛාවන් **"ඉච්ඡා මහං භන්තෙ සංඝස්ස යාවජීවං වස්සික සාටිකං දාතුං"** යනුවෙන් ''ස්වාමිනි, මම දිවි ඇති තාක් සංඝයාට වැසි සළු පුදන්නට කැමැත්තෙමි.'' ඇයගේ බසට කන්දීමක් වශයෙන් බුදුරදුන් **"අනුජානාමි භික්ඛවෙ වස්සික සාටිකං වස්සානං චාතු මාසං අධිට්ඨාතුං තතොපරං විකප්පෙතු"** යනුවෙන් ''මහණෙනි, වස්

සාර මසෙහි වැසි සළුව අධිෂ්ඨානකොට ප්‍රයෝජනයට ගන්නටත් එයින් පසු විකප්පනය කරන්නටත් අනුදැන වදාරමි"යි වදාළහ.

වස්සාන කාලයෙහි සැදැහැවතුන් සඟරුවන වෙසෙන ආරාමයට ගොස් නිතර ම පින් දහම් කටයුතුවල යෙදීම මත ජීවිතයේ යථාර්ථය තේරුම් ගැනීමට නිකිණි පොහොය උපස්තම්භක වේ.

බොහෝ අය ජීවිතය හා මනුෂ්‍යත්වය එකක් ලෙස සලකති. එහෙත් මෙය දෙකකි. මනුෂ්‍යත්වය, මිනිස්කම්, මතු වන්නේ ජීවිතයෙනි. සද්භාවය, යහපත්භාවය, සත්පුරුෂ ලක්ෂණ, කෘතවේදිත්වය, සංවේදිබව යන ගුණාංග මතු වන්නේ මනුෂ්‍යත්වය පදනම් කරගෙන ය.

ජීවිතය යනු පොදු වූවකි. එහෙත්, මනුෂ්‍යත්වය, මානුෂිකභාවය පොදු ගුණාංග නො වේ. මිනිසාගේ විඥානය ප්‍රගුණ කිරීමෙන් මතු වන ලක්ෂණ වන්නේ මනුෂ්‍යත්වය යි. මානුෂික හැඟීම් මතු වීමට මේ නිකිණි පොහොය හොඳ ම භූමිකාවකි; පරිශ්‍රයකි. මානුෂිකභාවයෙන් යුතුව අසත්පුරුෂ ලක්ෂණවලින් හෙබියා වූ පුද්ගලයෙකුට උදවු කිරීම නිෂ්ඵල වෑයමකි. උදවුවට භාජනය වූ පුද්ගලයා එම ගුණ නිරන්තරයෙන් ම මෙනෙහි කිරීම මිනිස්කමකි. මෙතැනදී උදවු කළ පුද්ගලයාට එම ක්‍රියාව මත යහපතක් ඇති වේ. එය අමතක කළ තැනැත්තාට හෝ තැනැත්තියට එහි ඵලවිපාක අත් වේ. හරියට දත් මැදලා දමන දැහැටි දඬු මෙන් ප්‍රයෝජන ගෙන අමතක කිරීම, ඉවතට වීසි කිරීම, අසත්පුරුෂයන් කෙරෙහි පවත්නා දුර්ගුණයකි. මේවා අපට අවබෝධ කොට දෙන්නේ නිකිණි පොහෝ දින පන්සලට ගිය විට ය.

දිනක් රහතන් වහන්සේ නමක් නියරක් උඩින් ගමන් ගන්නා විට, බීමත් මිනිසකු කිසිම සංවරයක් නොමැතිව රහතන් වහන්සේ ගැන කිසිදු ගෞරවයක් ගරුසරුකමක් නොමැතිව නියර උඩින් ගමන් ගන්නා රහත් නමගේ ඇඟේ හැපී එම හිමියන් වෙලට නැත්නම් කුඹුරට වැටුණි. මේ සිද්ධිය දුටු තවත් අයකු වැටී සිටි රහත් නම නැගිටවන ලදී. බීමත්ව හැසිරුණු මනුෂ්‍යයා ලොකු වරදක් කළ බව නැගිට්ටවන ලද අය ගතු කියන ලදී. එවිට රහත් හිමියන් කියා සිටියේ නැත නැත ඔහු කිසිදු වරදක් මට නොකළ බව ය. ඔබ කළ දෙයට ඔබට ප්‍රතිඵල ගෙන දෙන්නා සේ එම පුද්ගලයා කළ දෙයට

ඔහුට ප්‍රතිඵල ගෙන දෙන බවයි. මේ අනුව යහපත් මිනිසකු බවට පත් කිරීමේ පුද්ගල විඥානය හසුරුවන්නේ නිකිණි පොහොය යි.

ලෝකයේ හොඳ හා නරක යනුවෙන් කොටස් දෙකකි. මේවා නිර්ණය කරනු ලබන්නේ ද නිකිණි පොහොය යි. වස් කාලයේ ආරාමවල වෙසෙන සංඝ සමූහයා සමග ධර්ම සාකච්ඡාවල යෙදී ධර්ම මාර්ගයෙන් යහපත් දිවි පෙවෙතකට මාර්ගය සලසාගනී. එක තැනක වෙසෙන සංඝයාට ධර්මයට නැඹුරු වී තමන් හැදෑරූ දහම සෙස්සන්ට වටහාදීම මහා කුසලයකි. අයහපත් මිනිසුන් යහමගට ගැනීම ද එක්තරා ක්‍රියාවලියකි.

මේ කාල වකවානුවේදී සඟරුවනට ඇපළුපස්ථාන කිරීමෙන් නිවනට මාර්ගය පාදාගනී. ශ්‍රද්ධා සිතින් යුතුව දිවි පෙවෙත සකස් කරගැනීමට ද මේ වකවානුව ඉවහල් වේ.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පන්සියයක් රහතන් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රථම සංගායනාව ආරම්භ කරන ලද්දේ නිකිණි පෝදාක ය.

ආනන්ද හිමියන් රහත් වූයේ ද නිකිණි පුන් පොහෝදාක ය. ධර්ම සංගායනාවට ප්‍රථම රාත්‍රියේ උන් වහන්සේ බොහෝ වේලාවක් විදසුන් වඩා සක්මනින් කාලය ගත කළත් අධිගමයන් ලබාගන්නට සමත් නො වූහ; වීර්ය සමතාව නොලැබ ශරීරය සෑතු ගැන්වීම උදෙසා අලුයම සක්මන් මළුවෙන් බැස පා දොවා විහාරයට වැද මඳක් විවේක ගෙන විඩා සංසිඳුවා සිරුර යහනට එළවූහ. දෙපා පොළොවෙන් ඉස්සී ගිය කොට්ටයට නොතබා සිටි අවස්ථාවේදී ආනන්ද හිමියන් සියලු කෙලෙසුන් නසා රහත් විය. සිවු ඉරියව්වෙන් තොරව සිදුවීම සුවිශේෂත්වයකි.

නිකිණි පුන් පොහොය දින වෙනත් පොහොය දින මෙන් සිද්ධි සමුදායක් සිදු නොවුණ ද පුද්ගලයාගේ සසර ගමන කෙටි කරගැනීමට සිත එකඟ කරගෙන මෝක්ෂ මාර්ගයකට පිවිසීමට හේතු භූත වන කරුණු සමුදායයකට මේ පොහොය දිනදී දොරටු විවර විය.

සත්ත්වයා තම ජීවිතය කෙරෙහි ගැඹුරින් බැලීමට හේතුකාරක වන නිකිණි පුන් පොහොය සමයේ සිත පහදාගෙන පිරිසුදු ජල

ප්‍රවාහයක් ළගට සේන්දු වී ජීවිතයේ අනිත්‍ය-දුක්ඛ-අනාත්ම යන තිලකුණු මෙනෙහි කිරීමට ද සුදුසු ය. සඟරුවනේ බණ ජීවිතයට බද්ධකොට ගැනීමට ද නිකිණි පුන් පොහොය යොදාගන්නේ ප්‍රඥාවන්තයෝ ය.

බුදුසමය ප්‍රඥාවන්තයට පමණි. මෝහයෙන් අන්ධ වූ මුළා වූ අයට එම දහමෙන් ඵලක් නොමැත. එබැවින් පිරිසුදු සිතක් පහදාගෙන තමන්ට මෙන් ම අනුන්ට ද සෙතක් වන සේ ජීවිතය සකසාගැනීමට කේන්ද්‍රීය තැන්නක් ලෙස නිකිණි පුන් පොහොය හැඳින්වීම හැම අතින් ම උචිත ය.

## වැදගත් සිදුවීම්

1) වස්සාන කාලය එළඹීම - පසුවස් එළඹීමට අනුදන වැදෑරීම.
2) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් රහතන් වහන්සේ විසින් ප්‍රථම සංගීතිය පැවැත්වීම.
3) ආනන්ද හිමියන්ගේ රහත් වීම.

## තෘෂ්ණාව තුනී කරන්නට ඉවහල් වන

# බිනර පුන් පොහොය

වස් සමයේ එළඹෙන බිනර පුන් පොහොය ජීවිතයේ යථාර්ථය තේරුම් බේරුම් කරගැනීමට ඉවහල් වන්නකි. වස් කාලයේ උදේ-හවා දායක-දායිකාවන් පන්සලට ගොස් මහා සංඝරත්නයේ ඕනෑඑපාකම් විමසා බලා ඒ අඩුපාඩු සපුරාලීමට ගන්නා වෙහෙස අගය කළ යුතු ය.

නික්ලේශි ජීවිතයක් අරඹන්නට ජනකාය පොලඹවන පොහොය ලෙස ද බිනර පොහොය හැඳින්විය හැකි ය. කෙලෙස් බරින් විනිර්මුක්ත වූ ජනකාය එම කරට ගත් බර පහ ව යන්නට සිත එක් අරමුණක තබාගත යුතු ය. මෙයට අතිශයින් ම ඉවහල් වන්නේ මහා සංඝරත්නය, බුද්ධ ධර්මය හා පන්සල යි. මේ ත්‍රිකය මනා ලෙස පරිශීලනය කරන්නේ නම් අපට මේ බරින් නිදහස් විය හැකිය.

වස් කාලයේදී ආරාමවලින්, ලෙන්වලින්, වනසෙනසුන්වලින් බැහැර නොයන මහා සංඝරත්නය විසින් ඒ කාලයේදී ශාසනික ආගමික භාෂාමය හා සාහිත්‍යමය වශයෙන් විශාල මෙහෙවරක් සිදු කරනු ලැබේ. එදා අපේ යතිවරුන්ගේ අතින් ධර්ම ග්‍රන්ථ බහුල වශයෙන් බිහි වූයේ බිනර සමයේදී ය. සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, සද්ධර්මාලංකාරය, ජාතක පොත වැනි සම්භාව්‍ය ගණයට ගැනෙන ධර්ම ග්‍රන්ථ ලියන ලද්දේ බිනර මහේදී ය.

බිනර පොහොය ඓතිහාසික සිද්ධි සමුදායකින් උපලක්ෂිත නොවුව ද මුළු මහත් බුද්ධ ධර්මය කෙරෙහි ජනකාය යොමු කිරීමට යොදාගත් පොහොයක් හා මාසයක් ලෙස ද සඳහන් කළ හැකි ය.

සමාජයේ බොහෝ අය ධර්මය දැන සිටිය ද එය යථාර්ථවාදී ලෙස අධ්‍යයනය කරන අය අඩු ය. ජීවිතයෙන් ගොඩ වන්නට බුද්ධ ධර්මය නමැති ඔසුව බුදුරදුන් අපට දී ඇත. එම විමුක්ති මාර්ගයේ ගමන් කොට පරක් තෙරක් නැති මේ සංසාරය නමැති ජීවිතයෙන් එතෙර විය යුතු ය. එසේ එතෙර වන්නට සිතට ගත යුතු ය. මෙහිදී වැදගත් වන්නේ ආමිස පූජාව නොව ප්‍රතිපත්ති පූජාව යි. සමාජයේ බොහෝ දෙනා අතර ඇත්තේ ආමිස පූජාව යි. ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කරන අය දක්නට ලැබෙන්නේ සුළු වශයෙනි; අල්ප වශයෙනි.

මෙතැනදී සත්පුරුෂභාවය ඉතා ම වැදගත් වේ. ප්‍රිය වදන් තෙපලීම ජීවිතයට ආහාරයක් බඳුයි. සුගත යනුවෙන් බුදුරදුන් හැඳින්වූයේ සොඳුරු බස් තෙපලන නිසා ය. යමක් දෙන්නට පෙරාතුව එම පුද්ගලයා සමඟ කතා කළ යුතු ය. එම කතාව එසේ නැත්නම් එම වදන් පෙළ ආහාරයට වඩා ශ්‍රේෂ්ඨ ය. මිහිරි වදන් නිතරම තෙපලන්නට අප පුරුදු විය යුතු යි.

*යහපත් කොට යෙතැ යි*
*සුන්දර තැනට සැපතැ යි*
*සොඳුරු බස් කියතැ යි*
*කියති ඒ මුනි රජුට සුගතැ යි*

(බුදුගුණාලංකාරය - 265 කවිය)

බුදුගුණාලංකාරකරුවා සුන්දර බස් තෙපලන බුදුරදුන් දුටුවේ එසේ ය. අපට සොඳුරු බස් තෙපලන්නට බැරි ඇයි? තෙපලිය හැකි ය. එහෙත් අපට එසේ කරන්නට උවමනාවක් නොමැත. එසේ කළ යුතු යැයි සිත පහදාගන්නේ ද නැත. වරක් කතා කළ පමණින් යළි යළිත් ඔහු හෝ ඇය සමග කතා කරන්නට අපි පුරුදු වී සිටිමු. ඔහුට හෝ ඇයට යන්නට ඉඩ දී අප පුන පුනා ඔහු හෝ ඇය සමග කතා කරන්නට පෙලඹෙන්නේ එම සොඳුරු බස් හේතුකොටගෙන ය. බුදුරදුන් සමඟ සැදැහැවතුන් සැදැහැවතියන් යළි යළිත් කතාකරන්නට පෙලඹුණේ ද සොඳුරු බස් හේතුකොට ගෙනය.

සොඳුරු වදන් ආකර්ෂණීය ය; සුන්දර ය; සුකොමළ ය; රසවත් ය; ළෙන්ගතු ය. පුද්ගලයෙකුට තවත් පුද්ගලයෙකු බද්ධ

වන්නේ ඇයි? සොඳුරු බස් නිසා ය. මෙහි තවත් පැත්තක් තිබේ. යමෙක් රළු, කටුක, කර්කෂ, දඩබ්බර වදන් තෙපලන්නේ නම් එම පුද්ගලයා සමාජයෙන් කොන් වේ. ඔහුට හෝ ඇයට ප්‍රියභාවයක් දක්වන්නේ නැත. එම පුද්ගලයාට යන්නට ඉඩ දී පුන පුනා බලන්නේ නැත. අප්‍රසන්න පිළිකුල් ස්වාභාවයක් නිසා ඇසුරෙන් ඈත් වේ. සිත් පාරන්නට වදන්වලට හැකියාවක් ශක්තියක් ඇත. එමෙන් ම සිත් සනසන්නට වදන්වලට පුළුවන. අප නැඹුරු විය යුත්තේ ඒ පැත්තට ය.

පටාචාරා, කිසාගෝතමී, රජ්ජුමාලා, සෝපාක, අංගුලිමාල බඳු අයට ශාන්තිය ගෙන දුන්නේ සොඳුරු බස්වලිනි. කටුක රළු වදන්වලින් ප්‍රතිචාර දැක්වූයේ නම් එම ජීවිතවලට ආලෝකයක් සහන් එළියක් ඇති කළ හැකි ද? ඇතිවන්නේ ද නැත.

ක්‍රියාව (Action) හා ප්‍රතික්‍රියාව (Re-action) යන අංග දෙකක් තිබේ. යමකු හොඳ දෙයක් කළා නම් එහි ප්‍රතික්‍රියාව යහපත් වේ. එමෙන් ම නරකක් කළා නම් එයට ද ප්‍රතික්‍රියාවක් ඇත. නිතර ම ක්‍රියාව යහපත් විය යුතු ය. තත්ත්වය එසේ නම් ප්‍රතිඵලය යහපත් වේ. ***බොල් වපුරා සරු අස්වැන්නක් ලැබිය නොහැකි ය. බොල් වැපිරුව හොත් එහි ඵලය වල් පැළෑටි ය. එහෙත් සරු බීජ වැපුරුවා නම් සරු අස්වැන්නක් නෙළාගත හැකි ය. මෙයයි යථාර්ථය. අප නිතර ම යොමු විය යුත්තේ හොඳ දෙයක් කිරීමට ය.***

පන්සල් පරිශ්‍රයට හැම තරාතිරක ම මිනිස්සු පැමිණෙති. රජවරු, මැති ඇමැතිවරු, ධනවතුන්, දුප්පතුන්, කුලීනයන්, කුලහීනයන්, රූවැතියන්, විරූපියයන් ආදි හැම දෙනෙක් ම මෙතැනට පැමිණෙති. එසේ පැමිණීමෙන් සිදු වන්නේ එක ම ජනකායක් වර්ගීකරණයෙන් තොරව සමානාත්මතා දහම ඉස්මතු වීම යි. එවිට අත්තුක්කංසනය (තමා නැගී සිටීමේ ආශාව) අධිමමංකාරය (තමා සෙස්සන්ට වඩා ඉහළය යන මානය) පරවම්භනය (සෙස්සන් නිර්දය ලෙස ගැරහීමේ ස්වරූපය) මේ වස්සාන සමයේදී පන්සලෙන් සිදු කරන්නේත් මේ ටික ම ය. බුදුරදුන් එදා සිදු කෙළේත් මෙය ම ය.

එදා බිනර සමයේ බුදුරදුන් ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුරයෙහි නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන සමයෙහි මහා ප්‍රජාපතී ගෝතමීය බුදුරදුන් වෙත පැමිණ අනගාරික ශාසනයෙහි පැවිද්ද

මාගමුන් හට ඉල්ලා සිටියා ය. එම ඉල්ලීම තෙවැනි වරටත් බුදුරදුහු ප්‍රතික්ෂේප කෙළෝ ය. මෙයින් නොනැවතුණු මහා ප්‍රජාපතී ගෝතමී පැවිද්ද ලත් කුමරුවන් පන්සිය දෙනාගේ බිසෝවරුන් සමඟ යොදුන් පනස් එකක් පමණ දුරැකතර ගෙවා යළිත් බුදුරදුන් වෙත පැමිණ පැවිද්ද ඉල්ලා සිටියහ. කතුන්ට පැවිද්ද නොදෙන බව කියා දොරටුව අබියස හඬාවැටෙමින් ආනන්ද හිමියන්ට මේ දුක්ගැනවිල්ල කියා සිටියා ය. ආනන්ද හිමියන් කතුන්ට පැවිද්ද ලබාදෙන ලෙස ඉල්ලා සිටිය ද එය ද තෙරවක් ම ප්‍රතික්ෂේප විය. එහෙත් ආනන්ද හිමියන්ගේ බලවත් ප්‍රයත්නය නිසා ම කතුන්ට සසුන් දොර විවර විය. ඉතින්, මහා ප්‍රජාපතී ගෝතමී පැවිදි වනු කැමැති නම් පෙර බුදුවරුන්ගේ ශ්‍රාවිකාවන් පිරූ අෂ්ට ගරුධර්ම පිරිය යුතු බව දැන් වූ හ. එයම ඇයට පැවිද්ද හා උපසම්පදාව වන්නේ යයි ද කීවෝ ය.

## ගරු ධර්ම අට

1) උපසම්පත්තියෙන් වස් සියයක් වූ මෙහෙණක විසින් වුව ද එදින ම උපසපන් භික්ෂුවක දැක, වැඳීම් ආදි ගෞරව දැක්විය යුතු ය.
2) භික්ෂූන් නොමැති ප්‍රදේශයන්හි මෙහෙණක වස් නොවැසිය යුතු ය.
3) අඩ මසක් පාසා මෙහෙණක විසින් භික්ෂු සංඝයාගෙන් පොහොය විචාළ යුතුයි. අවවාද දීමට පැමිණීම ද බලාපොරොත්තු විය යුතු යි.
4) වස් අවසානයේදී භික්ෂු-භික්ෂුණී යන උභතො සංඝයා ඉදිරියේ පවාරණය කටයුතුයි.
5) ගරු ඇවතකට පැමිණි මෙහෙණක විසින් උභතො සංඝයා කෙරෙහි අඩ මසක් මානත් පිරිය යුතුයි.
6) අවුරුද්දක් පුහුණුවෙමින් ශික්ෂ මානවිකාවක්ව සිට පසුව උභතො සංඝයාගෙන් උපසම්පදාව ලැබිය යුතු ය.
7) කවර කාරණයක් නිසා හෝ මෙහෙණක විසින් භික්ෂු කෙනෙකු හට ආක්‍රෝස පරිභව නොකට යුතු ය.
8) මෙහෙණියක විසින් භික්ෂූන් හට අවවාද නොකටයුතු ය. භික්ෂූන් විසින් භික්ෂුණීන්ට අවවාද කටයුතු යි.

ආනන්ද හිමියන් මේ ගරු ධර්ම අට ප්‍රජාපතී ගෝතමී හට කීමෙන් අනතුරුව එය එසේ පිළිගත්තා සේ ම පිළිපදින්නේ යයි ද කීමෙන් අනතුරුව, පස්වනක් ප්‍රීතියෙන් යුතුව පිනා ගොස් පන්සියයක් දෙනා සමඟ ප්‍රීති වූයේ, යම් පුරුෂයෙකු හෝ ස්ත්‍රියක ජල ස්නානය කොට සමන් මල් දමක් දෝතින් ගෙන සිරසෙහි තබාගන්නා පරිද්දෙනි. එබැවින් මෙහෙන සස්නේ ආරම්භය වූයේ ද බිනර පුන් පෝ දා ය.

මහා ප්‍රජාපති ගෝතමියට මෙවන් තත්ත්වයක් උදා වූයේ සොඳුරු වදන් නිසා ය. බුදුරදුන් මෙහෙණි සස්න දීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ බුදුරදුන්ට බැණ වැදී නිර්දය ලෙස අපහාස කළා නම් මෙහෙණි සස්නක් එදා ඇති වේ ද? ඒ සියල්ල ඉවසීමෙන් යුතුව විඳ දරාගෙන තවදුරටත් සොඳුරු බස් තෙපලමින් ආනන්ද හිමියන් ළඟට ගොස් ඉතා බැගෑපත්ව නිහතමානී අයුරින් ස්වකීය අභිප්‍රාය අරමුණ සපුරාගැනීමට හැකි වූයේ සුන්දර වදන් නිසා බව අප අමතක නොකළ යුතු ය.

මේ බිනර පුන් පොහෝ දා අපට ඉටාගැනීමට බොහෝ දේ තිබේ. බුදුසමයට අනුව යම් පුද්ගලයෙකු නිවන් දකින තාක් සංසාරයේ සැරිසරයි. එයට අපි අනාත්මවාදය යැයි කියමු. අපට අවශ්‍ය වන්නේ මේ තත්ත්වයෙන් මිදෙන්නට ය. එයට මූලික වශයෙන් අප කෙරෙහි ප්‍රඥාව ඇති කොටගෙන භව තණ්හාව දුරු කළ යුතු ය. යමකට ඇති ඇල්ම තුනී කළයුතු ය. මෙය ඉතා අපහසු දෙයක් වුව ද ප්‍රඥාව ඇත් නම් තවත් අතකින් සරල කාර්යයකි. බුදුරදුන් කියා සිටියේ මගේ ධර්මය ප්‍රඥාවන්තයන්ට පමණි යන්නයි. වස් සමයේ යහපත් සිතිවිලි ඇති කරගන්නට, ජනිත කරගන්නට බිනර පුන් පොහොය හොඳ ම කඩඉමකි; ප්‍රවේශයකි. යහපත් නිමිත්තක් පදනම් කරගෙන ජීවිතයෙන් එතෙර වන්නට අප නිරන්තරයෙන් ම මාන බැලිය යුතු ය.

මෙහිදී අප අවධාරණයෙන් කියන්නේ දෙන්න යන්න යි. දීමෙන් අපේ සිත සැහැල්ලු වේ. තෘෂ්ණාවෙන් වන්නේ සිත තවදුරටත් බර වීම යි. හිස මත බරක් පොදි බැඳගෙන යන ගමන අපට මහා දුකකි. ඒ නිසා ම තමන්ට හැකි පමණින් ශක්ති ප්‍රමාණයෙන් දෙන්න. දෙනකොට තව තවත් ලැබෙනවා යැයි කියමනක් තිබේ. අපට

බුදුරදුන් බිනර පුන් පොහෝදා ශාසනයට මෙහෙණි ශස්නක් දීමෙන් පෙන්නුම් කෙළේත් ඒ පරමාදර්ශය යි.

ගැඹුරු වූ ජලය නිසල වන්නේ යම් සේ ද, ගැඹුරු ජීවිතයත් එසේ ම යි. තමන්ගේ ජීවිතය පිළිබඳ විමර්ශනයක් කරන්නට එම ජීවිතය හොඳ ම කැඩපතකි. එම ජීවිතය විමසා බලන්නේ ඔබ නොව සමාජයේ සෙස්සන් ය. හොඳ-නරක සම්බන්ධයෙන් විනිශ්චයක් කරන්නේ ඔබේ පැවැත්ම පරිදි ය.

ඉතා ම සන්සුන් සංවේදී ජීවිතයකට ධර්මය ආකරයකි. ධර්මයෙහි නිතර හැසිරෙන්නා තමන්ට මෙන් ම අන් අයට ද යහපති. ආත්මාර්ථය පසෙකට තල්ලු කොට පරාර්ථය උදෙසා යමකු කටයුතු කරන්නේ නම් එම පුද්ගලයා මෙලොවට හා පරලොවට වැඩදායක ය. තමාට මෙන් ම සෙස්සන්ටත් කරුණාවෙන් යුතුව කටයුතු කිරීම ප්‍රියජනක ය. එමෙන් ම තමන්ට සතුටට ද පත් විය හැකි ය. මේ බිනර පුන් පොහෝ දා ඔබේ පරම අදිටන විය යුත්තේ ද එය යි.

---

**වැදගත් සිදුවීම්**

1) මහා ප්‍රජාපති ගෝතමී ඇතුළු පන්සියයක් කාන්තාවන්ට පැවිද්ද හා උපසම්පදාව ලබාදීම.
2) ඒ සඳහා ගරු ධර්ම අටක් පැනවීම.
3) ලලාට ධාතුව තැන්පත් කර සාදන ලද සේරුවාවිල මංගල මහා සෑයේ වාර්ෂික පින්කම
4) ගිරිහඬු සෑයේ වාර්ෂික උත්සවය පැවැත්වීම.

## ජීවිතය විවරණය කරන හොඳ හා නරක වටහා දෙන

# වප් පුන් පොහොය

දො දොළොස් පොහොය අතර වප් පොහොය සුවිශේෂ වන්නේ එය චීවර මාසය නමින් හඳුන්වන බැවිනි. වස්සාන සමය ගෙවී ගොස් චීවර පූජාව සිදු කරන්නේ වප් පොහෝ දින සිටදී ය. චීවර මාසයෙහි වස් විසූ හැම ආරාමයකම වස් පින්කම් පැවැත්වේ. වප් පොහොයේ සිට ඉල් පොහොය දක්වා වස් පින්කම් පැවැත්වේ. පරිවාර පාලියෙහි එය මෙසේ සඳහන් වේ:

කඨිනස්ස අත්ථාරමාසො
ජානිතබ්බොති වස්සානස්ස
පච්ඡිමො මාසො ජානිතබ්බෝ

යනුවෙන් වස්සාන ඍතුවේ අවසාන මාසය කඨිනාන්තර කාලය වශයෙන් දැනගත යුතු ය යි වදාරා තිබේ.

වප් පොහොයේ සාකේත නුවර වස් එළඹ මහා පවාරණයෙන් පවාරණය කොට බුදුරදුන් දැකීමේ අටියෙන් පැමිණි මහා සඟරුවන අතරමගදී මහා වැස්සකට තෙමීමෙන් දියෙන් පෙඟුණු සිවුරුවලින් යුතුව ක්ලාන්ත ස්වරූපයෙන් බුදුරදුන් වෙත එළඹුණි. සඟරුවනට සිදු වූ මේ දුෂ්කරතාවල අකරතැබ්බය අසා සහනයක් සලසා දීම් වස් ''අනුජානාමි භික්ඛවේ වස්සං වුත්ථානං භික්ඛූනං කඨිනං අත්ථරිතුං'' යනුවෙන් 'මහණෙනි වස් වැස නිම කළ භික්ෂූන්ට කඨින ඇතිරීම අනුදනිමි' යි භික්ෂූන් වහන්සේලාට පඤ්චානිසංස ලැබෙන්නා වූ කඨිනාස්තරණය විනය කර්මය අනුදැන වදාළහ.

එතැන් සිට භික්ෂූන්ට කඨින සිවුරු පරිභෝග කිරීමට අවස්ථාව ලැබිණි.

වස්සාන සමයේ වඩාත් යහපත් දිවි පෙවෙතකට මාර්ගය පාදාගන්නට මං සැලසෙන්නේ සැදැහැවතුන් සහ පන්සල අතර පවතින සමාන්තර හා සමගාමී තත්ත්වය හේතු කොටගෙන ය. මෙහිදී වඩාත් ජීවිතයට බද්ධ වන්නේ සමීප වන්නේ හොඳ ය.

හොඳ යන වචනයේ ප්‍රතිවිරුද්ධ වදන නරක ය. නරක මතු නොවීමටත් හොඳ මතුකිරීමටත් අප වගබලාගත යුතු ය. හොඳ යන්නට නිර්වචනය කරන්නට යත්න දැරූ ශාස්තෘවරුන් අතර බුදුරදුන්ට (ක්‍රිːපූː 563 - ක්‍රිːපූ 483) ලැබෙන්නේ වෙසෙස් තැනකි. මෙහි මතුපිටින් සරලාර්ථයක් ගෙන දුන්න ද එහි ඇතුළාන්තය පෘථුල ය. මෙය බෞද්ධ සාහිත්‍යයේ මජ්ඣිම නිකායේ අම්බලට්ඨිකා, රාහුලෝවාද වැනි සූත්‍රවල හා ධම්මසංගනියෙහි විශේෂයෙන් සාකච්ඡා කොට ඇත.

හොඳ පිළිබඳ සියලු නිර්වචන පුළුල් වශයෙන් අංශ දෙකකට බෙදනු ලැබේ. (1) පුද්ගල නිඃශ්‍රිත (Subjective) (2) විෂය නිශ්‍රිත (වාස්තවික) (Objectivive) යනුවෙනි. හොඳ පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී බුදුරදුන් මුල් තැන ගනී. ඉන් අනතුරුව ග්‍රීක චින්තකයෝ අනෙකුත් ප්‍රස්තුතයන් ගැන මෙන් ම හොඳ දෙය ද වාස්තවික නිරීක්ෂණයට යෝග්‍ය විෂයයක් ලෙස බැලූහ.

මිනිසා (පුහුදුන්) බොහෝ විට පෙලඹෙන්නේ හොඳට වඩා නරකට ය. මිනිසාට හොඳට නැත් නම් යහපතට නැඹුරු වීම ඉතා ම අපහසු ය. නරකට යොමු වීම නම් ඉතා ම පහසු ය. එලදායී පැළෑටියක් වර්ධනය කරගැනීමට අපි කොතරම් වෙහෙසක් ගනිමු ද? එහෙත් නරක, එල ප්‍රයෝජනයට ගත නොහැකි පැළෑටි කිසිදු ආයාසයකින් තොරව වැඩේ, හොඳ හා නරක විනිශ්චයයේදී මෙය හොඳ ම නිදසුනකි.

බුදුරදුහු විෂය නිශ්‍රිත නිර්වචනය ශික්ෂණය සඳහා අදාළ නොවෙතැයි සිතූහ. හොඳ පිළිබඳව ප්‍රායෝගික සංකල්පනා පදනම් කොට ගෙන නිශ්චය කොට තිබේ. හොඳ හා නරක යන සංකල්ප වෙනුවෙන් බෞද්ධයන් යොදන වචන කුසල හා අකුසල යන්න යි.

නූපන් කුසල් උපදවාගැනීමටත්, උපන් කුසල් වැඩිදියුණු කරගැනීමටත්, උපන් අකුසල් නැති කරගැනීමටත්, තවදුරටත් අකුසල් නූපදවාගැනීමටත් ප්‍රායෝගික වශයෙන් අප සිහි තබාගත යුතු ය. මේ චතුර්අංග කෙරෙහි අපගේ අවධානය නිතැතින් ම යොමු විය යුතු ය.

පුද්ගලයාට හොඳ හා නරක විනිශ්චයට ප්‍රඥාව අතිශයින් ම අවශ්‍ය වේ. ප්‍රඥාව නොමැතිව මේ ගමන යා නොහැකි ය. කුමක් ද මේ ගමන? සංසාර චක්‍රය නමැති ගමනයි. එම ගමන කෙළවර වන්නේ අවසන් වන්නේ නිවන් මග සොයාගැනීමෙනි. මේ වප් පොහොය ඊට යහපත් භූමිකාවක් තනයි. යම් යම් දෑ කෙරෙහි පවත්නා ඇල්ම මේ ගමන දිගු වීමට හේතුභූත වේ. ගමන කෙටි කරගැනීමට ඉවහල් වන හොඳ නැත් නම් කුසල් සිත වඩාත් පරිපාකයට පත් කරගත යුතු ය.

මේ කුසල යන්නට බුදුරදුන් අතිශය වැදගත් පෙළ පාඨයන් අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රයෙහි දක්වා ඇත. එහිදී තථාගතයන් වහන්සේ හොඳ හෙවත් කුසල ගැන තම අදහස් රාහුල හිමියන්ට පවසති. එහි පාඨය මෙසේ යඃ "රාහුල, ඔබ කුමක් සිතන්නෙහි ද? කැටපතෙහි ප්‍රයෝජනය කුමක්ද?" "ප්‍රත්‍යවෙක්ෂණයටයි ස්වාමිනී. "

ඒ අයුරින් ම ඔබ සැම ක්‍රියාවක් කරන විට ම සැම වචනයක් පවසන විට ම සැම සිතුවිල්ලක් සිතන විට ම නැවත නැවත ප්‍රත්‍යවෙක්ෂණය කළ යුතු ය. ඔබට යමක් කරන්නට උවමනා වූ විට එය තමාගේ හෝ අනුන්ගේ හෝ උභය පක්ෂයේ ම හෝ විපතට හේතු වේ ද? දුක් ඇති කරන දුක් බවට පෙරළෙන සාවද්‍ය ක්‍රියාවක් - අකුසලයක් වෙයි ද යනු ප්‍රත්‍යවෙක්ෂණය කළ යුතු ය. ප්‍රත්‍යවෙක්ෂණයෙන් එය එසේ යයි වැටහෙයි නම් ඒකාන්තයෙන් ම ඔබ එය නොකළ යුතු ය. එහෙත් ප්‍රත්‍යවෙක්ෂණයෙන් එය දුක් පිණිස නොව සුව පිණිස පවතී ය යි ස්ථිර වෙයි නම් ඔබ එය කළාට වරදක් නැත.

බුදුරදුන් කාලාම කුමරුන්ට හොඳ දෙය තෝරා බේරාගන්නේ කෙසේ ද යන්න මෙසේ ප්‍රකාශ කොට ඇත. මගේ ධර්මය වාර්තාවක් පදනම් කරගෙන හෝ පාරම්පරිකව විශ්වාසය මත හෝ පොත පතෙහි මෙසේ තිබුණු පලියට හෝ තර්කයට ගැළපෙන නිසා හෝ

කිසියම් න්‍යායකට ගැළපෙන නිසා හෝ කල්පනාවට අනුරූප නිසා හෝ ආචාර්යවරයාට ගරු කරන නිසා හෝ නොපිළිගත යුතු ය. ඔබට මෙය කුසල් ය, මෙය නිවැරැදි ය, මෙය පිළිගත් විට සුබ සිද්ධිය හා සැපය පිණිස පවතින නිසා වැටහේ නම් පිළිගන්නා ලෙස ය.

මේ දෘෂ්ටිය කිසිම ආගමකින් දක්නට නොලැබේ හොඳ හා නරක හැඳින්වීම උදෙසා පොදුවේ භාවිත කළ වදන් දෙක නම් කුසල හා අකුසලයි. කුසල යන්නෙන් අදහස් කරන්නේ දක්ෂ, නිපුණ, ප්‍රවීණ, හොඳ, හා පුණ්‍ය සහ අර්ථය ය.

හොඳ වදන් වහරන්න, භාවිත කරන්න. හොඳ වචන ප්‍රකාශ කරන පුද්ගලයාට සියලු දෙනා ම කැමැති ය. සුවඳ මල්වලට බමරුන් රොන් සොයා යන්නා සේ හොඳ නැත් නම් යහපත් වදන් භාවිත කරන පුද්ගලයා කෙරෙහි ආකර්ෂණීය බවක් මතු වේ.

එමෙන් ම නරක වදන් වහරන පුද්ගලයාට ජනතාව කැමැති නැත. අප්‍රසන්න ය. දුගඳ හමන පුෂ්පයක් බඳු ය. නරක විනිශ්චය කිරීමේදී අභාවිත, අයහපත්, අමනෝඥ, අපරිණත ආදි වශයෙන් විමර්ශනයට බඳුන් වේ. හොඳ විමසුමට ලක් වන්නේ යහපත මනෝඥ පරිණත ආදි වශයෙනි.

හොඳ ක්‍රියාව නම් දුසිරිතෙන් තොර හා සියල්ලන්ට යහපත පිණිස හේතු වන ක්‍රියා යි. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි හොඳ යන්නට නිශ්චය කරන්නේ එපරිද්දෙනි.

බුද්ධ ඝෝෂ හිමියන් තම ධර්ම සංගනී අටුවාවෙහි හොඳ යන්නට අර්ථ සතරක් දක්වයි.

1. ආරෝග්‍ය 2. නිරවද්‍ය
3. දක්ෂ (කුසල) 4. සෞභාග්‍ය යන්නයි.

මේ වස්සාන සමයෙහි පුද්ගලයා කෙරෙහි පිරිසුදු සිතක් ඇති කරගැනීමට නම් හොඳ යන වදනට නිරන්තරයෙන් ම නැඹුරු විය යුතු ය. බුදුසමයේ මෙය විශ්ලේෂිත වන්නේ කුසල් යන්නයි. කුසල් සිත පරහට සේවය කිරීම ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' සියල්ලට ම මූලික වන්නේ පිරිසුදු චේතනාව යි. චේතනාව යහපත් නැත් නම් එහි ඵලය ද හීන වේ; අපිරිසුදු වේ.

නිරන්තරයෙන් ම සෙස්සන්ට උදවු කිරීමට අප සිතට ගත යුතුය. පර හට උදවු කිරීම අපට සතුටට හේතුවකි. ඒ අනුව නිතර ම අපට සතුටු විය හැකි ය. අන් අයගේ දැවලින් තමන්ගේ මල්ල පුරවාගන්නට දරන තැත බැහැර කොට තමන්ගේ මල්ලෙන් අන් අයට උදවු කිරීම පරමාර්ථකොට ගත යුතු ය. වස්සාන සමයේ පින්වත් හිතකාමී කුසලයට පමණක් නැඹුරු වූ අය සිතට ගත යුත්තේ ඒ ටිකම ය.

තව ද වප් පුන් පොහෝ දා දේවාරෝහණ මහා උත්සවය දැකීමෙන් පැහැදුණු අප්‍රමාණ හිත ජන සමූහයා බුදු බව පැතුහ. ඒ අය අතරින් බොහෝ දෙනෙක් ශාසනයේ පැවිද්ද ලැබූහ. ඊට සමගාමීව සැරියුත් හිමියන් හා බුදුරදුන් අතර ඇති වූ ප්‍රශ්න විසර්ජනයට සවන් දී සිටි මෛත්‍රිය බෝධි සත්ත්වයන් වහන්සේ ඉමහත් ප්‍රසාදයට පත් ව පැවිදි වූහ. සොළොස් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මතුයෙහි ලොව්තුරා බුදු බවට පත් වන මෛත්‍රිය බෝධි සත්ත්වයන් පැවිදි වූයේ ද වප් පුන් පොහෝදාක ය.

දම් සෝ නිරිඳුන් හමු වීම උදෙසා ලංකාවෙන් දූත පිරිසක් දඹදිවට යවන ලද්දේත් වප් පුන් පොහෝදාක ය. ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාවක් ලක්දිවට ගෙන ඒමටත් වප් පුන් පොහොය ඉවහල් විය. ප්‍රස්තුත විය.

අනුබුදු මිහිඳු මා හිමියන් ලක්දිවට වැඩමවා ථූපාරාමයේ භික්ෂූන් සමඟ විනය සංගායනාවක් පැවැත්වූයේ ද වප් පුන් පෝදාක ය. මෙසේ විනය සංගායනාවක් පවත්වා සමාජයේ යහපතට සිදු කළ මෙහෙවර දෙස අප යළිත් අවලෝකනයක යෙදීමට කාලයයි මේ. සමාජය පුරා ශාසනික ප්‍රබෝධයක් ජනිත කිරීමට වප් පුන් පොහොය උපස්තම්භකවූයෙන් මහා වන ළැහැබ එළි පෙහෙළි වී සංඝාරාම ඇති වීම මත ජනකාය සඟරුවන හමුවට ගොස් ජීවිතයේ යථාර්ථය තේරුම් ගත්හ.

බුදුසමය නොදත් ජනකායට එය තේරුම් ගන්නට සුදුසු අයුරින් වාතාවරණය සැකැසීමට ඉවහල් වූයේ වප් පොහොය යි. පන්හිඳෙන්, පත්ඉරුවල ධර්මය ලියා පොල්තෙල් පහනට ඇඟිල්ලෙන් ඇන ඇන ධර්ම ග්‍රන්ථ ලියන්නට මහ සඟරුවන යොමු වූයේ ද වප් පොහෝ සමයේදී ය. වස් සමයේ එක තැනක වැඩ විසූ යතිවරුන්

ධර්මය දෙසන්නට පුරුදු වූවා සේ ම, ධර්මය පුන පුනා කියන්නට ද තීරණය කරන ලදී. ශ්‍රවණගෝචර රටාවට හුරු වූ ජනකාය අක්ෂිගෝචර රටාව පුරුදු කරන්නට මේ වස්සානය හේතුභූත විය.

ජීවිතයේ පවත්නා ගැඹුර හා එය මෙහෙයවිය යුතු අන්දම උකහාගැනීමට අසීරු සමාජයක හොඳ හා නරක විස්තෘත කිරීම එතරම් පහසු කරුණක් නොවුණි. ඒ උදෙසා දැඩි වෙහෙසක් ගන්නට සඟරුවනට සිදු විය. සමාජය දෙස පුළුල් වූ දෘෂ්ටිකෝණයක පිහිටා බැලීමේ ශක්‍යතාව මත යහපතට සමාජය නැඹුරු විය.

යහපත හා අයහපත වශයෙන් සමාජය වර්ගීකරණයක යෙදෙන විට යහපත ඉස්මතු වී අයහපත යටපත් විය යුතු ය. හොඳ වඩාත් ඉස්මතු විය යුත්තේ එවිට ය. ස්වර්ණ හංසයා කිරෙන් දියර වෙන් කරගන්නා සේ නරක බැහැර කොට හොඳ දෙය උකහා ගන්නට අප පුරුදු විය යුතු ය. (පංකජ) (නෙළුම මඩෙහි හට ගත්ත ද මඩ නොගෑවී මඩෙන් මතු වී නෙළුම වැජඹෙන්නේ යම් සේ ද යහපත් පුද්ගලයා අයහපතෙන් මතු වී සමාජයේ වැජඹේ.

ජීවිතය හා මනුෂ්‍යත්වය එකක් නොව දෙකකි. ජීවිතය කාටත් පොදු ය. එය සර්ව නාමයකි. එහෙත් මනුෂ්‍යත්වය මත යි, ජීවිතය රඳා පවතින්නේ. ජීවිතය ප්‍රභාවිත වන්නේ මිනිස්කම් මතය. මානුෂික ගුණදම්, හැඟීම්, සංවේදී ස්වරූපය, නම්‍යශීලිභාවය යන උත්තම පුරුෂාර්ථ ජීවිතයෙන් මතු විය යුතු ය. නීච පුරුෂාර්ථ ජීවිතයෙන් හැලිය යුතු ය. එහෙත් සමාජයේ බොහෝ අය නීච පුරුෂර්ථවලට ම නැඹුරු වීම හේතුකොට කළුවලාවක රැඳී පැටලී වෙළී ජීවත් වීම ඛේදයකි.

උත්තම පුරුෂාර්ථ මත දිවිගෙවන ජීවිතයට දුර ගමනක් යන්නට සිදු නො වේ. නීච පුරුෂාර්ථවලට ගමන දිගු ය. ප්‍රශස්ත දිවි මඟකට ඔබ සේන්දුවන්නට ඉටාගන්නට වප් පොහොය හොඳ ම භූමිකාවකි. මානුෂික හැඟීම්වලින් පරිපෝෂිත වූ දිවිය සමාජයට පරමාදර්ශී ය. කළුවර පැතුරුණු කාමරයකට ආලෝකයෙන් එම අඳුර දුරලන්නා සේ තමාගේ අඳුරු ජීවිතය යහපත නමැති ආලෝකයෙන් ප්‍රභාවිත කරගත යුතු ය. මේ නිසා ම අනියතය කෙරෙහි පුන පුනා අප

මෙනෙහි කළමනා ය. අඳුරේ ඇලී-ගැලී-වෙළී-පැටලී තවදුරටත් අප දිවි ගෙවනවා ද?

---

## වැදගත් සිදුවීම්

1) වස් වැස නිම කළ භික්ෂූන්ට කඨින චීවර පූජා කිරීම.
2) දේවාරෝහණ මහා උත්සවය දැකීමෙන් පැහැදුණු අප්‍රමාණ ජන සමූහයා බුදුබව පැතීම.
3) මෛත්‍රී බෝධිසත්වයන් පැවිදි වීම.
4) දම් සෝ නිරිඳුන් හමු වීම සඳහා ලංකාවෙන් දූත පිරිසක් යැම.
5) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව සඟමිත් තෙරණිය විසින් ලක්දිවට වැඩම කරවාගෙන ඒම සඳහා සංදේශයක් යැවීම.
6) මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩමවීමෙන් පසු ථූපාරාමයේ භික්ෂූන් සමඟ සංගායනාවක් පැවැත්වීම (විනය පිටක සංගායනාව).

---

# බුදුරදුන්ගේ නිහතමානී ගුණය විදහාපාන
# ඉල් පුන් පොහොය

වස්සාන සමයේදී වඩාත් දහමට නැඹුරු වී, පන්සල තමන්ගේ ජීවිතයේ කේන්ද්‍රස්ථානය කොටගෙන ජීවිතය නමැති දිගු ගමන කෙටි කරගැනීමට අරමුණු කොටගෙන සංවේදී මනසකින් උපයුක්ත වී වස්සානය අවසානයේදී පහන් සංවේග දනවන කඩ ඉමකට පිවිස සිටීම ආනන්දයට හේතුභූත වන්නකි. ජීවිතයේ යථාර්ථය තේරුම් බේරුම් කරගත යුතු ය. බුදු සමයෙන් අපට කියාදෙන්නේ ද එය යි. ප්‍රඥාවන්තයන්ට පමණක් සීමා වූ බුදුසමය, වස්සාන කාලයේ වඩාත් දහමට නැඹුරු වීම මත ත්‍යාගශීලි හදවතකින් මනසකින් පූර්ණවීම ද සුවිශේෂිත සිද්ධියකි.

ඉල් පොහොය සිද්ධි සමුදායයකින් සමලංකෘත වී ඇත. මත්තට බුදු වන්නට සිටින මෛත්‍රෙය බෝධි සත්ත්වයන් වහන්සේ ලැබීම, ප්‍රථම ධර්මදූත පිරිස වන රහතන් වහන්සේ ප්‍රථම ධර්ම ප්‍රචාරය උදෙසා ගමානාරම්භ කිරීම, බුදුරදුන් උරුවේල කාශ්‍යප-ගයා කාශ්‍යප-නදී කාශ්‍යප යන තුන් බෑ ජටිලයන් දමනය කිරීම් වස් උරුවේල දනව්ව බලා වැඩම කිරීම, පසුවස් පවාරණය කළ යුතු දිනය වීම, චීවර මාසයේ අන්තිම පොහොය වීම, කඨිනාස්තරණ විනය කර්මය කළ හැකි අවසාන දිනය වීම, අගසව් සාරිපුත්‍ර මාහිමියන්ගේ පරිනිර්වාණය සිදු වීම යනාදි කරුණු රැසක් සිදු වුණු පොහොය වශයෙන් ඉල් පොහොය සලකනු ලැබේ.

චීවර මාසයේ අන්තයේ චීවර දානයේ අනුසස් දත් මෛත්‍රී බෝසතාණන් වහන්සේ එම වස්ත්‍ර යුගලයෙන් එකක් බුදුරදුන් වැඩ

සිටින ගන්ධ කුටියෙහි වියන් කොට බැඳ බුදුරදුන්ට පූජා කොට මහා සංඝ රත්නය මධ්‍යයේ එකත්පස්ව වැඩ සිටියහ.මෛත්‍රී බෝධිසත්වයන්ගේ මේ උදාර පුණ්‍ය ක්‍රියාව බුදුරදුන්ගේ සර්වඥතා ඥානයෙන් දැක, මේ මහා භද්‍ර කල්පයෙහි ම බුදු වන්නේ යයි විවරණ දෙන ලදී.

"මහණෙනි, මේ මහගු වස්ත්‍ර යුගලයකින් පිදූ මේ භික්ෂුව දෙස බලන්න. මේ තෙමේ මතු මහාභද්‍ර කල්පයෙහි ම බුදු වන්නේ ය. එකල බරණැස් නුවර කේතුමතී නම් රාජධානියක්ව පවතී. එහි 'සංඛ' නම් සක්විති රජෙක් වෙයි. ඔහුගේ පුරෝහිත 'බ්‍රහ්ම' නම් බමුණා මෛත්‍රෙය බුදුරදුන්ගේ පියාණන්දෑ වෙයි. පරෙවි බමුණුහුගේ බිරිය 'බ්‍රහ්මවතී' නම් බැමිණිය මවු වෙයි. නා රුක ඒ මෛත්‍රිය බුදුරදුන්ගේ බෝ රුක් වෙයි."

මතු බුදුවන මෛත්‍රෙය බුදුරදුන් පිළිබඳ විවරණය කරන ලද්දේ ඉල් පොහොය දිනකයි. ගෞතම බුදුරදුන්ගේ සර්වඥතා ඥානයෙන් මත්තට බුදු වන බුදුරදුන් පිළිබඳ විවරණය කිරීම සම්බන්ධයෙන් මහා සංඝරත්නය සාධු නාද පැවැත්වූහ; දෙවියෝ ප්‍රීතියෙන් උද්දාමයට පත් ව දිව මලින් පිදූහ; ජනකාය සැණකෙළි පැවැත්වූහ. මෙවන් අසිරියක් සිදුවූයේ ඉල් පුන් පොහෝදාක ය.

බරණැස ඉසිපතනාරාමයෙහි වස් කාලය ගත කළ බුදුරදුන් වස් පවාරණය කොට ප්‍රථම ධර්ම දූත පිරිස වූ රහතන් වහන්සේ සැට නම අමතා, ''චරථ භික්ඛවේ චාරිකං බහුජන සුඛාය, බහුජන සුඛාය, ලොකානුකම්පාය, අත්ථාය හිතාය, සුඛාය, දේවමනුස්සානං මාකෙනදෙව අගමිත්ථ දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිශුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ'' යනුවෙන්

''මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස ද, බොහෝ දෙනාට සැප පිණිස ද, ලොවට අනුකම්පා පිණිස ද, දෙව් මිනිසුන්ට වැඩ පිණිස ද, හිත පිණිස ද, මිනිසුන්ට වැඩ පිණිස ද, හිත පිණිස ද, සැප පිණිස ද, චාරිකාවෙහි හැසිරෙවු. දෙනමක් එක් මගින් නොයවු. මහණෙනි, මුල මැද අවසන යහපත් වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සම්පත්තියෙන් පරිපූර්ණ වූ ධර්මය දෙසවු. පිරිසුදු වූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරවු'' යි අවවාද දී ධර්මදූත සේවයෙහි යෙදවූයේ ඉල් පෝදාක ය.

බුදුරදුන් අවබෝධ කොටගත් ධර්මය ලෝකයාගේ හිත සුව පිණිස දෙසීමට යොමු කළමනා ය. ඒ නියතයෙහි පිහිටා ක්‍රියා කිරීමට බුදුරදුන් ඉටා ගත්තේ විවිධ දිසාවලට සිය අනුගාමිකයන් යොමුකොට, මෙහි යථාර්ථය ලොවට හෙළි කිරීමට මං පෙත් විවර කිරීමට ය. පුළුල් වූ දෘෂ්ටිකෝණයක පිහිටා සිය මහා ප්‍රඥාව මත පිහිටා හෙළි කළ චින්තනය, දාර්ශනිකත්වය යොදාගත්තේ දුකෙන් වෙළී පැටලී සිටින සියලු සත්ත්වයා දුකෙන් මුදාගැනීමට ය.

කිසියම් දෘෂ්ටියක් විමුක්ති මාර්ගයක් නොමැති ජනයාට බුදුරදුන් හෙළි කළ මාර්ගය අමා දහරක් බඳු විය. මෝහාන්ධකාරයෙන් වැසී සිටි ජනයාට මේ දහම ආලෝකයක් විය. මිථ්‍යා දෘෂ්ටිවලින් වියළි සිටි ජනකායට සිසිලක් විය. යා යුතු මාවත කුමක් ද යන්න තෝරා බේරාගන්නට නොහැකිව සිටි අයට නිසි මාර්ගය හෙළි විය. ඉල් පුන් පොහෝදා සඟ සැට නමක් විවිධ දිසාවලට යොමු කිරීම, මත වනපෙත් එළි පෙහෙළි වී ලෙන් ඉදි වී ධර්ම ප්‍රචාරයට සඟරුවන ව්‍යාප්ත කිරීමට මාර්ගය පෑදුණි.

මේ පුන් පොහෝ දා තවත් වැදගත් සිදුවීමක් සිදු විය. නේරංජනා නදිය සමීපයේ සිටි, උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප හා ගයා කාශ්‍යප යන ජටිල තාපසයන් තිදෙනා වෙසෙන ආරාමයට වැඩම කළ බුදුරදුන් විසින් උරුවේල කාශ්‍යපගේ පන්සියයක් පිරිස ද නදී කාශ්‍යපගේ තුන්සියයක් පිරිස ද ගයා කාශ්‍යපගේ දෙසීයක් පිරිස ද, සමඟ තුන් දහස් පන්සිය සොළොසක් පෙළහර දක්වා උරුවෙල් කාශ්‍යප ඇතුළු පන්සියයක් අතවැසි පිරිස ශාසනයේ පැවිදි කරවන ලදී.

පැවිදි වූ මේ අය ජටා මඩුලු හා තවුස් පිරිකර නේරංජනා නදියෙහි පා කොට යවන ලදී. ගඟෙහි පාවී යන තවුස් පිරිකර දුටු නදී තවුසා ස්වකීය පිරිසට අනතුරක් සිදු වී දැයි සොයා බැලීමෙන් අනතුරුවල සඟ සසුනෙහි පැවිදි වූ පිරිස දැක ගයා තවුසා තමන්ගේ පිරිස ද සමඟ සඟ සසුනට එක් විය. බුදුරදුන් නොබෝ දිනකින් දහසක් ජටිල භික්ෂූන් සමඟ උරුවෙල් දනව්වෙන් නික්ම, ගයා ශීර්ෂයට වැඩම කොට එහිදී ඔවුන්ට ආදිත්ත පරියාය සූත්‍රය දේශනා කොට රහත් ඵලයට පැමිණවූහ.

මිථ්‍යා මතවල එල්බගෙන සිටි ජටිල පිරිස නිසි මාර්ගයට පිවිසවීම විශාල පුණ්‍යකර්මයකි. ජීවිතය යනු කුමක් ද? එම ජීවිතය

මනාව අවබෝධ කොටගෙන නිසි මාර්ගයෙහි යා යුත්තේ කිනම් ධර්මයක් පදනම් කොටගෙන ද? යන්න පහදාදීම මෙයින් සිදු විය. පැළයක් රෝපණය කිරීමෙන් පමණි, එයින් ඵල නෙළාගත හැක්කේ. පැළය රෝපණය කළ පමණින් සාර්ථක ද ඵල නෙළාගත නොහැකි ය. පැළයට පොහොර, ජලය, ස්පර්ශය, හිරු එළිය ආදිය ලැබිය යුතු ය. එවිටයි සරු පැළයක් වී සරු ඵලදාවක් ජනිත වන්නේ.

ජීවිතය ද එසේ මැ යි. ජීවිතය අයාලේ යන්නට ඉඩ කඩ සැලස්වුව හොත් යහපත් දිවි පෙවෙතක් උත්පාද නො වේ. එම ජීවිතයට ප්‍රථමයෙන් ප්‍රඥාව ඇති කරගත යුතු ය. එම ප්‍රඥාව මත තෘෂ්ණාව අත්හළ යුතු ය. ඇලීම නැති කළ යුතු ය. දන්දීමට අප නැඹුරු විය යුතු ය. එවිට ය අපේ ජීවිතයෙන් සරු ඵල නෙළාගත හැකි වන්නේ. සරු ඵල නෙළාගැනීම යනු අප කෙමෙන් නිවනට පිවිසීමකි. මේ පරම සත්‍යය වූ දහම තේරුම් ගැනීමට වස්සාන සමය අවසානයේ වඩාත් පහසු වන්නේ සංවේදි මනසකින් අප උපයුක්ත වුව හොත් පමණි.

බුදුරදුහු පන්සාළිස් වන වස බේලුව ගමෙහි වස් වැස පවාරණය කොට ජේතවනාරාමයට පිවිසුණහ. එවිට ධර්ම සේනාධිපති නැත් නම් ධර්ම භාණ්ඩාගාරික සාරිපුත්ත අග්‍ර ශ්‍රාවකයෝ බුදුරදුන්ට වැදගත් ප්‍රශ්නයක් විචාළෝ ය. බුදුරදුන් පළමුකොට පිරිනිවන් පාන්නේ ද? නැත හොත් අග්‍ර ශ්‍රාවකයෝ පිරිනිවන් පාන්නහු ද යන්නයි.

ප්‍රථමයෙන් අග්‍ර ශ්‍රාවකයන් පිරිනිවන් පාන බව දත් හෙයින් දින හතක් පමණක් ආයු ඇති හෙයින් තමන්ගේ මෑණියන් මාර්ගඵලාවබෝධයට පත් කරනු පිණිස තමන් උපන් ගෙදරට වැඩමවීමට සාරිපුත්ත හිමියෝ සිතූහ. සත් දිනක් පමණක් ජීවත් වන බැවින් එම සත්දින නාලක ගමට යන අතරතුර ජනයාට අනුග්‍රහ දක්වමින් ලෝකාර්ථ චර්යාවෙහි යෙදෙමින් සත්වන දින ඉල් මස වප් පුන් පොහෝදා සන්ධ්‍යා සමයෙහි නාලක ගමට සම්ප්‍රාප්ත වී ගම් දොර නුග රුක් මුල හුන්හ.

සාරිපුත්ත හිමියන්ගේ බෑනා වූ උපරේවත නමැති බ්‍රාහ්මණයා ලවා සිය මෑණියන් වන මිසදිටු සාරි බැමිණියට පණිවුඩයක් යැවී ය. එම පණිවුඩය ලැබීමෙන් පසු සාරිපුත්ත හිමියෝ සිය මෑණියන්ට බුදුරදුන් යනු කවරෙක් ද යන්න පහදා දුන්නෝ ය.

බුදුරදුන් උපන් කෙනෙකි; මහාබිනික්මන් කළ කෙනෙකි; බුදු වූ කෙනෙකි; දම්සක් පැවත්වූ කෙනෙකි. දස දහසක් ලෝක ධාතුහු කම්පිත වූහ. ශීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන්, විමුක්ති ඥාන දර්ශනයෙන්, කරුණාවෙන් අසමසම ධර්ම කතාවෙන් බුදුරදුන්ට සමාන කෙනෙක් නැත යනුවෙන් සිය මෑණියන්ට බුදුරදුන් කෙරෙහි පවත්නා ගුණ සමුදාය දෙසීමෙන් අනතුරුව පැහැදී අවසානයේ සෝවාන් ඵලයට වූවා ය.

මෙතෙක් මිසදිටු දහම්වල එල්බගෙන අඳුරේ සැරිසැරූ සාරි බැමිණිය යහමඟට ගැනීම මුඛ්‍යාර්ථ කොටගත් සාරිපුත්ත හිමියන්ගේ පරමාර්ථය එලෙසම ඉටු වීම ද ඉල් පුන් පොහෝදාක සිදු වූ අතිවිශේෂ ඍද්ධියකි.

අනුබුදු මිහිඳු මාහිමියන් ඇතුළු ධර්මදූත පිරිසට ලංකාවේ ප්‍රථම සිංහල භික්ෂුව වූ අරිට්ඨ මහරහතන් වහන්සේ ඇතුළු සිංහල රහතන් වහන්සේ පණස් හතර නමක් තවත් භික්ෂු සංඝයාට මිහින්තලාවේ අටසැට ලෙන්වල වස් එළඹීමට ආරාධනා ලැබීමෙන් අනතුරුව ථූපාරාම වැනි දාගැබ් ඉදී වී පූජා හා ධාතූන් නිදන් කරන ලද්දේත් ඉල් පුන් පොහෝ දා ය.

මිනිසා කෙරෙහි පවත්නා රළු කටුක ස්වරූපය පහ වීමට ධර්මය නියත වශයෙන් ම අවශ්‍ය වේ. ධර්මයේ ප්‍රභේද වේ. මිනිසා නොමඟ යවන ධර්මය හා යහමඟ යවන ධර්මය යනුවෙනි. බුදුරදුන් දේශනා කරන ලද්දේ මිනිසාට හිතකාමී, සුවකාමී, මෙලොව හා පරලොව යන දෙකටම අනුගත ධර්ම මාර්ගයකි. යහපත යන වදන අර්ථය කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතු ය. ඉල් පොහොයෙන් ප්‍රතිනිර්මාණය වන්නේ එය යි.

බුදුරදුන් දිනක් මහා සඟරුවන අමතා කීවේ, මගේ වදන් හැසිරවීමේ හා මා ගමන් කරන විලාසයේ කිසියම් වරදක් ඇති නම් එය පෙන්වා දෙන ලෙසයි. සියල්ල දත් බුදුවරයෙකු මෙසේ සිය අනුගාමිකයන්ට පවසන්නේ නම් පුහුදුන් අය ගැන කවර කතා ද? එවිට සඟරුවන කියා සිටියේ තථාගතයන් වහන්සේ කෙරෙහි කිසිදු අඩුපාඩුවක් නොමැති බවත්, අපට කතා විලාසය හා ගමන් මඟ ආදර්. ක් හා පරමාදර්ශී වන බවයි. බලන්න බුදුවරයෙකු කෙරෙහි පවත්නා නිහතමානී ගුණය.

අප සමාජයේ බොහෝ දෙනා කෙරෙහි නැත්තේත් මේ ගුණය යි. සියල්ල දත් බුදුවරයකු තමන්ගේ දුර්වලකම් ඇත් නම් පෙන්වා දෙන්න යනුවෙන් පවසතත්, අද සමාජයේ බොහෝ දෙනෙකු සිතා සිටින්නේ සියල්ල දත් අය ලෙස ය. දන්නේ නැති දෙයක් අසා දැනගන්නට වුවමනාවක් නොදක්වන්නේ එක් අතකින් ලජ්ජාවට හේතුවක් වන නිසා යයි ඔවුහු සිතති. බොහෝ අය අදහස් කරති. මෙයට අපි හීනමානය යැයි කියමු.

අප දන්නේ අංශුවක් පමණි. දන්නේ නැති දෙයක් අසා දැනගැනීම නිහතමානී ගුණයකි. මේ නිහතමානි ගුණය අපට බුදුරදුන් පෙන්වා දුන්නේ ඉල් පුන් පොහොය සමයේ ය. නිහතමානි ගුණයේ සංකේතයක් ලෙස ද මේ පොහොය හැඳින්විය හැකි ය.

## වැදගත් සිදුවීම්

1) මත්තට බුදු වන්නට සිටින මෛත්‍රී බෝධි සත්ත්වයන් වහන්සේ විවරණ ලැබීම.
2) ප්‍රථම ධර්මදූත පිරිස (ප්‍රථම රහත් සැටනම) ධර්මප්‍රචාරයට ගමන් ඇරඹීම.
3) තුන් බෑ ජටිලයන් දමනය කිරීම සඳහා බුදුරදුන් උරුවේල දනව්ව බලා වැඩම කිරීම.
4) පසුවස් පවාරණ කළ යුතු දිනය වීම.
5) චීවර මාසයේ අන්තිම පොහොය.
6) කඨිනාස්තරණ විනය කර්මය කළ හැකි අවසාන දිනය වීම.
7) අග්‍ර ශ්‍රාවක සාරිපුත්‍ර මාහිමියන්ගේ පරිනිර්වාණය සිදු වීම.

# ධර්මකාමී දිවිපෙවෙතකට මං හෙළි කරන

# උඳුවප් පුන් පොහොය

දොළොස් පොහොයාවලියේ අවසන් පොහොය ලෙස සැලකෙන්නේ උඳුවප් පොහොයයි. මෙය උඳු මාසය ලෙස ද හැඳින්වේ. උඳු වපුරා එල නෙළා ගන්නා මාසය වශයෙන් ද උඳුවප් මහ නම් කරනු ලැබේ. වසරක් පුරා දිගු ගමනක යෙදී ව්‍යවහාරික ඉදිරි වර්ෂය කෙසේ සකස් කරගන්නේ ද යන්න සම්බන්ධයෙන් කඩඉමක් වශයෙන් ද මෙය නම් කරනු ලැබේ. දැහැමි දිවි පෙවෙතකට පසුබිමක් සකසා සංසාරයෙන් එතෙරවීමට මාර්ගය කෙටි කරගැනීමට මෙය අතිශය අනුබලයක් කරගෙන ඇති ආකාරය ද තීරණය වේ.

සඟමිත් තෙරණියගේ ලංකාගමනය, ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කරවීම, ලක්දිව මෙහෙණි ශසන පිහිටුවීම, කාන්තා සමාජයේ විමුක්තිය උදා වීම, අනුරාධපුරයේ ප්‍රභාව ඇති වීම, සමාජයේ පෙර නොවූ විරූ ප්‍රබෝධයක් උදා වීම යන කරුණු උඳුවප් පොහොයේ සිදු වූ වැදගත්ම සිදුවීම් ය.

අසෝක අධිරාජ්‍යයාගේ දියණිය වූ සඟමිත් පුංචි අවධියේ පටන් සංවේදී ප්‍රියමනාප දැහැමි දිවිපෙවෙතක් සපුරාලීම මත කාගේත් ආකර්ෂණයට පාත්‍ර වූ උත්තමාවකි. විචාරකයන් අතර සඟමිත් අසෝක අධිරාජයාගේ සොහොයුරියක යැයි ද මිහිඳු මාහිමියන් සොහොයුරා යැයි ද මතයක් පවතී. ඒ මතය අප එතරම් සැලකිල්ලට බඳුන් කළ යුත්තක් නො වේ. මෙහිදී අපට වැදගත්වන්නේ පුද්ගල ස්වරූපය යි.

දැහැමි දිවියකට නැඹුරු වූ සඟමිත් වැඩිවියට පත් වීමත් සමඟ ම විවාහයට කාලය එළඹ ඇති හෙයින් එම තත්ත්වයට පත්

විය යුතු ය. මනා රූප සම්පත්තියත් ලලනා ලාලිත්‍යයත් කාන්තියත් සියලු දෙනාගේ ම සිත් ඇඳ බැඳගන්නා ස්වරූපයත් හේතුකොටගෙන වඩාත් ප්‍රහර්ෂවත් තලයකට සඟමිත් තෙරණිය පත් වූවා ය.

චරිතය ඉතා පවිත්‍ර ය; ආචාරශීලි ය; හැමවිට ම පරමාදර්ශී ය. මැනවින් අධ්‍යයනය කොට සියලු ශාස්ත්‍ර ඥාණයෙන් ද භාෂා ඥානයෙන් ද උපයුක්ත විය. ළමා වියෙන් තරුණ වියට පත් සඟමිත් විවාහ ජීවිතයට එළඹෙන කාලය උදා විය. විරාගී හැඟීම්වලින් යුක්තව සිටි හෙයින් විවාහ වීමට ඇයට කැමැත්තක් නො වී ය. එහෙත් මවුපියන්ගේ පරම යුතුකම වන්නේ සිය දියණිය කරකාර බන්දවා දීමට ය. ඒ අනුව අග්ගිබ්‍රහ්ම නම් කුමාරයකුට සඟමිත් කුමරිය සරණපාවා දුනි.

ඇය ඉතා ඥානාන්විත වූයෙන් විවාහය අසිරු නො වී ය. තම ස්වාමියාට කෙසේ සලකන්නේ ද යන්න ඇය මැනවින් දැන සිටියා ය. මේ දෙදෙනා අතර පැවැතුණු විශ්වාසය සෙස්සන්ට පරමාදර්ශී විය. බෞද්ධ සාහිත්‍යයේ අන්තර්ගත නකුල මාතා නකුල පිතා යන දෙදෙනාට සමාන වනසේ සංඝමිත්තා හා අග්ගිබ්‍රහ්ම ජීවිතය ගත කිරීම මත කාගේත් සිත් ඔවුන් දෙදෙනා කෙරෙහි ඇදී ගියේය.

ස්වාමියාගෙන් භාර්යාවටත්, භාර්යාවගෙන් ස්වාමියාටත් කෙසේ පැවැතිය යුතු ද යන නියතයේ මේ දෙදෙනා ම සිටියහ. ගෘහ ජීවිතය ඉතාමත් සාර්ථක තලයකට පැමිණීමෙන් අනතුරුව කුඩා කුමරකු ඇය වැදූවා ය. සුමන යනුවෙන් නම් තැබූ ඇයගේත් ස්වාමියාගේ බැම්ම තවදුරටත් තහවුරු වීමට මනා ලෙස කුමරුවා සමත් විය. මනා ලෙස ප්‍රිය වූ බැවින් මවුපියන් මෙන් මොහු ද කාගේත් සිත් ගත්තේ ය.

ඉතාම වාසනාවන්ත වූ මේ තිදෙනාට වැඩි කලක් ගිහි ජීවිතයේ ගත කරන්නට අවකාශ නොලැබුණි. සිත් නිතර ම යහපතට පරලොවට වැඩ කිරීමට යොමු වීම මත අග්ගිබ්‍රහ්ම කුමාරයාත් සසුන්ගත විය. සඟමිත් මෙහෙණි සස්නට ඇතුළු වූවා ය. සත් හැවිදිරි සුමන කුමාරයාත් පැවිදි විය.

තම සොහොයුරාත්, ස්වාමියාත්, පුතුත් සසුන්ගත වීම අනුව ඇය ද ශාසනයට යොමු විය. සඟමිත් මෙහෙණිය ලෙස ශාසන ඉතිහාසයේ සුවිශේෂිත තැනක් හිමි වන්නේ මෙතැන් සිට ය. ලක්දිව

කාන්තා සමාජයේ විශාල වශයෙන් පෙරළියක් ඇති වන්නේ ද සඟමිත් තෙරණිය නිසා ය. ලාංකික කාන්තාවට සිය ඥානය ප්‍රගුණ කරගැනීමටත්, ශාසනික වශයෙන් යම් යම් තීරණ ගැනීමටත් උචිත පරිසරයක්, භූමිකාවක් අවශ්‍ය විය. ඒ සඳහා අනුබලයක් වූයේ සඟමිත් තෙරණිය යි.

ජය ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාවක් ලක්දිවට වැඩමවීමත් එම ශාඛාව අනුරපුර මහමෙවුනාවේ රෝපණය කිරීමත් නිසා උඳුවප් මහ පොහොය ඉහළ තලයක පවතී.

අනුලා දේවිය ඇතුළු කාන්තා පක්ෂය සඟමිත් තෙරණිය කෙරෙහි පැහැදී එතුමිය යටතේ මෙහෙණ ශස්නට ඇතුළත් වීමට දැඩි අදිටනින් සිටි අවධියක ඇය ලක්දිවට පැමිණ ජය ශ්‍රී මහ බෝධියේ දකුණු ශාඛාව රෝපණය කොට බුදුරදුන් මෙහි වැඩසිටින තත්ත්වයක් උදා කළා ය. ශ්‍රී මහා බෝධිය මෙහි වැඩ සිටිනවාය යනු බුදුරදුන් වැඩ සිටිනවා සමාන ය. බුද්ධත්වය ලැබීමට පිට දුන් බෝධිය ලොවට මහත් අසිරියකි. එම අසිරිය අපට උදා කෙළේ සඟමිත් තෙරණිය යි; උඳුවප් පොහොය යි.

එදා දම් සෝ නිරිඳු රජමාලිගයෙහි මහා සංඝයා විෂයෙහි දන් පිරිනමා අවසානයේ මහා බෝධි ශාඛාව ලක්දිවට යැවිය යුතු යැ යි මොග්ගලීපුත්තතිස්ස මහ තෙරුන්ට දැන්වී ය. එම අවස්ථාවේදී බෝධි ශාඛාව ලක්දිවට යැවිය යුතු යැ යි බුදුරදුන් විසින් කරන ලද අධිෂ්ඨාන පස රජතුමාට දන්වන ලදි. එම අධිෂ්ඨාන පස මෙසේ ය;

1) ලක්දිවට රෝපණය කිරීම පිණිස බෝධිය ගැනීමට අශෝක චක්‍රවර්තීන් එළඹුණු කල්හි බෝධි ශාඛාව අයත්නයෙන් ම (කිසිවකුගේ උදවුවකින් තොරව) ගැලවී රන් කටාරමයෙහි පිහිටේවා!
2) බෝධි ශාඛාව පිහිටන කල්හි එය හිම වලා ගැබක් අතරට වැද සිටීවා.
3) සත් දිනකට පසුව නැවත රන් කටාරමෙහි පිහිටි කෙණෙහි පත්‍රයන්ගෙන් හා ඵලයන්ගෙන් සවණක් ඝන බුදුරැස් විහිදේවා!
4) දෙවනපෑතිස් නිරිඳුන් විසින් කරවන ලද ථූපාරාම චෛත්‍යයෙහි දකුණු අකු ධාතුව පිහිටන කල්හි යමාමහ ප්‍රාතිහාර්ය කෙරේවා!

5) ලක්දිව මාගේ ද්‍රෝණයක් පමණ ධාතූන් රුවන්මැලි සෑයෙහි පිහිටන කල්හි බුද්ධ වේශය ගෙන අහසට පැන නැගී යමා මහ පෙළහර කෙරේවා!

''මේ අධිෂ්ඨාන පස බුදුරදුන් පිරිනිවන් මංචකයේ වැඩ සිට ලක්දිවට යොමු කෙළේ ය.'' යනුවෙන් මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ පවසනවාත් සමග ම රජුට අසීමිත ප්‍රීතියක් ඇති විය. රජු පැළලුප් නුවර සිට බෝධීන් වහන්සේ දක්වා මාර්ගය සැරසවී ය. රන් කටාරමක් ඒ සඳහා පිළියෙල විය. රජු සිවුරඟ සේනාවක් සමගම ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත පැමිණියේ ය.

මෙසේ පැමිණි රජු සුදු තිරයකින් අවුරා ඇඳිලි බැඳගෙන බෝධීන් වහන්සේ දෙස බැලුවේ ය. දක්ෂිණ ශාඛාව සම්බන්ධ සතර රියන් පමණ පෙදෙස ඉතිරි කොට සියලු ශාඛා අතුරුදන් විය. මේ ආශ්චර්යවත් පෙළහර දුටු රජු අතිශය සතුටට, ආහ්ලාදයට, ආනන්දයට පත් ව දඹදිව රාජ්‍යයෙන් පුදමි යි අභිෂේක කෙළේ ය.

මෙසේ ආශ්චර්ය පාමින් ජය ශ්‍රී මහ බෝධියේ දක්ෂිණ ශාඛාව දොළොස් කුලයක් සමඟ සඟමිත් තෙරණිය සමඟ ලක්දිවට එවන ලදී. ජය ශ්‍රී මහා බෝධි රෝපණයෙන් පසු මෙරට සමාජ පෙරළියක් සිදු වූවා යයි කීවොත් එය එතරම් ම නිවැරැදි ය. බුදු පහස ලබන්නට තරම් හෙළ බොදුනුවෝ භාග්‍යවන්ත වූහ.

අදත් ශ්‍රී මහා බෝධියේ පහස ලැබීමෙන් අනතුරුව කොතරම් පහන් සංවේග දනවන්නේ ද? බෝධිය ස්පර්ශකොට නොව දැකීමෙන් කොතරම් චිත්ත ප්‍රීතියක් ලබන්නේ ද? මෙරට භික්ෂුණී ශාසනයක් බිහි වීමට සඟමිත් තෙරණිය හේතු සාධක වූයෙන්, සමාජයේ විසිරී පැතිරී සිටි කාන්තා පක්ෂය එක තැනකට රොක් කිරීමට අතිශයින් ම ඉවහල් විය. දිසාවල ලෙන් ඉදිවී භික්ෂුණීන් වහන්සේ එහි වැඩ සිටුවීමෙන් සමාජය යහමඟට යොමු කිරීමට මගපෑදුණි.

දොළොස් මසක් අප අවසන් කරන තැන ජීවිතය ද අවසන් කළ යුතු ය. මෙයින් අප තෝරා බේරාගත යුත්තේ කුමක් ද? මිනිසාට යන්නට හැකි අන්තයක් ඇත. එම අන්තය කුමක් ද? බුදුරදුහු මේ

අන්තය ද අපට පැහැදිලි කෙළෝ ය. ජීවිතයට වඩාත් දුක්දීම බුදුරදුන් හැඳින්වූයේ අත්තකිලමතානුයෝගය ලෙසට ය. එමෙන් ම ජීවිතයට සැපදීම යනු කාමසුඛල්ලිඛානු යෝගය යි. මේ අන්ත දෙක ම බැහැර කළ බුදුරදුහු මධ්‍යම ප්‍රතිපදාවක් (Middle Path) පෙන්වා දුන්නෝ ය. මේ අන්තය වෙනස් කිරීමට කිසිම ආගමික නායකයකුට නොහැකි විය.

නිරන්තරයෙන් ම අපගේ ජීවිතයේ පැවැත්ම වන්නේ යමක ඇල්ම උපදවා ඒ දෙස දැඩි ලෙස ඇදී යෑමයි. මේ ඇදී යාම වඩාත් බහුල වශයෙන් සිදු වන්නේ අනුවණකම මතය, නුවණැත්තා නිතර ම බලන්නේ ඇදී යෑමෙන් නැත් නම් ආශාවෙන් මිදීමයි. මේ මිදීමට ප්‍රඥාව අවශ්‍ය වේ. ප්‍රඥාව මෙහෙයවා සිය ගමන කෙටි කරගැනීමට සිතට ගත යුතු ය.

උඳුවප් පොහොය මෙයට මාර්ගය අපට පහදා දෙයි. ජීවිතයට විමුක්තිය සොයා යන ගමනේදී ඊට ආදේශ කළ යුත්තේ බුදු සමය යි. බුදුසමය අපට යථාර්ථය හෙළි කරයි; යථාවාදී තථාකාරී ස්වාභාවය පෙන්නුම් කරයි. ජීවිතයට අර්ථයක් සොයා යා යුතු ය. අර්ථයෙන් තොර ජීවිතයක් නොමැත. අනර්ථය ජීවිතයට විෂය නො වේ. අනර්ථය පසුපස හඹායන මිනිසාගේ ජීවිත ගමන දිගු ය. අර්ථය සොයා යන පුද්ගලයාගේ ගමන කෙටි ය.

සත්ත්වයා නිතර ම පරිභෝජනය කළ යුත්තේ හොඳට ය. නරක පරිභෝජනය කළ හොත් ජීවිතය නරක පැත්තට යොමු වීම ද ස්වාභාවික ය. ජීවිතය පිරිපුන් බවට පත් කරගත යුතු ය. සරුසාර ඵලබර ගසක් පොළොවට නැඹුරු වන්නේ යම් සේ ද ධර්මකාමී ජීවිතය ද එසේ ම ය. යථාර්ථවාදී ලෙස ධර්මයට නැඹුරු වූ ජීවිතය සංවේදී ය.

එම ජීවිතයෙන් කරුණාව-දයාව-ආදරය-ඉවසීම ආදි ගුණාංග මතු වේ. සැබෑ හා යථාර්ථවාදී ජීවිතය මෙහිදී වඩාත් වැදගත් වේ.

අපේ ජීවිතයෙන් අන් අයට ආදර්ශයක් ගන්නට ඇත් නම් එය ද ලොකු පුණ්‍යකර්මයකි. තනියම භුක්ති විඳින්නේ නැතිව බෙදා හදාගෙන කන්නට අප නැඹුරු විය යුතු ය. එවිට අන් අය සතුටට පත් වන්නේ යම් සේ ද, තමන්ටත් එසේ සතුටට පත් විය හැකි ය. දීමෙන් අසීමිත සතුටක් ලබාගත හැකි ය. තෘෂ්ණාව පහ කිරීමට ද

එය හේතු වේ. උඳුවප් පොහොයෙන් අපට උගන්වන්නේ මේ අනගි පාඩම යි.

---

**වැදගත් සිදුවීම්**

1) සඟමිත් තෙරණියගේ ලංකාගමනය.
2) ලක්දිව මෙහෙණි සස්න පිහිටුවීම.
3) කාන්තා සමාජයේ විමුක්තිය උදා වීම.
4) අනුරාධපුරයේ පුනරුදයක් ඇති වීම.

උපග්‍රන්ථය

# සම්බුදු තෙමඟුල පෑ නැණසල

අප තිලෝගුරු භාග්‍යවත් සම්මා සම්බුදුන් සෙසු ආගමික ශාස්තෘන් අබිබවා යන්නේ ලෝක ස්වභාවයට පිටු නොපා යථාර්ථවාදීව හේතුඵල දහමක් දේශනා කළ බැවිනි. එම අසිරිමත් ආශ්චර්ය, මනෝරම්‍ය, භාවාත්මක අතිසුන්දර දහම දෙසූ බුදුරදුන්ගේ උපත, බුදු වීම, හා පිරිනිවීම එක ම මසක - එනම් මැයි මස, එම මාසයේ එක ම දිනක, එක ම වේලාවක සිදු විය. මෙවන් සිදුවීමක් ලොව කිසිදු ශාස්තෘවරයෙකුට නොමැත. ඒ නිසායි සියලු ආගමික ශාස්තෘවරුන් අබිබවා බුදුරදුන් විරාජමාන වන්නේ.

බුදුවරයකු ලොව පහළ වීමට උචිත පරිසරයක් ද පහළ වේ. දඹදිව මධ්‍ය දේශයේ සාධුගණයාට නිකේතනයක් වූ කපිලවස්තු පුරයෙහි උභයකුල පරිශුද්ධ, ශුද්ධෝදන මහ රජුගේ අග මෙහෙසිය වූ මහාමායා දේවියගේ කුස පිළිසිඳගත් අප මහා බෝසතාණෝ ක්‍රිස්තු පූර්ව 563 වන වර්ෂයේ වෙසක් පුන් පොහෝදා ලුම්බිනි සල් උයනේදී උපත ලැබූහ.

## සත් පියුම් පිපීම

සිදුහත් කුමරු උපත ලත් මොහොතේ ම සත් පියුම් මත ඇවිද එයින් ම මහත් අසිරියක් පෑවේ ය. උපන් මොහොතේ ම බිළිඳෙක් ඇවිදින්නේ ද? එම අවස්ථාවේදී ම පද්ම හතක් පිපී ඒ මත ගමන් කරන්නේ ද? මෙය මහත් ප්‍රාතිහාර්යක් නො වේ ද? ඒ හේතුව නිසා ම උපන් මොහොතේ ම "මම ලොවට අග්‍රයෙමි, ජ්‍යෙෂ්ඨයෙමි, ශ්‍රේෂ්ඨයෙමි, මේ අන්තිම ජාතිය යි. මතු පුනර්භවයක් නැතැ" යි බුදු ව නිවන් පසක් කරන බව හඟවා පැවැත්වූ අභීත නාදයෙන්

දෙව් මිනිසුන් විස්මයට පැමිණවූ පාරමී ගුණ විභූතියෙන් හා මහා පුරුෂ ලක්ෂණයෙන් ද, සොභා සම්පන්න වූ ළදරු බුදුකුරු මහතාණෝ අසිතර්ෂි ආදි මහතීසත්වයන්ගෙන් අභිවාදන ලබමින් නම් විශ්වමිත්‍රාදි බ්‍රාහ්මණ ගුරුන්ගේ ඇසුරෙන් සිප්සතර ප්‍රගුණ කරගනිමින් සොළොස් හැවිරිදි වියට පැමිණියහ.

කෙමෙන් තරුණ වියට පත් වීමත් සමග ම දෙව්දහ නුවර සුප්‍රබුද්ධ රජුගේ දියණිය වූ 'බිම්බා' යන අපරනාමයෙන් උපයුක්ත යශෝධරා දේවිය අගබිසව කොටගෙන රම්‍ය, සුරම්‍ය, ශුභ නම් වූ මහා ප්‍රාසාද තුනක ජීවිතය ගෙනයන ලදි. පවුල් සංස්ථාව ඉතා ආශ්චර්යවත් ලෙස කිසිදු අඩුවක් පාඩුවක් නොමැතිව ඍතු තුනට ම සරිලන මහා මන්දිර තුනක වාසය කරද්දී එම ලෝකයේ පවත්නා කාමාදීනව දැක එහි කලකිරී ඇසළ පුන් පොහෝදා රාහුල පුතා මෙලොවට උපන් බව අසා පුත්‍ර ප්‍රේමයෙහි කිඳී නොගොස්, 'මෙ ද මහත් බන්ධනයෙක. වැඩී ගියොත් බාධාවෙක. පුතණුවන්ගේ හා දේවියගේ සුබ ජීවිතයට නොමඳ රාජ සම්පත් ඇත. නැති මෝක්ෂ සම්පත් ලබාගෙන වුත් දෙමැ' යි සිතමින් එදින ම රාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණය කළහ.

## මහාභිනිෂ්ක්‍රමණය

මෙතැන් පටන් මෝක්ෂ මාර්ගය සෙවීමේ කාර්යයේ නිරත වී ධර්මාණ්‍යාරණ්‍යාදි තපෝවනයන්හි විසූ භාර්ගවාදි තවුසන් වෙත එළඹ ඔවුන්ගේ ආගමික චර්යාවන් කෙරෙහි යොමුව තමන් අපේක්ෂා කරන සත්‍ය දහම එහි නොපවතින බැවින් රජගහනුවරට පැමිණ මෝක්ෂ මාර්ගය සොයමින් මගධයෙහි හැසුරුණේ ය.

එකල මගධයෙහි නානා ලබ්ධි, නානා දර්ශන උගන්වන බ්‍රහ්මණ - තාපස - පරිබ්‍රාජකයෝ බොහෝ සේ සිටියහ. එහෙත් එම දහමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බව දත් මහා බෝසතාණෝ මගධයෙහි පැවැති අශුද්ධ ධර්ම කෙරෙහි කලකිරීමෙන් අනතුරුව ආලාරකාලාම නම් වූ තවුසන් වෙත ගොස් ඔහුගේ විඥානය මෝක්ෂයට කිසිසේත් ම ඉවහල් නොවන්නේ යයි දත් හෙයින් එතැනින් ද නික්ම උද්දකරාම පුත්‍ර නම් වූ තවුසා වෙත පැමිණ ඔහුගේ විඥානගත දෘෂ්ටිය සසර කෙළවර කරන්නට

කිසි සේත් ම බලපාන්නේ නැතැ යි යන හැඟීම මත එයින් ද නික්ම ගයා පෙදෙසේ සේනානි නම් නියම්ගමට පිවිස 'දුකෙන් සැප ලබන අයට පිළිතුරු දෙමි' යන නියතයේ පිහිටා අත්තකිලමතානුයෝගය හෙවත් ශරීරයට දැඩි සේ දුක් දීම සිදු කෙළේ ය.

තම කුස පිට පොත්තට ඇලෙන තෙක් ම ශරීරයට දුක් දී නේරංජනා දනව්වේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට එයින් ද තමන් සොයන විමුක්ති මාර්ගය නොලැබී ගියේ ය.

## අන්ත දෙක බැහැර කිරීම

ශරීරයට අධික ලෙස දුක් දීම හෙවත් අන්තකිලමතානුයෝගයත් ශරීරයට අතිශය සැප දීම හෙවත් කාමසුඛල්ලිකානුයෝගයත් බැහැර කොට මේ දෙකට ම නැති මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කොට ධ්‍යානාභිඥානගත චිත්ත චෛතසික සංස්කාරයන් ප්‍රහීන කොට වෙසක් පුන් පොහෝදා බුද්ධත්වයට පත් වූ හ.

## බුද්ධත්වයට පත් වීම

තමන්ට බුදු වන්නට උදවු උපකාර කළ අයට කෘතවේදිත්වය පළ කිරීම් වස් සත් සතියක් පුරා ඒ කාරිය නිසි ලෙස බුදුරජාණෝ ඉටු කළහ. තමන්ට බුදු වන්ට උරදුන් බෝරුකට සතියක් පුරා ඇසිපිය නොහෙළා අනිමිස ලෝචන පූජාව කිරීම කොතරම් පරමාදර්ශී ක්‍රියාවක් ද?

මෙසේ සත් සතියක් ගෙවී යන විට අට වන සතියේ උදෑසන තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් දුන් මී පිඩු වළඳා ඔවුන් ද්වේවාචික සරණාගත උපාසකයන් බවට පත්කොට ඔවුන්ට කේශධාතු දී අජපාල නුගරුක වැඩ හිඳ පස්වග තවුසන්ට ප්‍රථම ධර්ම දේශනාව කිරීමට ඇසළ පුන් පොහෝදා බරණැස ඉසිපතනේ මිගදායට වැඩියහ.

මුළු බුදු සමය කැටි කොට දක්වන චාතුරාර්ය සත්‍ය ධර්මය හෙවත් දුක, දුක හට ගැනීම, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය, පස්වග තවුසන්ටත් අනෙක් සත්ත්ව ගණයාටත් බුදුරජාණෝ පහදා දුන්හ. ආර්ය අෂ්ටාංගික මාර්ගය ඇතුළු සසරින් එතෙර වීමට විෂය මූල වන ධර්මය සියලු සත්ත්වයාට මහා ප්‍රඥාවෙන් යුතුව

මහා කරුණාව පෙරදැරි කරගෙන පන්සාළිස් වසරක් පුරා ගම් නියම්ගම්, දනව් පසල්දනව් පුර විසල්පුර ආදි පෙදෙස්වලට දිවා රෑ නොතකා, අව්ව, වැස්ස ගැන නොසිතා, වේලාව, අවේලාව නොබලා කටයුතු කෙළේ දුක් ජාලයක වෙළී පැටලී සිටින සියලු සත්ත්වයා ඒ දුකෙන් ගොඩගැනීමට ය.

## සැට නමක් යොමු කිරීම

යස කුලපුත් ආදි පණස් දෙනා රහත්කොට සැට නමක් වූ අනුගාමිකයන් තම දහම ප්‍රචලිත කරන්නට 'චරථ භික්ඛවේ චාරිකං බහු ජන හිථාය බහු ජන සුඛාය...' ආදි වශයෙන් පවසා දෙනමක් එක මගෙහි නොගොස් එකිනෙකා වෙන් වෙන්ව ගොස් ධර්මය දේශනා කරන්නට කටයුතු කිරීම මත මිසදිටු ආකල්පවල රැඳී සිටි සමාජය එයින් බැහැරකොට සම්දු දුටු මාර්ගයට යොමු කරන්නට ගත් තැත අතිශ්‍රේෂ්ඨ ය.

බුද්ධත්වයට පත් වීමෙන් පසු ඉතා සුඛෝපභෝගි දිවි පෙවෙතක් ගත කෙළේ නැත. ගස් යට ගං තෙරවල කාගෙන් හෝ ලැබෙන යමක් අනුභව කරමින් පන්සාළිස් වසරක් පුරා මහා මෙහෙවරක් කෙළේ සසරින් සත්ත්වයා එතෙර කරන්නට ය.

බුදුරදුන්ගේ නික්ලේෂී අභ්‍යන්තරයෙන් නැගී එන කටහඬ ඉතා මිහිරි ය; වදන් පෙළ කාරුණික ය. පැය ගණන් නොව දවස් ගණනක් වුවත් අසා සිටින්නට තරම් ඒ ධර්මය රසවත් ය, අර්ථවත් ය, ප්‍රයෝජනවත් ය. එහි බැහැර කළ යුතු කිසිවක් නොමැත. හැම වදනකින් ම කියාපාන්නේ සාර වූ ධර්මය යි.

## ඇට්ටේරියා කොළ උපමාව

බුදුරදුන් දැන සිටි දේ බොහෝ ය. දේශනා කළ දේ අල්ප ය. දැන සිටි සියල්ල ම දේශනා කරන්නට ගියා නම් වසර හතළිස් පහක් ප්‍රමාණවත් නො වේ. එහෙත් ඒ සියල්ල ම උකහාගන්නට සත්ත්වයාට හැකි වේ ද යන්න ගැනත් ගැටලුවකි. ඒ හේතුව නිසයි අවශ්‍ය දේ පමණක් දේශනා කෙළේ.

බුදුරදුන් දිනක් ඇට්ටේරියා වනයක වැඩ සිටිද්දී බිම වැටී තිබුණු ඇට්ටේරියා කොළ අහුරක් අතට ගෙන "ආනන්දය, මා මෙතෙක් දෙසූ දහම මාගේ අතේ ඇති කොළ අහුර තරම් ස්වල්ප ය.

දෙසන්නට ඇති මෙතෙක් නොදෙසූ දහම් මේ මවනයේ ගස්වල ඇති කොළ තරම් බොහෝ ය'යි පැවැසීමෙන් අපට එය සිතාගත හැකි ය.

සිදුහත් තවුසා අප්‍රමාණ දුක්ඛාවලියක සිටියේ ය. ඒ බව ශාරිපුත්‍රය මෙසේ පවසයි.

"ශරිපුත්‍රය, මම පිඬු පිණිස එක ම ගෙයකට පමණක් ගියෙමි. පිඩෙකින් පමණක් යැපුණෙමි. පිඬු පිණිස ගෙවල් දෙකකට පමණක් ගියෙමි. පිඬු දෙකකින් පමණක් යැපුණෙමි. පිඬු පිණිස ගෙවල් හතකට ගියෙමි. පිඬු හතකින් පමණක් යැපුණෙමි. කුඩා බත් කැටයකින් දෙකකින් තුනකින් යැපුණෙමි. දවසකට වරක් දෙවරකට වරක් අට මසකට වරක් ආහාර ගතිමි. ඒ මම අමු පලා පමණක් ආහාර කොට ගතිමි. බඩගමු ඌරුහැල් කපාහළ සම්කසට, මැලියම්, මුරුවට, තණකොළ, ගොම, වනමුල් අනුභව කෙළෙමි."

## පවට පිළිකුල් කිරීම

"ශාරිපුත්‍රය, මම පවට කොතරම් පිළිකුල් කෙළෙම් දැයි කියතොත් කුඩා ප්‍රාණීහු නොමැරෙත්වායි ඉතා පරිස්සමින් එහා මෙහා ගමන් කෙළෙමි. දිය බින්දුවෙහි පවා කුඩා සතුන් ඇතැයි දයාව පෙන්වීමි.

"ශාරිපුත්‍රය, මම සොහොනෙහි මිනී ඇට කොට්ටය වෙනුවට හිස තබාගෙන සයනය කෙළෙමි. එකල මා වෙතට ගොපලු දරුවෝ පැමිණ කෙළ ගැසූහ. එහෙත් මම ඔවුන් කෙරෙහි පවිටු සිතක් පහළ නොකෙළෙමි.

"ශාරිපුත්‍රය, අල්ප ආහාරයෙන් ශුද්ධිය වෙතැයි විශ්වාස කළ තවුසන් අනුව ගිය මම ද මුං ඇටයකින් සහල් ඇටයෙන් යැපුණෙමි. ශාරිපුත්‍රය, එකල සහල් ඇටයක් හුඟක් ලොකුවට තිබෙන්නට ඇතැයි ඔබට සිතිය හැකි ය. ඇත්තෙන් ම නැහැ. එකල සහල් ඇටය ද මෙකල සහල් ඇටය හා සමාන ම ය; කිසිදු වෙනසක් නැත. මම මෙබඳු දුෂ්කර ක්‍රියාකොටත් මනුෂ්‍ය ධර්මයට වැඩි වූ ආර්යභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශන විශේෂයක් නොලැබුවෙමි." **(මජ්ඣිම නිකාය, මහා සිහනාද සූත්‍රය)**

බුදුරදුන් හැමදෙනාට ම ලෝකය හැර යන්නට කීවේ නැත; හැම දෙනාට ම පැවිදි වන්නට කීවේත් නැත; හැමට ම උපාසක උපාසිකාවන් වන්නට කීවේත් නැත; හැමට ම රහත් වන්නට කීවේත් නැත. උන් වහන්සේ කෙළේ පරම සත්‍යය සොයාගැනීම යි.

## උපමාවට කෘෂි කර්මාන්තය

බුදුන් වහන්සේ දහම් දෙසන විට පවා කෘෂි කර්මාන්තය උපමා කොට දෙසූහ.

"මහණෙනි, ගොවියා විසින් කළ යුතු පූර්ව කෘති තුනක් ඇත. එනම්, පළමු කොට කුඹුර සී සා සම කළ යුතු ය. දෙවනුව සුදුසු කලට වී වැපිරිය යුතු ය. තුන් වනුවට වී වැපිරීමෙන් පසු සුදුසු කලට ජලය දිය යුතු ය. මේ ගොවියා විසින් කළ යුතු පූර්වකෘති තුන යි." **(අංගුත්තර නිකාය, තික නිපාත)**

## මනුෂ්‍ය ආත්මය

දිනක් බුදුන් වහන්සේ ස්වකීය අතේ මාපට ඇඟිල්ලේ නියපිටට පස් ටිකක් ගෙන භික්ෂූන් අමතා "මහණෙනි, මාගේ මේ අතේ නියපිට තිබෙන පස් ද වැඩි, මේ මහ පොළොවේ තිබෙන පස් ද වැඩි?" යි ඇසූහ. "ස්වාමීනි, නිය පිට තිබෙන පස් ඉතා ම ස්වල්පයකි. මහ පොළොවේ පස් ඉතා ම වැඩි ය, අප්‍රමාණ" යි භික්ෂූහු කීහ. "එසේ නම් මහණෙනි, සත්ත්වයන් අතර මිනිසුන් ව උපන්නෝ මාගේ මේ නියපිට තිබෙන පස්ටික තරම් ඉතා ම ස්වල්ප දෙනෙකි. මනුෂ්‍ය ආත්ම භාවය නොලැබ අනිත් සතුන් ව උපන්නෝ මහ පොළොවේ පස් තරම් ඉතා ම වැඩි ය" යි වදාළහ. **(සංයුක්ත නිකාය, ඕපම්ම සංයුක්ත, නඛසිඛා සූත්ත)**

දිනක් බුදුරදුන් රාහුල තෙරුන් වැඩ සිටි සේනාසනයට වැඩි විට රාහුල තෙරණුවෝ බුදුරදුන් ගෞරවයෙන් පිළිගෙන වැඩ හිඳීමට අසුන් පනවා පා ධෝවනය පිණිස දිය ද ගෙනවුත් තැබූහ. බුදුහු කුඩා බඳුනකින් ජලය ටික ටික ගෙන දෙපා මතට වක්කරමින් පා ධෝවනය කොට කුඩා බඳුන යටිකුරු කොට තබා රාහුල තෙරුන් අමතා "දැන් මේ කුඩා බඳුනෙහි ජලය ටිකක්වත් තිබේ? දැ" යි ඇසූහ. "යටිකුරු කොට තබන ලද බැවින් එහි ජලය ස්වල්පමාත්‍රයක් වත් නැතැ" යි රාහුල හිමි කී ය. එවිට බුදුහු රාහුල අමතා "රාහුලය,

යම් සේ යටිකුරු කොට තැබූ බඳුනෙහි ජලය ස්වල්පයක්වත් නොරඳා ද, එසේ ම බොරු කියන තැනැත්තා කෙරෙහි ගුණ ධර්ම ස්වල්පයක්වත් රඳා නොපවතී" යයි පැවැසූහ.

## ප්‍රාතිහාර්යයට නිදසුනක්

දිනක් බුදුරජාණෝ ශ්‍රාවකයන් කිහිප දෙනෙක් සමග ගඟක තොටුපොළක් අසල සිටියහ. තොටුපොළේ තොටියා මගියකු එගොඩ කොට ඔරුව පැදගෙන එමින් සිටියේ ය. මේ අතර හිස රැවුල් දිගට වැඩුණු වැහැරී ගිය සිරුර ඇති තවුසෙක් එතනට අවුත් බුදුරදුන් දැක සරදම් සිනහවකින් හා බැල්මකින් යුතුව ඉදිරිපිට ඇති ගඟේ දියමතුපිට පා ගමනින් එගොඩ ගියේ ය.

ඔහු කළ ඒ ප්‍රාතිහාර්යය හෙවත් හාස්කම දුටු එක් ශ්‍රාවකයෙක් බුදුරදුන්ට මෙසේ කීවේ යඃ "අනේ බුදු හාමුදුරුවනේ, අර නාකි තවුසා දිය මතුපිටින් ගිය හැටියට ඔබ වහන්සේත් වඩිනවා දකින්නට හරි ආසයි." බුදුහු මඳ සිනහවක් පහළ කොට "ඇවැත්නි, ඒක මොකක් ද! ඒකේ කිසි ම වටිනාකමක් නැහැ. හොඳයි, එහි ඇති වටිනාකම තව මොහොතකින් මම පෙන්වන්නම්. අර තොටියා මෙගොඩට ඔරුව පැදගෙන එනතුරු ඉන්න" යි කීහ. මොගොඩට ආ තොටියා බුදුරදුන් දැක උන් වහන්සේ ළඟට අවුත් වැන්දේ ය. එවිට බුදුහු "ඔබ දැන් මිනිහෙක් එගොඩ කළා. ඔහු ඔබට කීයක් ගෙවුව ද? "ස්වාමිනී, අඩමස්සක්" (වටිනාකමින් ඉතා ම අඩු කාසියක්). බුදුහු ශ්‍රාවකයා දෙසට හැරී "අන්න බලන්න, ඒ තවුසාගේ හාස්කමේ වටිනාකම අඩමස්ස යි. එහෙම වුණත් ඒ යෝගී බලය ලබාගන්නට ඔහු බොහෝ කාලයක් ශරීරයට දුක් දෙන්නට ඇති. ඉතින් අඩමස්සකින් කළ හැකි වැඩකට ඊට වඩා මිනිසාගේ යහපත් සඳහා යොදවන්න තිබෙන මාගේ මේ වටිනා කාලය අපතේ යවන්නේ මොනවට? දැ" යි ඇසූහ.

බොහෝ කාලයක් සත වෙත පෑ මහා කරුණාව හේතුකොට බුදුරදුහු වසර අසූවක් ජීවත් වී අවසානයේ බේලුව ගමෙහි වස් එළඹියෝ ය. එහිදී ලෝහිතපක්කන්දිකා රෝගය වැලඳීමෙන් හටගත් මහත් වූ වේදනාව දසමසකට නොනගින ලෙස සමාපත්ති බලයෙන් මැඩගෙන දසමසකින් පිරිනිවීමට ඉටාගත්හ.

"මම දැන් මහල්ලෙක්මි. මට ජීවත් වීමට ඇත්තේ තව ස්වල්ප වේලාවකි. මම නුඹලා අතහැර යන්නෙමි. මා විසින් නුඹලාට කළ යුතු උපකාරය, පිහිට කරන ලද්දේ ය.

"ආනන්දය, මම දැන් ජරාවට, වැඩි වයසට, මහලු බවට, වයස්ගත බවට පත් වීමි, මාගේ වයස අසූවකි. දිරූ රියක් රෝද බැඳීම් ආදි ප්‍රතිසංස්කරණයෙන් අල්ලා සිටිනවා වාගේ මාගේ කය ද අර්හත් බලවේගයෙන් බඳනා ලදුව අල්ලා සිටී." (මහා පරිනිබ්බාන සූත්‍රය)

## පිරිනිවන් මංචකය

බුදුරදුන් පිරිනිවන් මංචකයෙහි වැඩ හිඳ භික්ෂූන් අමතා **"මහණෙනි, මේ සිටින එක භික්ෂුවකට හරි මා ගැන ධර්මය ගැන සංඝයා ගැන, මාර්ග ගැන, ප්‍රතිපදා ගැන, මොන විදියේ හෝ සැකයක් තිබේ නම් දැන් මගෙන් අහන්න. අපේ ශාස්තෘවරයා ජීවත්ව සිටියදී මේ ප්‍රශ්න අසන්නට බැරි වුණා ය, මේ සැකය අත්හැර යන්නට බැරි වුණා ය කියා පසුව කනගාටුවන්න එපා. ඒ නිසා ම ඇසිය යුතු යමක් ඇත් නම් දැන්ම මගෙන් අසා දැනගන්න. මට ඇති ගෞරවය නිසා යමකු මගෙන් ප්‍රශ්න අසන්නට අකැමැති නම්, යහළුවකු ලවා හරි අස්වාගන්න"** යයි තුන් වරක් ම භික්ෂූන්ට කියා සිටියහ. එහෙත් භික්ෂූහු තුෂ්ණීම්භූත ව හුන්හ.

## බුද්ධානුභාවය

භෝග නගරයෙන් පාවා නුවරට වැඩි භාග්‍යවතුන් වහන්සේ චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ අඹ උයනෙහි වැඩහුන්හ. එහිදී වැලඳුණු රෝගය උත්සන්න වීම හේතු කොට ගෙන කුසිනාරා නුවර බලා වැඩියහ. ඒ යන අතරතුරදී බුදුරදුහු එක් රුක් මුලක වැඩහිඳ පිපාසා ඇති බව ආනන්ද තෙරුන්ට දැන්වූහ; පැන් සොයාගෙන එන්නට පැවසූහ. එහි කුඩා ඔයක තිබූ ජලය කැලැඹී මඩ සහිත වූ බැවින් "නුදුරෙහි වූ කකුත්ථා නදියෙහි ජලය පිරිසුදු ය. එහි වැඩිය හොත් පැන් පිය හැකි ය" යි ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පැවැසූහ. එහෙත් තෙවරක් ම බුදුරදුහු පැන් ගෙන එන ලෙස ආනන්ද තෙරුන්ට දැන්වූහ. ඒ අවස්ථාවේදී පාත්‍රය ගෙන ඒ කුඩා

ඔයට ගිය විට ජලය ඉතා පිරිසුදුව තිබෙන බව දැක බුද්ධානුභාවය ගැන පුදුම වී එයින් පාත්‍රය පුරා පැන් ගෙන බුදුරදුන්ට එය පවසා පිළිගන්වන ලදී.

ඉන් අනතුරුව පැමිණි පුක්කුස මල්ල පුත්‍රයාට දහම් දෙසා, ඔහු විසින් පිදූ සිනිඳු සළු දෙක පිළිගෙන කකුත්ථා නදිය වෙත පැමිණ ඇඟ සෝදා ඒ සමීපයෙහි වූ අඹ වනයෙහි මඳක් සැතපුණු සේක. එහිදී ආනන්ද තෙරුන් අමතා චුන්ද කර්මාර පුත්‍රයා දුන් අන්තිම දානය බුදු වන දා සුජාතාව දුන් දානයට සමාන අනුහස් ඇතැ යි පැවැසූහ. මේ දෙදෙනාගේ දානය කෙරෙහි සෙස්සන්ට සැක හැරීම අරබයා මල්ල රජ දරුවන්ගේ කුසිනාරා නුවර හිරණ්‍යවතී නදියෙහි පාරිම තීරයෙහි වූ උපවත්තන නම් සල් වනයට වැඩියහ. එහි උතුරු දෙසට ඉස ලා යුග්ම ශාලාන්තරයෙහි පනවන ලද පරිනිර්වාණ මංචකයෙහි හොත් බුදුරදුහු "අපගේ ශාස්තෲන් වහන්සේ අද පිරිනිවන් පානා සේකැ" යි එහි රැස් ව වැලපෙන දෙව් මිනිසුන් සහිත ශ්‍රාවකයන්ට ධර්මය දෙසමින් තමන් වෙත පැමිණි සුභද්‍ර නම් පරිබ්‍රාජකයාට දහම් දෙසා පැවිද්ද දෙවා වදාළහ. ඔහු රහත් බවට පත් විය. බුදුරදුන්ගේ අන්තිම ශ්‍රාවකයා වූයේ ද සුභද්‍ර ය.

**"මහණෙනි, සියලු සංස්කාරයෝ නැසෙන ස්වභාවය ඇත්තාහ. අප්‍රමාදයෙන් යෙදී තොපගේ කටයුතු සම්පාදන කරගනිවු"** යන අවසන් බුද්ධ වචනය වදාරා, වෙසක් පුන් පොහෝදා අලුයම නිරුපධිශේෂ නිර්වාණයෙන් පිරිනිවි සේක.

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡文：月圓日之重要佛典故事》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

3,000 copies; April 2013

SR059 - 11183